## මේ ලොව පිරිසිදුම තාක්‍ෂණයයි

තාක්ෂණයෙන් දියුණුවට පත්වූ ලෝකයා "තාක්ෂණය නිසා ලෝකය විශ්ව ගම්මානයක්වී, ලෝකයේ පාලනය මිනිසා විසින් සිදුකරනවා" යන විශ්වාසයට පැමිණ ඇත. මේ මායාව තුළ ලෝකයා මොනතරම් මුලාවට පත්වී ඇතිදැයි යන්න ගැන ඔබට අවබෝධයක් ලබා ගත හැකේක් ධර්මය අවබෝධ කරගැනීමෙන්මය. ලෝකයා සතුටුවන, ලෝකයා ජීවත්වන, ලෝකයා පාලනය කරන ඊනියා තාක්‍ෂණය, ක්‍රියාත්මකවන්නේ බලශක්තිය මඟිනි. බලශක්තිය හිඟවුණු දිනයක, බලශක්තිය නැතිවුණු දිනයක තාක්‍ෂණයේ පිහිටෙන් ජීවත්වන ලෝකයා පත්වන්නේ මහා අර්බුදයකටය. තාක්‍ෂණය යනු අවිද්‍යාවයි. තාක්‍ෂණය යනු අස්වාභාවිකත්වයයි. එවන්වූ තාක්‍ෂණයෙන් පරිපූර්ණවන ලෝකය, ආධ්‍යාත්මික වශයෙන් පිරිහීම ලෝක ස්වාභාවයයි. තාක්‍ෂණයේ දියුණුව යනු අවිද්‍යාවේ දියුණුවයි. වර්තමානයේ ලෝකය දෙස බැලීමේදී අපි දකින්නේ අවිද්‍යාවෙන් ඉතිරියන තාක්‍ෂණයෙන් දියුණු ලෝකයකි. ලෝකයේ ගුණාත්මක බව, දියුණුව මනින මිනුම් දණ්ඩ තාක්‍ෂණයයි. බලශක්තිය නැතිවුණු දවසක ඇනහිටින තාක්‍ෂණයක්, ස්වාභාවික කාලගුණික දේශගුණික තත්ත්වයකදී ඇනහිටින තාක්‍ෂණයක්, දේවත්වයෙන් සලකන ඊනියා දියුණුවකින් මුලාවූ ලෝකයාට, ලොව්තුරු බුදුරජාණන් වහන්සේ මීට වසර දෙදහස් පන්සියයකට පෙර දේශනාකොට වදාළ ධර්මය විසින් අන්ධභාවයේ වෙලීසිටින ඔවුන්ගේ ළදරු බව හෙළිකරවනු ලබයි. ලෝකය තාක්‍ෂණයෙන් පිරියාම යනු සතර අපායද පිරියාමයි. තාක්‍ෂණ අවිද්‍යාවෙන් මුලාවන සත්වයා ගාල් කරන වෙබ් අඩවිය සතර අපායයි.

ලෝකයේ සැබෑ තාක්ෂණය දකින්නනම්, ස්පර්ශ කරන්නනම් ඔබ දැකිය යුත්තේ ලොව්තුරා ධර්මයයි. එය බලශක්තිය නැතිවුණ දිනයක අතරමංවන, අක්‍රියවන තාක්ෂණයක් නොවේ. පොඩ්ඩ වැරදුණු විට මහා විනාශයන් වන තාක්‍ෂණයක් නොවේ. අතුරු ආබාධ ඇතිවන තාක්‍ෂණයක් නොවේ. එය ඉතාම පිරිසිදු තාක්‍ෂණයයි.

ලෝකයේ තාක්‍ෂණයෙන් දියුණුම ආයතනය මොකද්ද කියා ඇසුවොත් ඔබ කියාවී ඇමරිකාවේ නාසා ආයතනය කියලා. නමුත් ඔබ වැරදියි. ලෝකයේ අවිද්‍යාවෙන් තොර, ස්වාභාවිකත්වයෙන් පිරිපුන්, දියුණුම තාක්‍ෂණය තිබෙන්නේ නිවන් මඟ වඩන භික්‍ෂුව තුළය. අරිහත් උතුමන් තුළය. එම භික්‍ෂුව එම තාක්‍ෂණයේ උපරිම ඵලය, උපරිම සීමාව දකින්නේ නිවන් අවසාන මෙහෙයුමේදීය. ඒ තාක්‍ෂණ පාරාදීසයකි. සැබෑම විශ්ව ගම්මානය ඔබ දකින්නේ මෙහිදීය. මෙම තාක්‍ෂණය බලශක්තියෙන් ක්‍රියාත්මක වන "රූකඩ තාක්‍ෂණයක්" නොවේ. එය ක්‍රියාත්මකවන්නේ ඔබගේ නිර්වාණ ප්‍රඥාව මඟිනි. මෙහිදී ඔබ දකින ලෝකය ඇමරිකාවේ නාසා ආයතනයට කල්ප ගණනාවක් සිය තාක්‍ෂණය දියුණු කරමින් ගියද දැකිය නොහැකිය. ඔවුන්ගේ ලෝකය ප්‍රාථමික ළදරු පන්තියකි. ඔබ නොදැනුවත්කම නිසා එහි සිරකරුවන්ව සිටියි.

නිවන් මඟ වඩන භික්‍ෂුව අවසන් නිවීමේ මෙහෙයුමේදී සඳ, අඟහරු හෝ වෙනත් ග්‍රහලෝක නොව, දිව්‍යලෝකයද, බ්‍රහ්ම ලෝකයද ඇතුළුව මුළු තුන් ලෝකයම දකිමින් අවබෝධය ලබයි. මේවාට බලශක්තිය අවශ්‍ය නොවේ. නිවන් මඟ වඩනා භික්‍ෂුවට තම සමාධිය උපරිම මට්ටමකදී කිසිදු බලශක්තියකින් තොරව මහා ඝණ අන්ධකාර රාත්‍රියකදී තම කුටිය ආලෝකමත්කර දැකිය හැකිය. නිවන් මඟ අවසාන මෙහෙයුමේදී ඔබට ඔබගේම ප්‍රඥාව විසින්, ඔබ පැමිණි සංසාර ගමනේ ඈත දුරක් දක්වා පෙන්වනු ඇත. මෙය හරියටම රූපවාහිනිය ඉදිරිපිට රූප

දකිනවා සේය. එකක් පසුපස එකක් පැමිණේ. ඔබට ඇත්තේ දකින රූප ඔසේස් සංසාරයේ භය දැකීම පමණකි. සංසාරයේ ස්වභාවය දැකීම පමණකි. එතැනදී දිව්‍ය ලෝකවල ඉපිද ඔබ විඳින ලද සැප සම්පත් ඔබ දකිනු ඇත. ප්‍රේත ලෝකවල ඉපිද සෙම් සොටු රස කර කර කමින් ගතකළ ස්වභාවයන් ඔබ දකිනු ඇත. මනුෂ්‍ය ලෝකයේ ඉපිද ඔබ විඳි කාම සම්පත්ද, දුක් වේදනාවන්ද ඔබ දකිනු ඇත. ඔබ යුද්ධයෙන්, සතුරන්ගෙන් මැරුම්කනවා, වේදනා විඳිනවා, අබ්බගාතයන් වනවා, අන්ධයෙක් බිහිරි පුද්ගලයෙක් මෙන්ම අංගවිකලව ගතකළ ජීවිත පෙනෙනු ඇත. තිරිසන් ලෝකවල ඉපිද හරකුන්, ඌරන්, කු=කුළන්, එළුවන්, මත්‍යසයින් ලෙස අනුන්ගේ අහරකට ඔබව මරාගෙන කනවා ඔබ දකිනු ඇත. මරණ වේදනාවෙන් ඔබ ළතෝනි දෙනවා ඔබට පෙනෙනු ඇත. මෙලෙස සංසාරයේ භය, සංසාරයේ දුර, සංසාරයේ ගැඹුර සිනමාපටයක් ඔසේස් මෙන් ඔබට දර්ශනය වනු ඇත.

මේවා ඔබට පහළවන ඥනයන්ය. ඔබට මේ ඥනයන් පහළවන්නේ, අවබෝධවන්නේ ජීවිතයේ එක් අවස්ථාවක පමණකි. ඉන් පසුව ඔබට එම ඥනය ආවර්ජනය කළ හැක. එනම් නැවත නැවත මෙනෙහි කළ හැක. මන්ද ඔබ එම සසර ස්වභාවය අවබෝධකර ඇති නිසාය. බලන්න, ලොව්තුරා බුදු සම්දුන් දේශනා කළ තාක්ෂණය. එකම එක බලශක්තියක්වත් නොමැතිව, එකම එක බොත්තමක්වත් තද නොකොට, කැමරාශිල්පීන් ශබ්දාගාර නොමැතිව, කල්ප ගණනක් ඈත සසර ඔබට දකින්න පුළුවන්. ඒත් බලන්න අපි මොනතරම් දුර්වලද කියලා. මෙවැනි උතුම් ධර්මයක් තියාගෙන අපි ධර්මය ඉගෙනගන්න වෙබ් අඩවියේ පිටු පෙරළනවා. ධර්මය සුරකින්න තාක්ෂණයේ පිහිට සොයනවා. ලොකුම අවාසනාව, ධර්මය පිළිගන්න තාක්ෂණය සමඟ ගලපා එමගින් ධර්මය සනාථ කිරීමට යැමයි. අවිද්‍යාවක මහත......

නවීන තාක්ෂණය මිනිසාගේ ආයුකාලය දීර්ඝකරගැනීමට, සෞඛ්‍ය තත්ත්වය නැංවීමට, අධ්‍යපනය ගුණාත්මකභාවයට පත්කිරීමට උපකාරවී ඇති බව ඔබට සිතෙන්න පුළුවන්. මෙම භික්ෂුවද එය අනුමත කරනවා. එහෙත් ඔබ තාක්ෂණික ලෝකයේ වැඩිපුර පැයක් ජීවත්වෙනවා කියන්නේ, වැඩිපුර පැයක් දුක් විඳිනවා කියන එකයි. ඔබ වැඩිදුර යමක් ඉගෙනගන්නවා කියන්නේ, වැඩිපුර අවිද්‍යාව ඉගෙනගන්නවා කියන එකයි. ඔබ මොන ආගමකට අයත්වුවද හිතට එකඟව දකින්න. ඔබව ලෙඩකරන රෝග කාරකයත්, ඔබේ ලෙඩේ සුවකරන ඖෂධයත, ඔබව මරාදමන මරුවාත් යන තුන්දෙනාම නවීන තාක්ෂණයයි. ඔබ සැබෑ තාක්ෂණය හඳුනාගෙන රෝගයත්, රෝගකාරකයත්, මරුවාත් යන තිදෙනාම පරාජයකර ලොව්තුරා තාක්ෂණයේ සැබෑ හිමිකරුවෙක් වන්න. බලශක්තියෙන් තොරව ලෝකය දිනන්න. දකින්න.

ලෝකය තාක්ෂණික අතින් දියුණුවෙන්න දියුණුවෙන්න ලෝකය ආධ්‍යාත්මික අතින් පිරිහෙනවා. ආධ්‍යාත්මික අතින් පිරිහෙන ලෝකය විසින් ලොව ස්වභාවය, ස්වභාවධර්මය තමන් යටතට, තමන්ගේ පාලනය යටතට ගන්න හදනවා. මේ තරගයෙන් කවදාහරි දවසක ලෝකයා අන්ත පරාජයකට පත්වෙනවා. එම පරාජය ලෝකයා ලබන්නේ මහා විනාශයකුත් සමඟමයි. එම මහා විනාශය වනතෙක් නිරතුරුවම අතුරු විනාශයන් ලෝකයේ සිදුවනවා. ලෝකයේ ස්වභාවය වෙනස් කළහැකි ජගතෙක් මෙතෙක් තුන්ලෝකයේම පහළවී නැහැ. අනාගතයේදීත් එය එසේමයි. අවිද්‍යාවෙන් පෙළෙන සත්වයා සිතනවා ලෝකයේ ස්වභාවය තමන්ට වෙනස් කළ හැකිය, පාලනය කළ හැකිය කියලා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලාටවත් බැහැ ලෝකයේ ස්වභාවය වෙනස්කරන්න. උන්වහන්සේලාට පුළුවන් ලෝකයේ ස්වභාවය අවබෝධයෙන් හඳුනාගෙන ලෝකයෙන් එතෙරවන්න, පාලනය නොකළහැකි ලෝකයේ ස්වභාවය පාලනය

කළ හැකි තම සිතෙන් අවබෝධ කරගන්නයි. කුමක්ද උන්වහන්සේලා අවබෝධ කරගත්තේ ?

ආයාසයක් ගෙන ලෝකයේ වෙනස්කළ යුතු කිසිම දෙයක් නොමැති බවයි. මන්ද නිරන්තරයෙන්ම, ආයාසයකින් තොරවම ලෝකය වෙනස්වන හෙයිනි. මහපොළොවද, අවකාශයද, අභ්‍යාවකාශයද ඔබට ජයගතහැක්කේ ඒවා වෙනස්කිරීමෙන් නොව, නිරතුරුවම ඒවා වෙනස්වන බව අවබෝධ කරගැනීමෙන්ය. ලෝකයේ ස්වභාවය වෙනස්කිරීමට යන්නාට හමුවනුයේ අවිද්‍යාවය. ලෝකය නිරතුරුවම වෙනස්වන ස්වභාවයෙන් යුක්තබව අවබෝධයෙන් දකින්නාට හමුවනුයේ විද්‍යාවය.

ලෝකයේ සැබෑම විද්‍යාඥයා ලොව්තුරා බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේගේ සැබෑ ශ්‍රාවක පුතුනුවන්ය. උන්වහන්සේලා මොනතරම් තාක්‍ෂණයෙන් දියුණුද කියනවානම්, උන්වහන්සේලාට ඇස් පියාගත් සැනින් මුළු ලෝකයම නිරුද්ධකොට දැකිය හැකිය. විශ්වය යනු මහා වේගයකට හසුවුණ හිස් අවකාශයක් පමණක් බව උන්වහන්සේලා දනියි. මෙම වේගය මොනතරම් ප්‍රවේගකාරීද කියනවානම්, එම වේගය තුළ දකින්නේ හිස්බව පමණක්මය. ඒ හිස්බව තුළ අයිතිකරගැනීමට, වෙනස්කිරීමට, දියුණුකිරීමට, සංවර්ධයන කිරීමට, අලුතින් සොයාගැනීමට කිසිවක්ම නැත. තාක්‍ෂණයෙන් ලෝකය ජයගන්නට වෙරදරන ලෝකයාද, එම වේගයේ රූකඩ පමණක්මය. ලොව ප්‍රවේගකාරීම වේගය රූපය අනිත්‍යභාවයට පත්වන වේගයයි. එය අවිද්‍යාව සොයා යන විද්‍යාඥයින්ට දැකිය නොහැක්කකි. එහි දැකිය හැකේක් විද්‍යාව සොයාගිය බුදු පුතුන්ට පමණක්මය. විද්‍යාඥයන්ද බුදු පුතකු වීමට දක්‍ෂ වුවහොත් ඔහුටද මේ සැබෑ විද්‍යාවේ හිමිකරුවෙක් විය හැකිය. මෙය කාගේවත් බූදලයක් නොවේ. මේ ලෝකයේ ස්වභාවයයි. ඔබටද මටද එහි හිමිකරුවන් විය හැකිය. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන්, මහා කරුණාවෙන් මේ මහ හෙළිකළ ශාස්තෘන් වහන්සේය. තුන් සිවරත්, පාත්‍රයත් දරමින්, කැලයේ හුදෙකලා කුටියක, ආරණ්‍යයක වැඩසිටින බුදුපුතුන් ලෝකය විනිවිද දකින, ලෝකය කම්පාකරවන, ලෝකයට නොගැටෙන ලෝකය ඉක්මවාගිය සැබෑම විද්‍යාඥයන්ය. බලශක්තියෙන් තොරව ලෝකය දකින උතුමන්ය. උන්වහන්සේලා සතියෙන් සිහියෙන් යුතුව ස්වභාවධර්මය දෙස ප්‍රඥාවේ ඇසින් බලමින් ධර්ම විනය දෙක ආරක්‍ෂා කරගනිමින් අවබෝධය ලබන උතුමන්ය. මේවා හේතුඵල ධර්මයන්ය. සතිය සිහිය හේතුවෙන් විනය නැමැති ඵලයද, ස්වභාවධර්මයේ යථාස්වභාවය මෙන්ම එහි අනිත්‍යබවද දැකීමෙන් ධර්මය නැමැති ඵලයද ඔබට අවබෝධවනු ඇත. සතිය සිහිය නැතිවීමෙන් අවිචාරයද, ස්වභාවධර්මය නිත්‍යභාවයෙන් ගතහොත් අධර්මයද යන ඵලයන් ඔබට ලැබෙනු ඇත. ඔබේ දක්‍ෂතාවයන් මත කැමති මාවතක් තෝරාගැනීමට ඔබට නිදහස ඇත.

## අනේ ඔබ එවන් පාලකයකු වේ නම්

පාලකයෙක් වෙන්න අපි මොනතරම් කැමතිද? පංති කාමරයක වේවා, වැඩබිමක, ආයතනයක, පන්සලක, ගමක, නගරයක, රටක පාලකයා, නායකයා වෙන්න අකමැති කෙනෙක් නොමැත. ඔබ ඔබෙන් අහල බලන්නකො නායකයෙක් වෙන්න ඔබ අකමැතිද කියලා. ඔබ දැනටමත් නායකයෙක් වෙන්න පුළුවන්. මිනිසා තරග කරන්නේද, සටන් වදින්නේද, අනුනට කැපිලි කෙටිලි දමන්නේද නායකත්වයට පාර සකස් කර ගැනීමටය. නැතිනම් නායකත්වය ආරක්ෂා කරගැනීමටය.

වෛරය, ක්‍රෝධය, සැකය නායකත්වය සොයා යන ගමනේ අතුරු ඵලයක්ය. නායකත්වය සෙවීම මිනිසාට පමණක් උරුම දෙයක් නොවේ. සෑම සත්වයෙකුටම පොදුය. සත්වයා මහා අකුසල් ප්‍රමාණයක් රැස් කරගන්නේ මෙ නායකත්වයට ඇති ගිජුභාවය නිසාය. මෙවැනි අකුසල් රැස්කරමින් ඔබ මෙ පාලනය කිරීමට යන්නේ කවුරුන්වද? අනුන්මය. අනුන්ව පාලනය කිරීමට යන ඔබ මොහොතක්වත් සිතුවාද තමාට තමාවත් පාලනය කර ගැනීමට නොහැකි ලෝකයක තමාට අනුන්ව පාලනය කිරීමට නොහැකි බව. කවුද ඔබට මේ අවබෝධය ලැබීම වලක්වන්නේ. තන්හාවයි. අනන්ත අප්‍රමාණ අකුසල් සිදුකරගනිමින්, විවිධ සටකපට උපක්‍රම යොදමින්, මුසාබස් දොඩවමින්, නැතිගුණ පෙන්වමින් ඔබද පාලනය මුවහත් කරගන්නවා.

බලය උදෙසා මොනතරම් ගහමරා ගන්නවාද, පාවාදීම් කරනවාද, කුලල් කාගන්නවාද, අනුනට මඩ ගසනවාද? බලයට ඇති කෑදරකම, ගිජුබව නිසාම තළුමරමින් ඉහත චර්යාවන් සිදුකිරීම බලය ලබාගැනීමට කළයුතු චාරිත්‍රයක් බවට පත්වෙලා. මේ හැම දෙයම මේ අය සතුටින්මයි කරන්නේ. තිබෙන සැප ආරක්ෂා කරගන්න, ඇති සැප වැඩිකරගන්න, නැති සැප ඇතිකරගන්න ලෝකය පසේස දුවනවා. දුක් විඳිමින් සැප සොයනවා. වර්තමානයේ සොයන සැප ලැබිලා නැහැ. ඒ නිසා අනාගතය තුළ සොයනවා. ඔවුන් දන්නෙ නැහැ අනාගතය කියල කියන්නෙ වර්තමානයටමයි කියලා. වර්තමානයමයි අතීතය වූවෙත් කියලා. මේ අයට හති දැනෙන්නෙ නැහැ. විඩාවක්, නිදිමතක් දැනෙන්නෙ නැහැ. සැප සෙවීමට, ආරක්ෂා කරගැනීමට, වැඩිකර ගැනීමට ඇති තන්හාව නිසා.

තන්හාව කියන්නේ හොඳ දක්ෂ මැහුම්කාරියක්. ඇය විසිහතර පැයේම ඉඳිකටුවයි, නූලයි අත තබාගෙනයි සිටිනුයේ. ඉන්ද්‍රියයන්ට පස්සයවන හැම කැමැත්තක්ම තද මැස්මකින් මසන්න. දක්ෂ මැහුම්කාරියගේ මේ වෙලීම කල්ප ගණනාවකට කැඩෙන්නේ නැහැ. කැමැත්තෙන්ම සසර බන්ධන වලට කොටුවෙන සත්වයාට, මේ තන්හාවේ මැහුම්කාරිය අතදිගහැර උදව්කරනවා. කුමක් සඳහාද? ඔබව බවය සමහ බන්දන්න, උපාදානය කරවන්න. අපිට හිතෙනවා ලෝකයේ දක්ෂම මැහුම්මහන දරුවෝ ඉන්නේ කටුනායක පැත්තේ කියලා. ඒත් ඒක මුලාවක්. ඒ අය මහන මැහුම් අවුරුද්දකින්, දෙකකින් නැතිනම් පහකින් දිරලා යනවා. ගැලවිලා යනවා. ඒත් තන්හාවේ මැහුම්කාරිය මහන මැහුම, ගසන වෙළුම කල්ප ගණනාවකට කැඩෙන්නේ නැහැ. ඇයට විඩාවක්, නිදිමතක්, වෙහෙසක් නැහැ. හැම තත්පරයකම ඔබ ඉදිරියේ ඇය සීරුවෙන් සිටිනවා. ඔබට පස්සය වන සෑම රූපයක් සමහම ඔබව වේදනාව විඳීමට සලස්වනවා. ඇලීම, ගැටීම, උපේක්ෂා වශයෙන්.

ඔබ කවදාහරි නිවීම ලබන්නේ තන්හාවේ මැහුම්කාරිය හඳුනාගෙන ඇයගෙන් මිදුනුදාටය. එතෙක් ඔබ කුසල් අකුසල් පිරුණු මහක නායකයින්ද, පාලකයින්ද වීමේ දොළදුක

සංසිඳුවාගැනීමට අකුසල්ම කරගසාගනිමින් ගමන් කරයි.

තිරිසන් ලෝකයේ සතුන් සහ පක්ෂීන් දෙස ඔබ හොඳින් බලන්න. ඔය තිරිසන් සතුන් කිසිවෙක් රාත්‍රියට හෝ දවාලට එක දිගට පැයක් නිදාගන්නේ නැහැ. ඒ සතුන්ට නිදාගන්න වාසනාවක් නැහැ. පිනක් නැහැ. ගසක අත්තක් සෙලවුනොත්, කොළයක් වැටුනොත්, තවත් සතෙකුගේ හඬක් ඇසුනොත්..... මේ ආකාරයට නිරතුරුව බියට පත්වී නින්ද කැඩෙනවා. තිරිසන් සතුන් මුළු රැයම නිදාගන්නේ බයෙන්. මෙය අහම්බයක් නොවේ. කර්ම විපාකයක්මයි. කර්මය තමයි පෙර ජාතිවල මිනිස් ආත්ම වල ඉපැදිලා ලොකු කුඩා පාලකයෝ වෙන්න ගිහින් කරපු අකුසල්. මිනිස්සු බියගන්වලා, පීඩනයට පත්කරලා, මුලාකරලා, අතීත භවවල කරපු අකුසල් මරණින් මතු විපාක දෙන්නේ ඔය විදිහට. ලොකු කුඩා පාලකයන්, නායකයන් මියගිය පසු පාංශකූල පොළේදී අනුශාසනා, දේශනා, ගුණකථා, බැනර, ශෝක ප්‍රකාශ, සැරසිලි වලින් ඔවුන්ව නිවන් දැක්වුවද සැබෑ යථාර්ථය කටුකය. ඔබ හොඳින් නිරීක්ෂණය කර බලන්න. තිරිසන් සත්ව ප්‍රජාවේ නායකත්වය වෙනුවෙන් එම සතුන් වියරුවෙන් ගැටෙන හැටි. වියරුව මරාගනිමින් නායකත්වයට සටන්වදින විලාසය. මේ සියල්ල එම සතුන්ගේ සංසාරික හුරුපුරුදුය.

ශ්‍රී සද්ධර්මය පවතින අවස්ථාවක, වාසනාවන්ත මනුෂ්‍ය විලාසයක් ලබා, නායකත්වයට ඇති ගිජුභාවය නිසා, අනන්ත අප්‍රමාණ අකුසල් සිදුකර තිරිසන් ආත්මයක් ලැබූ පසු, නැවතනම් කල්ප ගණනාවකට සුගතිගාමී ජීවිතයක් නම් ලැබිය නොහැකිය. මන්ද තිරිසන් සත්ව ප්‍රජාව තුළ ඇති වෛරය නිසා දුකෙන් දුක කරාම, තිරිසන් ලෝකයෙන් නිරය කරාම ඇදී යාම එම ස්වභාවය නිසාය. බලන්නකො මේ තරම් වටිනා මනුෂ්‍ය ජීවිතයක් ලබපු ඔබ, අනුන්ව පාලනය කරන්න ගිහිල්ලා කල්ප ගණන් අපාදුක් විඳින සත්වයන් බවට පත්වෙනවා. මොන තරම් අවාසනාවක්ද.

හැබැයි සමහරු ඉන්නවා, පෙර පිං නිසාම ආයාසයකින් තොරවම නායකත්වය, ප්‍රධානත්වය ලැබෙනා අය. ඒ අය බඳාගැනීමකින්, තෘෂ්ණාවකින් තොරවම නායකත්වය දරනවා. බහුතරයේ අකමැත්තෙන් නායකත්වය අතහරිනවා. ඔහු තමන්ට ලැබූ අවස්ථාව නිසා කුසලයක් රැස්කරගන්න දක්ෂ වෙනවා. ඔබම සිතන්න. ඔබ බඳාගත්තොත් ඔබට උරුමවන්නේ සතර අපායමය. ඔබ අතහැරියොත්, මධ්‍යස්ථවූවොත් ඔබට සුගතිය උරුමවෙනවා.

මේ ලෝකයේ සැබෑම ශ්‍රේෂ්ඨම පාලකයා තමයි, මෙලොව තමාට පාලනය කිරීමට තරම් දෙයක් නොමැති බව දකින තැනැත්තා. ඔහු ඉන්නේ සම්මා සම්බුද්ධ ශාසනයක පමණයි. ඒ තමයි අරිහත් උත්තමයා. උන්වහන්සේ තමා තුළ තමා නැතැයි දකිනවා. මම තුළ සත්වයෙක් පුද්ගලයෙක් නැතැයි දකිනවා. කුමක්ද එහෙනම් මෙතැන තිබෙන්නේ. වේගයක්. ඇතිවෙමින් නැතිවෙන රූපයක් සහ සිතක් පමණක් බව දකිනවා. පස්සය නිසා හටගන්නා වේදනාව සත්වයාව ක්‍රියාකාරීත්වයට පත්කරනවා. ඇතිවුනාවූ පස්සයද, වේදනාවද අනිත්‍ය බව උනවහන්සේ අවබෝධයෙන් දකිනවා. පාලනය කිරීමට යමක් නොමැති තැන පාලකයෙක් අවශ්‍ය නැහැ. දැන් බලන්න පාලනය කිරීමට කිසිවක්ම නොමැති තැනක, පාලකයෝ වෙන්න ගිහිල්ලා මිනිස්සු මොන තරම් මෝහයකද වෙළී සිටින්නේ. අනේ දෙවියනේ අවිμ ව මොනතරම් අසාධාරණයක්ද මේ සතවයාට කරන්නේ.

පාලකයන්. ප්‍රධානීන්, නායකයන් වෙන්න වෙරදරන ඔබට ලෝකයේ ශ්‍රේෂ්ඨම පාලකයා

වෙන්න මහක් තියෙනවා. ඔබ මේ මහ දිනාගත්තොත් එම ජයග්‍රහණය නැවැත උදුරාගන්න මේ තුන්ලෝකයේම කිසිවෙකුටත් බැහැ. ඔබට කරන්න තිබෙන්නේ සුළු දෙයයි.

"සිතේ පාලනයෙන් ඔබ මිදෙන්න. සිත පමණක් ඔබේ පාලනයට යටත්කරගන්න"

මෙතෙක් කල් ඔබ ක්‍රියාත්මක වූයේ ඔබට අයිති නැති සිත ඔබට අණකළ මග ඔස්සේය. ඔබ මේ මොහොතේම ඔබේ සිතට නියෝග කරන්න. "ඇඩීව" නියෝග කරන්න.

"සිත ඔබ මෙතුවක් කාලයක් ඔබට අවශ්‍ය ආකාරයට මාව ක්‍රියාත්මක කළා. සතර අපායට, දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝකවල ගාල්කළා. කල්ප ගණන් සංසාරයේ ඇවිද්දුවා. මෙතුවක් කල් මම අවිද්‍යාව නිසා ඔබට රැවටුණා. මින්මතු ඔබ කියන දේ කරන්නේ නැහැ. මම කියන දෙය ඔබ කළ යුතුයි"

ඔබට පුළුවන් නම් මේ තීරණය ක්‍රියාත්මක කරන්න, ඔබ තමයි මේ ලෝව ශ්‍රේෂ්ඨතම පාලකයා. ඔබට අයිති නැති, ආගන්තුක සිතක්, ඔබව බවයේ සිරකරුවෙක් කරගෙන සිටින අසාධාරණයෙන් ඔබව මුදාගන්නා ශ්‍රේෂ්ඨම පාලකයා ඔබ වෙනවා.

ඔය ඇතිවන නැතිවන සිත ඔබේ පාලනයට ගතහොත්, ඔබට පුළුවන්කම ලැබෙනවා මුළු විශ්වයේම පාලනය ඔබ අතට ගන්න. රටක්, නරගයක්, ගමක්, ආයතනයක්, පන්සලක්, ආරණ්‍යයක් නොවේ මුළු විශ්වයම. ඔබේ නිවන් මෙහෙයුමේදී සමාධියේ උපරිම තලයකට පැමිණෙන විටක, ප්‍රඥව විසින් මුළු විශ්වයම අනිත්‍යභාවයේ වේගයෙන් සියුම්කොට ඔබ ඔබේ දෝතට ගන්නවා. රූපය අනිත්‍යභාවයට පත්වෙන වේගය තුළින් විශ්වය යනු තම දෑතට ගතහැකි හිසේදයක්ය යන්න ඔබ දකිනවා. ප්‍රඥවෙන් ඔබ විශ්වය ඔබේ ග්‍රහණයට ගන්නවා. මෙතෙක් විශ්වයේ පාලනයට යටත්වූ ඔබ, විශ්වය යනු අතිදැවැන්ත වේගයට හසුවන, සතරමහා ධාතුන්ගේ ස්වභාවයක් බව අවබෝධයෙන් දකිනවා. මෙතෙක් විශ්වය ලෙසින් ඔබ දකිමින් සිටියේ පස්සය නිසා හටගන්නා වේදනාවක් බව දකිනවා. ඔබට දැනෙනවා ඔබ ලෝකයෙන් එතෙරවුනාය කියලා. සමාධියේ උපරිම තලයකදී ඔබට වැඩෙන ප්‍රඥව තුළිනුයි විශ්වයේ පාලනය ඔබට ලබාදෙන්නේ. ඔබ කවදාවත් හිතන්න එපා මොන ධ්‍යානයේදීද ඔබට මේ ඥණයන් ලැබනේනේ කියලා. එහෙම හිතුවොත් ඒවා කෙළෙස් ධර්මයන්. එසේ වුවහොත් නිවීම ඔබෙන් ඈතට යනවා. මේවා ධර්මයේ ආශ්වර්යයන්. හේතුඵල ධර්මයන්. හේතුව තමයි සැබෑ මධ්‍යම ප්‍රතිපදාවේ හික්මීම. තුන් සිවුරත් පාත්‍රයත් හැර ඉතිරි සියල්ල අතහැරීම. අත්හැරීමෙන් අර්ථවත්වූ නිවන් මහ අවසන් මෙහෙයුමේදී, අතහැරීමේ උපරිමය නිසාම තීව්‍රර වන ප්‍රඥව විසින් ඔබට මේ ගුණයන් ලබාදෙයි. ජීවිතයේ එක්වරක් පමණක් මේ ඥනදර්ශනයන් පහළවේ. ඔබට ඒවා නැවත නැවත ආවර්ජනය කර දැකිය හැකිය. එහෙත් දැන් ඔබට මේවා අවශ්‍ය නැත. එය තවත් සිදුවීමක් පමණක්මය. සියල්ල අයිති අනිත්‍යයටය. සිදුවූ එකම දෙය ඔබ ප්‍රමාදයෙන් මිදීම පමණකි. අප්‍රමාදීව කළයුත්ත කරගත්තා පමණකි.

මනුෂ්‍ය ලෝකයේ අනුන්ගේ පාලකයෝ වෙන්න ගිහින්, සතර අපායට වැටෙන තමන්ගෙ සිත පාලනය කරගෙන ලෝකයෙන්ම එතෙරවෙන්න. ලෝකයම ප්‍රඥවෙන් සියුම්කර ඔබේ දෑතට ගන්න. සැබෑ පාලකයෙක් වන්න. නැවත ලෝකයට නොඑනා ලෙසින්ම ලෝකයෙන් සහමුලින්ම මිදීයන්න. සැනසිල්ලේ නිවීයන්න. සතියෙන් සිහියෙන් යුතුව, ස්වභාවධර්මය දෙස

බලන්න. එවිට ධර්මයද, විනයද යන දෙකම ඔබ කෙරෙන් ආරක්ෂාවනු ඇත. ධර්මය සහ විනය පතපොතින් සොයා නොයන්න. නමුත් දැනුම ලැබීමටනම් ඔබ පතපොත නිරතුරුව පරිහරණය කරන්න.

මෙන්න ලොව සුන්දරම වචන පෙළ

මනුෂ්‍යයෙකුට, දෙවියකුට, බ්‍රහ්මයකුට මෙලොවදී අසන්නට ලැබෙන ශ්‍රේෂ්ඨම, උතුම්ම අත්දැකීම කුමක්ද කියලා ඔබ දන්නවාද? මේ කියන්න යන වචන පෙළ විශ්වයේ ඔබට අසන්නට ලැබෙන සුන්දරම වචන පෙළයි. මේ වචන පෙළේ අර්ථය ඉක්මවා ගිය සුන්දරත්වයක් මෙ විශ්වයේ කොතැනකවත් නොමැත. මේ වචන පෙළේ සුන්දරත්වයක් ඔබ දකින්න නම් ඔබ නිවන් මග වඩන කෙනෙක්ම වෙන්න ඕනේ. ඔබ තුළ දැන් කුතුහලයක් තිබෙනවා නේද ඒ සුන්දර වචන පෙළ කුමක්ද කියලා දැනගන්න. ඒ මෙයයි.

"ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවී. ඔබට මේ සියල්ලම ලැබෙද්දී, මෙ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද මේ සියල්ල අනිත්‍ය වශයෙන් ඔබ අවබෝධ කර ඇති නිසාය"

ඔබ මෙම වචන පෙළ නිතරනිතර සිහිකරන්න. එවිට ඔබට සිතේවී මේ මහ ගමන් කරන්න. බලන්න ලෝකයේ සැබෑම යථාර්ථය තියෙන්නේ කොතැනද කියලා. සත්වයා යන්නේ මොන මුලාවක් පසුපසද? සත්වයා සුන්දරයි කියලා දකින්නේ කුමක්ද?

පුළුවන් තරම් රැස්කරන්න. ගොඩගසාගන්න. අවසානයේ සියල්ලම දමා මැරිලා යන්න. දමලා යන දේවල් මමය, මගේය කියලා රැස්කරන්න ගිහිල්ලා රැස්කරපු අකුසල් නිසා සතර අපායේ බින්න බහින්න.

දරුවන්ට, බිරිඳට රැස්කරලා අකුසල් පුරවාගෙන මැරිලා අපාගතවන්න මිනිසා හරිම දක්ෂයි.

බලන්න.... අත්හැරීමත්, රැස්කිරීමත් අහසයි පොළොවයි වගේ වෙනස් සමීකරණ දෙකක්. එතරම් පරතරයක් තිබියදීත් එහි වෙනස ඔබ දකින්නේ නැහැ. ඔබ තුළ තිබෙන අවිද්‍යාව, තන්හාව නිසා දරාගෙන සිටින බර කොපමණද යන්න ඔබට දැනෙන්නේ නැහැ. ඔබ මුළු විශ්වයේම බර දරාගෙනයි සිටින්නේ. විශ්වයේ බරෙන් ඔබ නිදහස් වන්න. එවිට ඔබ ලොව නිදහස්ම පුද්ගලයා වෙනවා. "මම, මගේ , අපි, අපේ" කියලා කල්ප කෝටි ගණනක සිට වපුරපු, පුරවපු බර කද ඔබ දරාගෙනයි සිටින්නේ. ඔබ තුළ "මම මගේ" කියලා කෙනෙක් නොමැති බවට ඔබ ප්‍රඥාවෙන් දකින මොහොතේ, මේ බර කද ඔබෙන් ගිලිහෙනවා. මේ බර ඔබෙන් ගිලිහීයාමේදී එය ඔබට හොඳින් දැනෙනවා. ඔබට දැනෙනවා, තේරෙනවා මහා වෙනසක් ජීවිතය තුළ සිදුවූ බව. ඔබ නුවනින් බලනවා, මෙනෙහි කරනවා, ඔබ අවබෝධය ලබනවා, ඔබ තුළින් රාගය, ද්වේෂය, මෝහය නැතිවීගිය බව. ඒ කෙළෙස් ධර්මයන් නැතිවීගොස් තිබුණේ ඒවා තිබූ බවට සලකුණකුදු නොතබාමය. එයයි ආශ්චර්යය ධර්මයේ.

ඔබ සිතන්න අවුරුදු දහස් ගණනක් පැරණි ගසක් තියෙනවා කියලා. ඔබ බුල්ඩෝසර කිහිපයක්

යොදලා ඒ ගස මුලින්ම උදුරනවා. ඔබ කොතරම් වෙහෙසගත්තත් ඔබට බෑ දශමයක ප්‍රමාණයේ හෝ මුල් කැබැල්ලක් පොළොවේ නොසිටන ලෙස එම ගස ඉවත්කරන්න. මොන ආකාරයක් යොදා ගස ඉවත් කළද පුංචි මුල් කැබැල්ලක් හෝ පොළොවේ තිබෙනවා. නමුත් නිවන් මහ අවසන් මෙහෙයුමේදී භික්ෂුව තුළින් රාගය, ද්වේෂය, මෝහය නිවීයන්නේ ඒවා කිසිකලෙකත් භික්ෂුව තුළ තිබූ බවට සලකුණකුදු නොතබාමය. ඉතිරි නොකරය.

එවිට ඔබට දැනෙනෙවා ඔබ මෙතෙක් දරාගෙන සිටි බර ඔබට අයිති දෙයක් නොව, ලෝකයට අයිති දෙයක් බව. තමන්ට අයත් නැති බරක් තමන්ගේ කරගනිමින්, කරගසාගෙන යන මෝහබරිත පෘතග්ජන තත්ත්වයෙන් මිදීමට හැකිවීම ගැන ඔබට සතුටක් දැනෙන්නේ නැහැ. දැනෙන්නේ කළයුත්ත කරගත්තාය කියන හැඟීමයි. ඔබ මෙහිදී ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. මොකද ඔබ ජයග්‍රහණයක් නොවේ ලැබුවේ. දිනුම් කණුවක් නොවේ ඔබ පසු කළේ. තව කෙනෙක් පරාජය කළා නොවේ. ඔබ පළවෙනියා වුනා නොවේ. මේ ලෝකයේ පවතින ස්වභාවය, යථාර්ථය හඳුනාගත්තා, අවබෝධකරගත්තා පමණක්මය.

ලෝකයේ මෙම විජයග්‍රහණය, ජයග්‍රහණය නොසමරනු ලබන, ලොව ශ්‍රේෂ්ඨම, නිහතමානීකම දෝරේ ගලායන ජයග්‍රහණයයි.

ඔබ මෙහිදී කිසිවක් ලබා නැත. සියල්ල අතහැරුණා පමණමය. එය ජයග්‍රහණයක් නොව නිදහස්වීමකි. එහෙත් ඔබ බර දරාගෙන සිටින ලෝකයා අතර, ඔවුන්ගේ සිව්පසය ලබමින්, යැපෙමින් ලෝකයේ බරෙන් සැහැල්ලු වන නිදහස "නිදහසේ" අත්දකිනු ඇත. ඔබ ලබන ඒ උතුම් නිදහස ඔබට මිස වෙනත් බාහිර කෙනෙකුට නොදැනෙනු ඇත. මන්ද මනුෂ්‍යයා දරාගෙන සිටින බර නිසා, අනුන්ගේ සැහැල්ලුවද, නිදහසද ඔහු, ඔහුට බරක් කරගන්නා බැවිනි. බර දරාගත් මිනිසුන් අනුන්ගේ සැහැල්ලුව, තමන්ට බරක් කරගැනීම පෘතග්ජන සිරිතය. මේ ස්වභාවය නිසා සත්වයා නොදැනුවත්ව කරගන්නා අකුසල් ප්‍රමාණය අති විශාලය.

ලෝකයේ බරෙන් ඔබ නිදහස්වන්න. නිදහසේ සැහැල්ලු බව ගැන ඔබ ලෝකයාට කියාදෙන්න. ලෝකයත්, සිතේ ස්වභාවයත් අනිත්‍ය පමණක්ම බව දකින්න. සිත අනිත්‍ය බව අවබෝධකර ගන්න. එවිට ආයාසයකින් තොරවම ලෝකයේ ස්වභාවය ඔබට අවබෝධවේවි. සිත අතහරුණවිට, ඔබට ලෝකයද අතහැරෙනු ඇත.

## ඇත් සවිය පරදන අතහැරීමෙ අවිය

නිවන් මඟ වඩනා භික්ෂුවකට හුදෙකලාවෙ උපරිමය ලැබිය හැක්කේ වනය තුළදීය. ගොදුරු ගමෙන් කිලෝමීටර් එකක්, දෙකක් හෝ තුනක් ඈතින්, දිය අගලක් සමීපයේ ඇති කුටියකවන හුදෙකලාව වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම හුදෙකලාවයි. රක්ෂිත තුළ ඇති හුදෙකලා කුටි වලට යන අඩිපාර අලි ඇතුන් ගමන් කරන අලිමංකඩයි. එහෙයින් මෙවැනි කුටි අසල රාත්‍රියට නිතර අලින් ගැවසේ. වනයේ අලි ඇතුනුත් නිවන් මඟ වඩන භික්ෂුවත් අතර ඇත්තේ පුදුමාකර සබඳතාවකි. අලි ඇතුන් භික්ෂුවගේ ඉව, සුවඳ හඳුනන්නාසේය. දෙගොල්ලෝම දෙගොල්ලන්ට හිංසා පීඩා කරනොගනිති. නිදහසට ගරු කරති. නමුත් කැලයේ ආධිපත්‍යය මෙන්ම අලිමංකඩවල ආධිපත්‍යය පෙන්වීම අලින්ගේ සිරිතය. මෙවැනි අවස්ථාවල වනගත භික්ෂූන් මෛත්‍රිය වඩමින්, බුදුගුණ වඩමින්, අංගුලිමාල පිරිත, නාලාගිරි ගාථාව වැනි ආරක්ෂක විධි අනුගමනය කරමින් ඇතිවිය හැකි උපද්‍රවයන්ගෙන් මිදෙයි. ඉහත භාවිතයන් එක් එක් භික්ෂුවගේ අවබෝධය මත වෙනස්ය. නිරතුරුවම කැලයට ඇතුළුවන විට අප කරන්නේ නපුරු සතුන් මුණනොගැසේවා යන්න තමාගේ ආධ්‍යාත්මික ශක්තිය උපයෝගී කරගනිමින් අධිෂ්ඨානය කිරීමයි. ඔබ ඉහළ ආධ්‍යාත්මික ශක්තියකින් පරිපූර්ණනම් ඔබට අනිවාර්යයෙන්ම නපුරු සතුන් මඟහැරී යනු ඇත. මේවා හේතුඵල ධර්මයන්ය. ආශ්චර්යයන් නොවේ. හේතුව තමා තුළ ඇති ආධ්‍යාත්මික ශක්තියයි. සමහර විට ඔබ වඩින අඩිපාරේ ඒ මොහොතේ කඩා දැමූ අතු කොළ පාර පුරා වැටී ඇත. ඒ මොහොතේ දැමූ අලි බෙටි ඇත. අලි ගඳ තදින් නහයට දැනෙනු ඇත. එහෙත් ඔබට අලින් මඟහැරී ගොස් ඇත. ඔබ දක්ෂ විය යුත්තේ මෙවැනි ක්‍රමයකට නපුරු සතුන් මඟහැරයැමටය. අත්හැරීම තුළින් ඔබ ලබන්නාවූ ආධ්‍යාත්මික ශක්තිය අතිප්‍රබලය. එවැනි ශක්තියකින් ඔබ අධිෂ්ඨාන කළහොත් ඔබට නොතේරුණද පොළොවද, පරිසරයද, නපුරු සතුන්ද කම්පාවට පත්වෙයි. එය ධර්මයේ බලයයි. තිරිසන් ලෝකයේ සතුන්ගෙන් ධර්මයේ බලය හොඳින් දැනෙන සතුන් අලි ඇතුන්ය. ඒ අයට තෙරුවන්ගේ ඉව හොඳින් දැනේ. එය අනන්ත කාලයක් පාරම්පරිකව වනයේ වැඩ සිටින ධර්මය අවබෝධය ලැබූ භික්ෂූන් සමඟ ගැවසීමෙන් එම සතුන් ලැබූ ආභාසයයි. වනවාසී භික්ෂූන් දස දහස් ගණනින් අතීතයේ වනයේ වැඩසිටියේය. අලි ඇතුන්ද එම පරිසරයේම කොටසකි. එහෙයින් භික්ෂුවගේ ගුණ සුවඳ හොඳින් හඳුනයි.

ඇතුන්ගේ කුංච නාදය කුමන හේතුවක් නිසා කරන්නේ දැයි මෙ භික්ෂුව නොදනී. නමුත් එය සුබ නිමිත්තකි. කුංච නාදය කරන ඇතුන් තුළ ඒ මොහොතේ ඇත්තේ ගාම්භීරත්වය, පෞරුෂත්වය, අදීනත්වය, නායකත්වය වැනි ෙචතනාය. භික්ෂුවක් වැඩ සිටි කුටිය සමීපයට රාත්‍රී යාමයේ පැමිණි තනි අලියෙක් කුටියේ පිටුපස එක් කොනක සිට මහා හඬින් කුංචනාද කළේය. තවත් මොහොතකින් එම අලියා කුටියේ අනික් කොනට ගොස් දෙවැනි වතාවටද මහා ශබ්දයකින් කුංචනාද කළේය. මීට පෙර අලි ඇතුන් කුංචනාද කරනවා භික්ෂුව අසා නොතිබුණු නිසා භික්ෂුව සිතුවේ අලියා කේන්තියෙන් වියරුවැටී කෑගසන බවයි. කුංචනාදය මහා හඬකින් හක් පිඹින්නා ස්වරූපයෙන් කෙරෙන්නකි. සිහින් පිඹීමකින් පටන් ගන්නා හඬ ක්‍රමයෙන් වැඩිවී මහා දෝංකාරයකින් අවසන්වේ. ප්‍රදේශයම දෝංකාර දෙයි. කුංචනාදය පටන්ගෙන අවසන්වීමට

තප්පර ගණනාවක් ගතවේ. අවසන් වේගවත් හඬට ප්‍රදේශයම සලිතවෙයි. තවමත් කුංචනාදය යනු එය දැයි කියන්නට භික්ෂුව නොදනී. එහෙත් එය කුංචනාදය යැයි අනුමාන කරමි.

අලියා මහා රත්‍රියේ මෙලෙස දෙවරක් කුංචනාද පවත්වද්දී භික්ෂුව සිටියේ දොර ජනෙල් නොමැති, පරිසරයට නිරාවරණය වූ වනයේ කුටියකය. ඉදිරිපස බිත්තිය නොමැති නිසා ලණුවක එල්ලන ලද පරණ සිවුරකින් ඉදිරිපස ආවරණය කර තිබුණි. සැබැවින්ම භික්ෂුව සිතුවේ අලියා වියරු වැටී ඇති බවකි. අලියා වේගයෙන් කුටිය සමීපයේ සැරිසරන හඬ භික්ෂුවට හොඳින් ඇසේ. කොටින්ම අලියා කලබල ස්වභාවයක් දැක්වීය. රාත්‍රී ඝන අඳුර සහ නිහඬභාවය නිසා අලියාගේ හැසිරීමේ ස්වාභාවය හොඳින් භික්ෂුවට දැනේ. දැන් මේ ජවනිකාවට පැය භාගයක් පමණ ගොස්ය. මෙවැනි විටක දක්ෂ භික්ෂුවකට කළ හැකේක් එකම එක දෙයකි. භික්ෂුවට මෙම සිදුවීම අභියෝගයකි. එහෙත් එම අභියෝගය ජයග්‍රහණයකට හරවාගැනීමට එය ආශිර්වාදයක් කරගැනීමට භික්ෂුව දක්ෂ විය යුතුය. භික්ෂුව කලබලවූ අලියා ගැන සිතීම අතහැර, මේ සිතත් මේ කයත් මගේ නොවේ යැයි අතහැරදමා කොට්ටයට හිසතබාගත්තේය. සිත අතහැරදැමූ නිසා කයේ කිසිම ක්‍රියාකාරීත්වයක් නොමැත. ලොව ශේ‍්‍රෂ්ඨම අතහැරීම භික්ෂුව අධිෂ්ඨාන කරන මොහොතේම පරිසරය මහ පොළොව කම්පාවනු ඇත. දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක වලටද මේ අතහැරීම දැනෙනු ඇත. එහි දිව්‍ය, බ්‍රහ්ම වැසියන්ද සිදුවූයේ කුමක්දැයි බලනු ඇත.

"ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවී" කියන්නේ මේ නිසාය. ඔබ සියල්ල අත්හළ මොහොතේ ඔබට විශ්වය කම්පාකරවන්න පුළුවන්. එය ඔබට තවත් සිදුවීමක් පමණකි. හපන්කමක් හෝ ආඩම්බරකමක් නොවේ. ඔබ විශ්වාස කරන්න. භික්ෂුව තම සිත අතහැරදැමූ මොහොතේ එතෙක් පැය භාගයකට වැඩි කාලයක් කුටිය අසල කලබල ස්වරූපයෙන් හැසිරුණු තනි අලියා ආගිය අතක් සොයාගැනීමට නොහැකිවිය. තනි අලියා අතුරුදන්වී පැය දෙකකට පමණ පසුව නැවත එම අලිමංකඩ ඔස්සේම වනය තුළට නිහඬව යනවා ඇසිණි. භික්ෂුවගේ අතහැරීමේ ශක්තියේ බලය තනියාටද දැනිණ.

ඉහත සිද්ධිය වන විට භික්ෂුව කරණීයමෙත්ත සූත්‍රය හැර වෙන කිසිම සූත්‍රයක් කටපාඩමින් නොදැන සිටියේය. පිරිත් පොතක්ද භාවිත නොකළේය. සැබෑම මධ්‍යම ප්‍රතිපදාව අර්ථගන්වන තුන් සිවුරත්, පාත්‍රයත් පමණක් කුටියේ තිබුණි. බලන්න නිවන් මඟ වැඩිය යුතු භික්ෂුවක් මේ ජීවිතය තුළදීම නිවීම සාක්ෂාත් කරගැනීමට යායුතු මඟ. කැලය තුළට වඩිනවිටම ජීවිතය අතහැරලා. "කැලයේ අලි ඇතුළු නපුරු සතුන් සිටිනවා. ජීවිතයට අනතුරක් වෙයි. කැලයේ යක්කු යක්ෂණියෝ ඉන්නවා. ඒ අය බියගන්වාවී, කරදර කරාවී, ආරක්ෂාවකට පිරිත් පොතක් ගෙනියන්න ඕනි. කන්ද පිරිත දැනගන්න ඕනෙ." මෙවැනි සංඥ ඔබට තිබෙන්න බැහැ. මේ සංඥ ඔබට තිබෙනවා නම් ඔබ කැලයට හුදෙකලාවෙන්න යන්නත් එපා. ඔබ ශක්තිමත් වනතුරු ඉවසන්න. මහවැඩු කල්‍යාණ මිත්‍රයන්ගෙන් උපදෙස් ගන්න. ඔබ කැලයට යායුත්තේ මම අතහැරීමට මිස මම ආරක්ෂා කරගැනීමට, නොවේ.

ඔබ තුළ අයෝමය ආත්ම ශක්තියක් තිබෙන්නෙ ඕනේ. එම ශක්තිය ඔබට දෙන්නේ ඔබේ පරිපූර්ණවූ ශීලය සහ සමාධිය තුළින්. නමුත් ඔබ මෙ වන විට ශීලය, සමාධිය කරගසාගෙන සිටින්නේ නැහැ. ඒවත් බිමින් තබනවා. මොකද ඒවයේ ස්වභාවයත් අනිත්‍ය නිසා. දැන් ඔබට වැඩෙන්නේ ප්‍රඥවයි. ඔබට වැඩෙන ප්‍රඥව ඔබ දකින අලියාද, යක්‍ෂයෝද, යක්‍ෂණියෝද ඇසෙන ශබ්ද සහ දෝංකරද, ඔබට පෙනෙන දෙවියෝද, බ්‍රහ්මයෝද ඔබ දකිනුයේ රූපයක් පමණක්ම බවයි. රූපයේ ස්වභාවය අනිත්‍යයි. භික්‍ෂුවද, අලියාද, කැලයද නිරතුරුම වෙනස් වන සතර මහා ධාතූන්ගේ නිර්මාණයෝය. අපි භික්‍ෂුව, අලියා, කැලය වශයෙන් දකින්නේ එකිනෙකට වෙනස් සතර මහා ධාතූන්ය. මේ සියල්ල අනිත්‍යභාවයේ රූකඩයෝය. එහි යමෙක් හඳුන්වන සම්මුතියක් තිබුණද ඒ තුළ සත්වයෙක් පුද්ගලයෙක් නැතිබව ඔබ දනී. එහි ඇත්තේ අනිත්‍ය පමණකි. නැතිදෙයකට ඇලීම, ගැටීම උපේක්‍ෂාසහගතවීම දැන් ඔබෙන් ගිලිහීගොස්ය. ඔබ දුටු දේ දුටු බවත්, ඇසුණ දේ ඇසුණ බවත් පමණයි දකින්නේ. ඒවා ගැන සිතන්න දෙයක් නැහැ. මොකද ඒවා අනිත්‍යයට අයිති නිසා.

"අතහැරීම" 13 කොටස

හිංසාවේ රාත්‍රිය

(නව වසරට ධාර්මික ප්‍රවේශයක් සඳහා
කෙරෙන ආරාධනය)

අද ජනවාරි පළවැනිදා. වසරක් ගෙවිල වසරක් ලැබුව දවස. වසරක් ගෙවීගියාය කියන්නෙ අපි කාටත් ජීවත්වෙන්න තිබෙන කාලයෙන් වසරක් අඩු වුණාය කියන එක. ඒ කියන්නෙ මරණයට වසරකින් ලංවුණාය කියන කාරණය. මේ කොයි පැත්තෙන් බැලුවත් අවංකවම සතුටු වෙන්න දෙයක් මෙතැන නැහැ. නමුත් ගෙවීගිය වසරේ පිංවත් ඔබ අප්‍රමාදීව ධර්ම මාර්ගයේ ගමන් කළානම් ලැබුවා වූ වසරේ ඊටත් වඩා ශක්තිමත්ව ධර්ම මාර්ගයේ ගමන් කරනවාය කියන අධිෂ්ඨානය ඔබ තුළ ඇතිවුණානම් එතන තිබෙන්නෙ අර්ථවත් සතුටක්. ඒ වගේමයි ගෙවීගිය වසරේදී දාන, ශීල, භාවනා කටයුතුවලදී ප්‍රමාදභාවයට පත්වුණා, නව වසරේදී මා අප්‍රමාදීව කටයුතු කරනවාය කියන අධිෂ්ඨානයද සතුටට හේතුවක්මයි. වසරක් ලැබුව අවස්ථාවක පිංවත් ඔබට ජීවිතයේ තැබිය හැකි ලොකුම බලාපොරොත්තුව තමයි මේ වසර තුළදී මා සතර අපායෙන් නිදහස් වීමට උපරිම උත්සාහයක නියැළෙනවාය කියන බලාපොරොත්තුව. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පැවිදි පක්ෂය විසින් ගිහි පක්ෂයට, දෙමාපියන් විසින් දරුවන්ට, ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට, කෙනකු විසින් තව කෙනකුට සමාදන් කරවිය හැකි උතුම්ම ත්‍යාගය, දායාදය සතර අපායෙන් මිදීමේ මාර්ගය පහදාදීමය, සමාදන් කරවීමය කියලා.

නව වසරක් ආරම්භයේදී බුලත් අතකින්, කැවිලි පිඟානකින්, කේක් ගෙඩියකින්, සුබ පැතීමකින්, හුවමාරු කරගන්නා ඥතිත්වය, ස්වාමිත්වය, සෙනෙහස, හිතවත්කම ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකොටවදාල සැබෑ ඥති සංග්‍රහය සමග මොනතරම් නම් ප්‍රාථමිකදැක්මක්ද? සුබ අලුත් අවුරුද්දක් වේවා කියල කරන ශුභාශිංසනය තුළ මෛත්‍රිය, මනුෂ්‍යත්වය මුසුවෙලා තිබෙන බව ඇත්ත. ඒ ඇත්තේ තරමටම එම ශුභාශිංසනය තුළ අවිද්‍යාවද සැඟවී තිබෙන බව ඇත්තම කාරණයකි. අවිද්‍යාව කියල කිව්වේ විද්‍යාවෙන් තොරභාවයයි. ඒ කියන්නෙ ඇත්ත ඇතිසැටියෙන් නොදැකීමයි. දුක සැප මාරුකොට ගෙන දැකීමයි. ජාති, ජරා, ව්‍යාධි, මරණ වලට තව තව ළංවන මොහොතේ සුබ නව වසරක් වේවා කියනවා වෙනුවට ලැබුවා වූ නව වසර, සතර අපායෙන් නිදහස් වෙන වසරක් වේවා කියල ප්‍රාර්ථනා කළොත් එතන තිබෙනවා ජාති, ජරා, ව්‍යාධි, මරණ වලින් මිදීමට ඔබ ගන්නා වූ උතුම් උත්සාහයක්. එහෙත් පිංවත් ඔබ මෙවැනි අර්ථවත් සුබ පැතීමක් කරන්න ලැජ්ජයි.

අර්ථවත් දෙයින් අයින් වෙලා අනර්ථවත් දෙය ළංකර ගන්නවා. බුදුසරණයි, තෙරුවන් සරණයි කියලා කියනව. නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනානාකොට වදාළ ධර්මමාර්ගය ගැන කියන්න ලැ-ජා වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සරණ ගියා යැයි කියන්නේ අර්ථවත් ආකාරයෙන් ධර්ම මාර්ගයේ ගමන් කරනවාය කියන කාරණයයි. පිංවත් ඔබ සතර අපායෙන් නිදහස් වීම සඳහා සමාදන් විය යුතු තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ශීලයේ පරිපූර්ණත්වය, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දැකීම කියන අර්ථයන් මහා සංසරත්නය විසින් නිරතුරුවම ඇසෙන මොහොතක, අපි මොනතරම් දුර්වලතාවකින්ද ජීවිතය සැලසුම් කරගන්නේ. අප්‍රමාණ සැප ලැබිය හැකි මාර්ගයක් ඇස්පනාපිට තිබියදී අති දීර්ඝ දුකක් උදෙසා

කෙටි සැපයමයි අපි සොයන්නේ. ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ ශාස්තෘන් වහන්සේ නමකගේ ඉගැන්වීම්වල අර්ථයන් ලිහිල් භාවයට පත්කොට ආගන්තුක චරිතාකම් අපේ කරගැනීම අභාග්‍යයකි. මෙතැනදී පිංවත් ඔබ සිතන්න අවශ්‍ය නැහැ අපට මාර්ගය කියල දෙන ගුරුවරු කොතැනද ඉන්නෙ කියලා. ඇසෙන සම්බුදු ධර්මයයි ඔබ ඔබේ මාර්ගය කරගත යුත්තේ.

ගුරුවරුන්ගේ පුංචි හෝ දුර්වලතාවක් දකිනම් එයද මාර්ගය වැඩීමේදී කමටහනක් කොට ගැනීමට ඔබ දක්‍ෂ විය යුතුය. ලෝක තත්ත්වයන්ට ඇලීමේ, ගැටීමේ ස්වභාවයන්ට යන්නේ නැතිව සමාජය, මනුෂ්‍යයා, ව්‍යාකුල වෙන්න වෙන්න ඇතිවන සමාජ විකෘතිය ධර්මයේ අර්ථය වශයෙන්මයි අපි දැකිය යුත්තේ. ලෝක ධර්මයන් කෙරෙහි ඇලීමත් ගැටීමත් සකසේවන සිතක ඔබ නොදකින එකම දෙය අනිත්‍යයයි. ඒ කියන්නේ ධර්මයේ අර්ථය නොදැනීමයි. ධර්මයේ අර්ථය නොදකින්නා තමා අත්දකින ලෝකධර්මතාවන් හමුවේ ඇලීමත් ගැටීමත් අතර දෝලනය වෙමින් ධර්මයේ ස්වභාවය අවබෝධ කොටගැනීම මගහැරනිත්‍ය වූ සැපයක්ම සොයනවා. මෙතැනදී තමයි සමාජ ව්‍යාකුලභාවය විකෘතිභාවය සකස් වෙන්නේ. අසීමිත ඇලීම, අසීමිත ගැටීම, අසීමිත උපේක්ෂාවන්ගේ එකතුවක් වෙනවා ලෝකය. ඵලය ලෝකය තුළදී දුටුවත්, හේතුව සකස් වූයේ ධර්මය නොදත් මිනිස්සන්තානය තුළම නේද? කැඩෙන, බිඳෙන, විසිරෙන සම්මුති ලෝකයේඅර්ථය සකසේවන්නේ නාමරූප දෙක නැමැති"පුංචි ලෝකයේ" හේතුඵල ධර්මතාවන් නිසාම නේද? ඒ නිසා පිංවත් ඔබ ධර්ම මාර්ගයට එන්න. මාර්ගයේ හික්මෙන්න. එවිට ඔබ දකින ලෝකය යහපත් වේවි. ඔබ ලෝකය තුළ සුරක්ෂිත වේවි. ඔබ ලෝකයෙන් නිවී යාවි. ඉහත කරුණු සියල්ලම සකස් වුණේ ඔබ තුළින්ම නේද? කැඩෙන, බිඳෙන, විසිරෙන සම්මුති ලෝකයත්, නාමරූප නමැති මම කියන "පුංචි ලෝකයත්", අනිත්‍යයේ අර්ථයෙන්ම සකස්වුණු දේවල්ය. අර්ථය අනිත්‍ය වූ කල්හි යමක් නිත්‍ය භාවයක් සොයයි නම් ඔහු සොයන දෙය කවදාවත් හමු නොවනු ඇත.

ඔබද මමද සසර මෙතෙක් පැමිණියේ එම නිෂ්ඵල ගමනයි. පිංවත් ඔබ ලැබූ මේ ජීවිතයද සැප කෙරෙහි ඇති තෘෂ්ණාව නිසා සකස් කොට ගත් ජීවිතයකි. පිංවත් ඔබම තීරණය කරන්න ඔබ ධර්මයෙන් කොතරම් දුරස් වෙලාද ඉන්නෙ කියලා. මේ දුරස්භාවය අවම කරගන්න ඔබ විසින් ඇති කරගන්නා අධිෂ්ඨානය ක්‍රියාත්මක භාවයට පත්වෙද්දී ඔබ තුළ ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥ කියන ධර්මතාවන් වැඩෙන්න ඕනේ එකිනෙකට අඩු වැඩි භාවයෙන් තොරව. මෙන්න මේ "අඩු වැඩි භාවයකින් තොරව" කියන ස්වභාවය සමජයේ හුඟ දෙනකුගෙන් ගිලිහී ගොස් තිබෙනවා. ප්‍රඥව වැඩෙන ආකාරයට නොවේශ්‍රද්ධා, වීර්යය, සති, සමාධි කියන කාරණා ජීවිතයට එකතු කර ගන්නේ. විදර්ශනා ඥනය වැඩෙන දිශාවටමයි පිංවත් ඔබ ඉහත කාරණය සතියෙන්, සිහියෙන් යුතුව ජීවිතයට ගලපාගත යුත්තේ. මමත්වය වැඩෙන දිශාවට නොවේ. වසරක උදාවක් සමරන මොහොතක මෙවැනි ධර්මයක් ගැන පිංවත් ඔබ නැවත නැවත සිතනවානම්, මෙවැනි ධර්මයකට මුල්තැන දෙනවානම් එම වසර මොන තරම් සංහිඳීමට පත් වූ වසරක් වේවිද? අර්ථවත් ලෙසම තෙරුවන් සරණගිය වසරක් වෙනවා නේද? පිංවත් ඔබ ගත්තා වූ තීරණයෙන් සැනසෙන්නේ ඔබම නේද? දුකෙන් මිදෙන දිශාවට යන්නේ ඔබම නේද? එසේ නොවුණ කල්හි ඔබ යන දිශාව ගැන පහත සටහන තබමි.

ජනවාරි පළවෙනිදා කියනකොටම සිහියට නැඟෙන්නේ දෙසැම්බර්31 දා රාත්‍රියයි. මෙ රාත්‍රියේ භික්ෂුව වැඩසිටියේ අගනුවරට ආසන්න ආරණ්‍යයකය. රාත්‍රි 12.00 වෙලාවට ආසන්න වෙද්දී පුපුරා ගිය රතිඤ්ඤ පිපුරුම් හඬ මොනතරම් වේගවත්ද කියලා පිංවත් ඔබටත් ඇසෙන්නට ඇති. මේ රතිඤ්ඤ පිපුරුම් හෙŒ දෝංකාරය කියන්නේ අවිද්‍යාවේ හඬයි. ඔබ

හිතල බලන්න මීට වසර විසිපහකට පෙරාතුව ඉඳල වසරින් වසර මේ හඬ වැඩිවුණා මිසක් අඩුවුණේ නැහැ. අනාගතයේ කවදාකවත් මේ හඬ අඩුවෙන්නේ නැහැ, වැඩිවෙනවා මිසක්. මේවා ලෝකධර්මතාවන්. මනුෂ්‍යයා ධර්මයෙන් පිරිහෙන්න පිරිහෙන්න නොවටිනා වටිනාකම් අර්ථවත් වෙනවා.

ශීලයේ, සමාධියේ, ප්‍රඥවේ නිහඬ භාවයට එරෙහි ස්වභාවයන් තමයි සකස් වෙන්නෙ. ඝෝෂාව යම් තැනක තිබෙනවානම් එතන ශීලයක්, සමාධියක් තිබෙන්න විදිහක් නැහැ. මෙ දෙක නැති තැන ප්‍රඥව ගැන කථාකරල තේරුමක් නැහැ. ආයිමත් අපි එන්නේ අවිද්‍යාව කියන තැනටමයි. ලෝකයේ තිබෙන සැබෑම නිහඬතාවඅත්විඳින්න පුළුවන් ඝෝෂාව තුළදීයි. දෙසැම්බර් 31 රාත්‍රියේ භික්ෂුව සයනය මත වැතිරී ඒ සැබෑම නිහඬතාව අත්වින්දා හොඳ හැටියට. පරිසරය ඝෝෂාකාරී වෙන්න වෙන්න තමන්ගේ සිතේ නිහඬභාවය හොඳින් දැනෙනවා, පෙනෙනවා. පුපුරණ රතිඤ්ඤා හඬින් දෙදරුම්කන පරිසරය, නිහඬ සිතින් අත්දකිද්දි අවිද්‍යාවේ ඝෝෂාවත්, විද්‍යාවේ නිහඬතාවත් සක්සුදක් සේ පැහැදිලි වෙනවා. අර්ථවත් වෙනවා. එවිට දුකක්, සැපක් නොවේ සිතට දැනෙන්නේ. අවදානමෙන් මිදුනා වූ නිදහසේ සුවයයි. මෙවන් අසිරිමත් මාර්ගයක් පිංවත් ඔබේ ඇස්පනාපිට තිබියදී ශීලයේ, සමාධියේ, ප්‍රඥවේ උතුම් නිහඬතාවයේ අර්ථය රතිඤ්ඤවෙ හඬින් විනාශකොට දමනවා.

පිංවත් ඔබ කල්පනා කරන්න වසර සුබවෙන්න කියලා ඔබ කොතෙක් රතිඤ්ඤා පත්තුකළත් වසර සුබවෙලා තිබෙනවාද? දවසින් දවස ක්‍රෝධය, වෛරය, දුෂ්ශීල භාවය මහා වේගයකිනුයි සමාජයේ ඉහළ යන්නේ. රතිඤ්ඤා පිපුරුම් හෙ දෝංකාරය යම් සේ වේගවත්දදුෂ්ශීල භාවයේ වර්ධනයත් සමාජය තුළ වේගවත් වෙලා. ශ්‍රාවකයා ශාස්තෘන් වහන්සේ හඳුනන්නේ නැහැ. ගුරුවරයා ගෝලයා හඳුනන්නෙ නැහැ. දෙමාපියන් දරුවන් හඳුනන්නෙ නැහැ. පාලකයා ඇත්ත යුක්තිය හඳුනන්නේ නැහැ. පිරිහීමේ දෙසටමයි සමාජය ගමන් කරන්නේ. ඒ කියන්නේ කොතෙක් රතිඤ්ඤා පත්තුකළත් වසර සුබවෙලා නැහැ. කොහොමද වසර සුබවෙන්නෙ මනුෂ්‍යයා විසින් මොනතරම් අකුසල් කන්දරාවක් සිදුකරගෙනද? මොනතරම් සත්ව ඝාතන, සත්ව හිංසාවන් සිදුකරගෙනද? වසරක් උදාවෙන්නේ.

දෙසැම්බර් 31 වෙනිදා රාත්‍රියේ රතිඤ්ඤා පත්තු කරන ඔබ මොනම හේතුවක් නිසාවත් සිතන්නෙ නැහැ ඔබ පත්තුකරන රතිඤ්ඤා නිසා බරපතළ සත්ව ඝාතන, සත්ව හිංසාවන් සිදුවෙනවා කියලා. මොකද ඔබ දකින්නෙ ඇසෙන් පෙනෙන ලෝකය පමණයි. ගස්, ගල්, මනුෂ්‍යයෝ, ගෙවල් දොරවල් ඔබට පෙනෙන ලෝකය. ඒ ලෝකය තුළ ඔබ නිවැරුදි කරුවෙක් බව ඇත්ත. නමුත් පිංවත් ඔබ තරගයට පරිසරය දෙදරුම් කවමින් පුපුරායන රතිඤ්ඤා හඬින් මොනතරම් ඔබට නොපෙනෙන අමනුෂ්‍යයන් මියයනවා ඇත්ද? කොතෙක් ඔබට නොපෙනෙන අමනුෂ්‍යයන් තුවාල ලබනවා ඇත්ද? මෙම ප්‍රේත, භූත අමනුෂ්‍යයින් මේ රාත්‍රියේ අත්විඳින්නා වූ පීඩනය නිසා ඔවුනගේ සිත තුළ සකසේවන්නා වූ වෛරය, ක්‍රෝධය නව වසරේ අසුබ තුටු පඩුරක් සේ ලෝකයාට ලැබෙනවා. ගස්වල වැඩසිටින රුක්දෙවිවරු භුම්මාටු දෙවිවරු වැනි කොටස් මේ බිහිසුණු රතිඤ්ඤා හඬින් මොනතරම්කම්පාවෙනවාඇත්ද. ඒ දෙවිවරුන්ගේ සිත තුළත් ද්වේශය, වෛරය, ක්‍රෝධය සකසේවනවා. මේ ද්වේශයත් නව වසරක් උදාවෙද්දී ඔබ ලබන අසුබ තුටු පඩුරක්මයි. එම රාත්‍රියේදී රතිඤ්ඤා හඬට බියෙන් දුවන තිරිසන් සතුන් කොතෙක් නම් සිටිනවාද? මරබයෙන් ගැහෙමින් සැඟවෙන්න දිවයන ඒ සිත් තුළ ද්වේශය, වෛරය සකසේවනවා. මේ ද්වේශයත් නව වසරේ ලෝකයා ලබන අසුබ තුටු පඩුරක්මයි. රතිඤ්ඤා කරලක් පුපුරා යනකොට එම හඬට, ගින්දරට පිළිස්සී දෙදරුම් කෑමට ශරීරය පුපුරා

ගොස් මොනතරම් කුඩා කෘමි සතුන් මියයනවා ඇතිද? මේ විනාශවන සතුන්ගේ සිතේ සකසේවන ද්වේශයත් නව වසරේ ඔබ ලබන අසුබ තුටු පඩුරක්මය.

ගස්වල, කැදැලිවල ජීවත්වෙන කුරුල්ලන්, කුඩා පැටවුන්, මෝරන බිත්තර මොනතරම් විනාශවෙලා යනවා ඇතිද? ඔය දෙදරුම් කැමෙ හඬට. එම කුරුල්ලන් බියට පත්වී අන් සතුන්ගේ ගොදුරු බවට පත්වෙනවා ඇතිද? මේ සතුන්ගේ සිත් තුළ සකස්වනද්වේශයද නව වසර උදාවේදී ඔබ ලබන අසුබ තුටු පඩුරක්මය. ඉහත කොටස් අසහනයට, අපහසුතාවට, මරණයට, මරණීය වේදනාවන්ට, හිංසාවට පත්වීමෙන් සකස්වන්නා වූ අකුසල් කන්ද කරගසාගෙන තමයි නව වසරක් උදාවෙන්නේ. මේ අමානුෂික ෙ€දවාවකය පිංවත් ඔබට නොපෙනෙන්නේ අවිද්‍යාවේ හඬ බලවත් වීම නිසාය. පිංවත් ඔබට මාර සිතක් ඇතිවෙන්න පුළුවන්, රතිඤ්ඤ පත්තුකළාම සතුන්ව මරාදැමීමේ, හිංසාකිරීමේ ෙචතනාවක් ඔබ තුළ නැතිය කියලා. ඒ සිතිවිල්ල නිවැරදි වෙන්න පුළුවන්. නමුත් මියයන, තුවාල ලබන, හිංසනයට පත්වෙන, එම සත්වයන්ගේ සිතේ නැගෙන ද්වේශය, වෛරය, කේරෝධය සුබ පිරිත් දේශනාවක් සේ නොව, අසුබ වියරු අඳෝනාවක් සේ වායු ගෝලයට එකතු වනවා  නියතය. බියෙන්, වෛරී ෙචතනාවන් සකස් කොටගෙන මියයන අමනුෂ්‍යයන්, තිරිසන් සතුන් වඩාත් නපුරු වියරු අමනුෂ්‍යයන් බවට පත්ව නැවත උපත ලබා, තමන්ගේ පෙර ජීවිතයේ විනාශයට හේතුවූ රතිඤ්ඤපත්තු කළ මනුෂ්‍යයන්ගෙන් පළිගැනීමේ සිත් සකසේකාට ගැනීමේ ස්වභාවයද පිංවත් ඔබ තේරුම් ගත යුතුය. සමාජය දිනෙන් දිනම වෛරය, කේරෝධය, ද්වේශය වැඩෙන දිශාවටමද මනුෂ්‍යයා වියරු ස්වභාවයටම පත්වීමටද හේතු ඉහත කාරණා තුළද සැඟව තිබීමට පුළුවන. මේ සිද්ධීන් දෙස බැලීමේදී ඔබට වැටහෙනවාද අවිද්‍යා සහගත ක්‍රියාවන් ඔබව මොනතරම් විනාශය කරා දුක කරා රැගෙන යනවාද කියලා.

පන්සලේ සන්ධ්‍යාරය නාද කරනකොට, හේවිසියක හඬ ඇසෙනකොට, මහුල් බෙර හඬ ඇසෙනකොට මොනතරම් සංහිඳීමක්, සංයමයක් එම හෙŒ තිබෙනවාද. එම හඬින් ඉහතින් දැක්වූ විනාශයන්, අකුසලයන් සිදු වෙනවාද? කුඩා කිරි දරුවෙක් නම් පීඩා විඳින්න පුළුවන්. පිංවත් ඔබට ශබ්ද පූජාවක් කිරීමට අවශ්‍ය නම් පමණක් 31 දා මධ්‍යම රාත්‍රියට පන්සලේ සන්ධ්‍යාරය නාද කරන්න ගමටම ඇසෙන්නට. මහුල් බෙරයක් නාද කරන්න. මෙය සමාජයට නුහුරු දෙයක් බව ඇත්ත. එහෙත් ඔබ තුළින් නරකක් වරදක් නම් වෙනත් සත්වයකුට සිද්ධවෙන්නේ නැහැ. දෙවියන් අමනුෂ්‍යයන් පවා මේ හඬට ප්‍රිය වෙනවා. තිරිසන් සතුන් පවා මේ හඬ විඳිනවා. හැමෝගෙම ආශිර්වාදයෙන් තමයි වසරක් උදාවෙන්නේ. සශ්‍රීක දිව්‍යතල වල සිටින දෙවියන් පවා ඔබට ආශිර්වාද කරනවා. කාටද මේ ආශිර්වාද කරන්නේ? ශීලයට. පිංවත් ඔබ ශීලයෙන් හික්මුන නිසයි, රතිඤ්ඤ පත්තු කිරීමෙන් සත්ව ඝාතන, සත්ව හිංසා සිදුවෙනවාය කියන යථාර්ථය දැකේක්. ශිල්පද ආරක්‍ෂා කරන්න උත්සාහ ගත් නිසයි ඔබ එම වැරදි ක්‍රියවෙන් වැළකුනේ. ශීලයට වටිනාකමක් දෙමින් තමයි එතකොට ඔබ නව වසර අරඹන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ නිසයි ඔබ සත්ව හිංසාවෙන් වැළකුනේ. ශීලයට වටිනාකමක් දෙනවිටම ඔබ තෙරුවන් සරණේ පිහිටලා. රතිඤ්ඤ පත්තු කිරීමෙන් සතුනට මරණීය දුක, හිංසනය සිදුවෙනවාය, මම එම සතුනට අභය දානය දෙනවාය කියලා හිතනකොටම ඔබ තුළ කුසල් ෙචතනාවක් සකස් වෙලා. නව වසර පිංවත් ඔබ අරඹන්නේ සතර අපායෙන් මිදීමේ සාධක සියල්ලම දෝතින් දරාගෙනමයි. පුංචි දෙයකින්, මොන තරම් නම් වෙනසක් සිදුකරන්න පුළුවන්ද. මේ පුංචි දෙය වෙනස් කර ගැනීමට නොහැකිවීමෙන්, ඔබ සසර මොනතරම් නම් දුර ගමනකට වැටෙන්න ඉඩ තිබෙනවාද.

(මෙහි පළවන්නේ ඉකුත් වසරේ ජනවාරි මස පළමුවැනිදා මෙමස්වාමීන්වහන්සේ විසින් ලියන ලද ලිපියකි. අද ඔබ අතට පත්වන්නේ එම ලිපියේ පළමු අර්ධයයි. එහි අනෙක් අර්ධය ලබන සතියේ බලාපොරොත්තුවන්න)

බුදු සිතක උපදිනා සිතිවිල්ලක්
ඔබේ සිත තුළත් උපදවාගන්න
නව වසරට ධාර්මික ප්‍රවේශයක් සඳහා කෙරෙන ආරාධනයII

අතහැරීම 14 කොටස

ඉකුත් කොටසින් සඳහන් කළේ දෙසැම්බර්31 දා රාත්‍රියේ නගරයේ මෙන්ම ගමේත් ඇසට පෙනෙන, කනට ඇසෙන පැත්ත. සාමාන්‍ය ස්වභාවය. මීට වඩා වෙනස් ස්වභාවයකුත් වර්තමාන සමාජය තුළ වර්ධනය වෙනවා. හෝටල්වල පෞද්ගලිකව වෙන්කරගත් ස්ථානවල නව වසර උදාව සමරන අයට අවුරුදු උදාවෙන්නේ අඳුරේ. ප්‍රඥාවේ ආලෝකයක් මේ අයට කොහොමටවත් නැහැ. ජල විදුලියේදී තාප බලාගාරයේ ආලෝකය පමණයි තිබෙන්නේ. එම ආලෝකයත් නිවා දමා, අඳුරේ තමයි අවුරුදු උදාවට අවතීර්ණ වෙන්නේ. ඒකෙන්ම පෙනෙනවා අවිද්‍යා සහගත සිත, ආලෝකයට ඇති අකමැත්ත, ආලෝකය නිවාදමා අඳුරට කැමතිවන්නේ අනුශය වශයෙන් ඉතිරිවෙලා තිබෙන හිරි ඔතප් දෙකත් ඒ රාත්‍රියේ නැති කරගන්න. හිරි ඔතප් දෙක නැතිවුණ තැන තවත් නැතිවෙන්න දෙයක් තිබෙනවාද?

වසරක ආරම්භය මේ අය විසින් පටන්ගන්නේ ශීලයට සෘණාත්මක අගයක් දෙමින්. ශීලයෙන් ගිළිහුණ ජීවිතයක ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන් සරුසාර ලෙස වැඩෙනවා. මෙවන් සිත්වලින් ලබන්නාවූ වසරට කුමන ආධ්‍යාත්මික ශාන්තියක්ද? භෞතික දියුණුවක් නම් සැලසේවි. ඒ බව සමාජයෙන් හොඳින් පෙනෙනවා සැකයකින් තොරවම. එහෙත් එය සතුටු වියහැකි කාරණයක් නම් නොවේ.

පරලොව යහපත ගැන බලනකොට ලබන්නාවූ වසරේ අවම වශයෙන් පංච ශීලයවත් රැකගැනීමට අධිෂ්ඨානයක් ඇතිකර නොගන්නා තැනැත්තා තමා තමාටවත් උපකාරයක් කර නොගත් තැනැත්තෙක් වෙනවා. ඔහු කෙසේ අනුනට උපකාර කරන්නද? කෙසේ නම් අනුනට ආශීර්වාද කරන්නද? ඔහු කෙසේ නම් ධර්මයේ අර්ථයක් අත්දකින්නද? ධර්මයේ අර්ථයන් අත්නොදකින තැනැත්තා රාත්‍රී12 ට අවදි වී සිටියත් මෙලොව පරලොව දෙකේ එම ඔහු ප්‍රමාදීභාවයට පත්වෙනවා. මේ අයෝනිසෝ මනසිකාරයෙන් යුතුව ඔබ සිදුකරන්නා වූ ක්‍රියාවන් නිසා ඔබට පැහැදිලිව, විවරව තිබෙන ධර්ම මාර්ගය ඔබ විසින්ම වසාගන්නවා. ඔබ මේ ජීවිතයේ සශ්‍රීකභාවය ලබන්න, පෙර ජීවිතයේදී මොනතරම් දානමය, ශීලමය පිංකම් සිදුකරගෙන තිබෙන්න ඕනෙද? අතීත භවයන්හීදී මනුෂ්‍ය ජීවිතවල ඉපදී සිදුකරගත් කුසල් විපාකවල සැපය මේ ජීවිතයේදී අත්විඳිනකොට ඔබ ඒසශ්‍රීකභාවය, මහේශාක්‍යභාවය, සෞභාග්‍යමත් ජීවිතය අත්විඳින්නේ පිංවත් ඔබට අතීතයේ උපකාරවූ දානයට, ශීලයට මේ ජීවිතයේද සෘණාත්මක අගයක් ලබාදෙමින් නේද? මේ සෘණාත්මක බව නේද වර්තමාන සමාජයේ ඇසෙන අවිද්‍යාවේ කන්බිහිරි කරවන හඬ, ශීලයමයි පිංවත් ඔබට උපකාර වූයේ මේ උතුම් මනුෂ්‍ය ජීවිතය ලබන්නට. දානයමයි ඔබට උපකාර වූයේ මේ උතුම් මනුෂ්‍ය ජීවිතයේ ආයුෂ, වර්ණ, සැපය, බලය ලබන්නට. ඒ නිසා කෘතවේදීව පිංවත් ඔබ සත්පුරුෂභාවයෙන් යුතුව ඔබට උපකාරවූ ධර්මතාවයන් ගරුකරන්න. ඒවාම ජීවිතයේ වටිනාකම් බවට පත්කරගන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, කර්මය කර්මඵල පිළිබඳ විශ්වාසයෙන් පිංවත් ඔබ ශීලමය, දානමය පිංකම් උදාවෙන සෑම නව වසරකම ඔබට මුණගැසෙන කල්‍යාණ මිත්‍රයා කරගන්න. ඔබට සුබපතන හිතවතා කරගන්න. ඒ කල්‍යාණ මිත්‍රයා ඔබට සුබ පැතුවොත් පමණක්මයි ඔබ

ලැබූ උතුම් මනුෂ්‍ය ජීවිතය සුබ ජීවිතයක් වෙන්නේ. ලැබුවා වූ නව වසර සුබ වසරක් වෙන්නේ.

මේ කල්‍යාණ මිත්‍රයා ඔබ තුළමයි සැඟවී සිටින්නෙ. මොහු සැඟවී සිටින්නේ ලෝභ, ද්වේෂ, මෝහ නැමැති මාර ධර්මයන්ට බියෙන. එසේත් නැතිනම් මාර ධර්මයන් කෙරෙහි ඇතිකරගත් ඡන්දරාගය නිසා ඔබට සැඟවෙමින්. පිංවත් ඔබ දක්ෂවෙන්න ඕනේ මේ බියෙන් ඔබෙ කල්‍යාණමිත්‍රයා මුදවාගන්න. ඉස්මතු කොටගන්න. එය කරන්න පුළුවන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, කර්මය, කර්මඵල පිළිබඳ විශ්වාසය ඔබ තුළ ඇතිකර ගැනීම තුළින්. මේ කාරණා දෙකේ අර්ථයෙන් ඔබ සන්නද්ධ වෙනකොට ඔබෙකල්‍යාණ මිත්‍රයාශක්තිමත් භාවයෙන් නැඟීසිටිනවා. ඔබව කුසල් මාවතට යොමුකරනවා. සතර අපායෙන් මිදීමේ මාවතට ඔබව යොමුකරනවා. භික්ෂුව මේ දේවල් සටහන් කළත් මේවාඅර්ථවත්ව ක්‍රියාත්මකවීම බොහොම දුර්වලයි. ඒ නිසා ඔබ අනුන් ගැන සිතන්න එපා. ඔබ තනි තනිව ඉහත සටහන ජීවිතයට ගළපාගන්න. ලෝකය, ලෝකයේ ස්වභාවයෙන් පවතීවි. පිංවත් ඔබ ලෝකයෙන් මිදීමේ ස්වභාවයට එන්න. ලෝකයෙන් මිදීමේ ස්වභාවයට සැමවිට තිබෙන්නේ අඩු පෝලිම බව ඔබ සිතන්න ඕනේ. සෙනඟ වැඩි, පිරිස වැඩි පෝලිම හැමදාමත් ලෝකයේ පැවතීම දෙසටයි තිබෙන්නේ. ඒ කියන්නේ දුක දෙසට, මාරයාගේ ලෝකයේ ව්‍යවහාර මුදල් තමයි දුක, සමාජය අලුත් වටිනාකම් හැටියට සොයාගන්නා, ක්‍රියාත්මක කරන දේවල අවසාන ප්‍රතිඵලය දුකයි. ඇයි පිංවත් ඔබට බැරි ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සිතේ ඇතිවූ සිතිවිල්ලක් ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක, ජීවිතයේ සුබ අවස්ථාවක ඔබේ සිතුවිල්ලක් කරගන්න. ඇයි ඔබට බැරි අතීතයේ වැඩසිටියාවූ රහතන්වහන්සේ නමකගේ සිතෙහි ඇතිවූ සිතිවිල්ලක් ඔබේ සිතිවිල්ලක් කරගන්න. එවන් උත්තමයකුගේ සිතෙහි ඇතිවූ සිතිවිල්ලක් අපිට සිතන්න බැහැයි කියමුකෝ. එහෙමනම් ගිහි ජීවිත ගතකළ අනේපිඬු සිටුතුමන්, විශාඛාව වැනි ධර්මයෙන් ජීවිතය ජයගත් පිංවතුන්ගේ සිතෙහි ඇතිවූ සිතිවිල්ලක් ඔබ ඔබෙ සිතිවිල්ලක් කරගන්න. එහෙම සිතනකොට මොනතරම් සැනසිල්ලක්ද ජීවිතයට. මෙවැනි ශ්‍රද්ධාවෙන් සකසේවන සිතිවිල්ලකට පුළුවන් ඔබට අප්‍රමාණ සැපයක් මෙලොව පරලොව වශයෙන් ලබාදෙන්න. පිංවත් ඔබ දෙසැම්බර් 31 රාත්‍රියේ රතිඤ්ඤවක් පත්තුකරලා ඔබම එහි පිපිරුමට බියෙන් ඈතට දුවනවා. නැතිනම් රතිඤ්ඤ කරල ඈතට විසිකරනවා.

රතිඤ්ඤව පත්තුවෙනකොට එහි පිපිරුම් හඬට බියෙන් ඔබම ඔබෙ කන්දෙක වසාගන්නවා. ඒ කියන්නේ ඔබම එම ක්‍රියාවෙන් පීඩාවට පත්වෙනවා. ඔබ පීඩාවට පත්වෙමින් අන්‍ය සත්වයින්වත් පීඩාවට පත්කරනවා. අවසානයේදී එකම රාත්‍රියේදී සියල්ලෝම පීඩාවට පත්වෙලා. රතිඤ්ඤව පත්තුකරන කෙනා තුළ සතුටක් ඇතිවෙනවා තමයි. එම සතුටත් කාමච්ඡන්දයන් ගණයටයි වැටෙන්නේ. කාමච්ඡන්දයන් කියලා කිව්වේ පංචනීවරණයෙන් එක ධර්මතාවයක් මාරයා විසින් සත්වයා සතර අපායෙන් එතෙරවීම වැළැක්වීම සඳහා දමන මරතොණ්ඩුව තමයි කාමච්ඡන්දය කියන්නේ. නව වසරක උදාවට පිංවතුන්ලා නොදැනුවත්භාවය නිසාම මාරයාගේ මරතොණ්ඩුවක් සියතින්ම ගෙලට දමාගෙන.

තෙරුවන් සරණ ගිය පිංවත් ඔබ ජීවිතයේ සෑම විශේෂ අවස්ථාවකදීම ජීවිතය පටන්ගන්න ඕනේ තෙරුවන් ගුණය කෙරෙහි හිත පිහිටුවලා. ශීලයේ අර්ථයෙහි සිත පිහිටුවලා. එතැනයි ඔබේ ජයග්‍රාහී ගමනක ඇරඹුම. ආගන්තුකව පැමිණෙන වටිනාකම් ඉදිරියේ පිංවත් ඔබට ඔබෙ බෞද්ධකම අමතක වෙනවා. "සතිය සිහිය අඩුයි" තරගයට වැටීමටයි කැමති, තරගයෙන් මිදීමට කැමති නැහැ. තරගයට වැටුණු කෙනාට ජය පරාජය දෙකෙන් එකක් උරුමයි. තරගයෙන් මිදුන

කෙනා මේ දෙකෙන්ම මිදීමේ මාර්ගයටයි අවතීර්ණවෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සත්වයා නිරතුරුවම යෝනිසෝ මනසිකාරය නැතිවීම හේතුවෙන් භවආශ්‍රවයන් වැඩෙන දිශාවටයි ගමන්කරන්නේ කියලා අන්‍යයන්ටත්, තමන්ටත් පීඩාගෙනදෙන නොකළයුතු දෙය, දුරුකළයුතු දෙය, මගහැර යායුතු දෙයින් මිදෙන්නට වීර්යය නොමැතිනම් භෞතික වශයෙන් ඔහු කොතෙක් දියුණු වුවද අඥාණවත් පෘථග්ජනභාවයේ පරාජයමයි ඔහුට හිමිවන්නේ. නොවටිනා සැපයක් උදෙසා ඔහු වටිනා අර්ථයක් අහිමිකරගන්නවා. රතිඤ්ඤවක ආලෝකයට, හඬට මුලාවී එය විඳීමට යාමෙන් රැස්වන අකුසල් හේතුවෙන්, නිරයේ දිලිසෙන ගිනි ජාලාවකට වැටුණහොත් කවදා කෙළෙස නම් ගොඩඑන්නද? එදාට ඔබේ කඳුළු පිසදැමීමට, දුක නැතිකිරීමට කිසිවෙක් නොමැත. රතිඤ්ඤවකට ඔබේ ඇඟිල්ලක් පිළිස්සුණොත් ඔබ මොනතරම් වේදනාවක් විඳිනවාද? එහෙමනම් නිරයේ ගිනිජාලා තුළ සත්වයා විඳින වේදනාව ඔබම සිහිකොට ගන්න. මෙම දුක ඔබට මට නුහුරු දෙයක් නොවේ. ඒ සංසාරික පුරුද්ද නිසා තමයි අපි තවමත් ගින්දරට, අඳුරට කැමති. දක්‍ෂයා ගින්දරත්, අඳුරත් නිවැරදිව හඳුනාගෙන, ගින්දරත් අඳුරත් උරුම සතර අපායෙන් මිදීමේ මාවතටයි ගමන්කරන්නේ. පිංවත් ඔබ ජීවිතයේ සෑම සිහිකටයුතු අවස්ථාවකදීම සිල්පදයක් රැකීමෙන් ලබන අප්‍රමාදීභාවය ජීවිතයට ලබාදෙන්න. දානයක් පූජාකර ගැනීමෙන් ඔබ ලබන නිර්ලෝභී සතුටම ජීවිතයට ලබාදෙන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ඔබ ඇතිකරගන්නා ආත්ම විශ්වාසයම ඔබේ ජීවිතයට ලබාදෙන්න. මීට විරුද්ධ මාර්ගයේ ගමන් කොට ඔබ ඔබෙන් පළිගන්න එපා. පෙර ජීවිතවලදී ඔබ ඔබේම ශක්තියෙන් ගොඩනගාගත් කුසල් ශක්තිය අකුසලයේ දූකින් යටපත් වෙන්න දෙන්න එපා.

වසරක් උදාවෙන්නේ වසරක අවසානයද, මරණයද දෝතින් දරාගෙනය. නමුත් මරණය නොදකින ඔබ වසරේ ආරම්භයප්‍රීතියෙන් සමරයි. ඉපදී දින 365 කින් මැරෙන අවුරුද්දක ආරම්භය උදෙසා භවයට යන අකුසල් රැස්කර ගැනීමට ගැන අපි අවධානය යොමුකළ යුතුය. වසරක උදාව ළංවෙනකොට සමාජය හුඟක් කතාකරන්නේත්, ජනතාව දැනුවත් කරන්නේත් අනතුරු හඟවන්නේත් ආරක්‍ෂාකාරී ලෙස රතිඤ්ඤ පත්තුකරන ලෙසය. මෙහිදී ආරක්‍ෂාව යනු ශරීරයට ගිනි අනතුරුවලින් වළක්වා ගැනීමේ ආරක්‍ෂාවයි. අතපය පිළිස්සුන හොත් එය සතියකින්, මාසයකින් සනීපවේවි. එහෙත් මෙහි අකුසල් ස්වභාවයන් ගැන අවධානය යොමු නොකර නැවත නැවත එම ක්‍රියාවන් කිරීමෙන් මරණින් මතු නිරයේ ගිනි ජාලාවකට වැටුණහොත් කල්ප ගණන් එම දුක ඔබට විඳීමට සිදුවනු ඇත.

පිංවත් ඔබ වසරක් උදාවෙන මොහොතේපන්සලේ, නිවසේ, බුදුකුටියේ පහන් ආලෝකයදල්වා දස දිසාවටම මෛත්‍රිය පතුරවමින් පෙනෙන නොපෙනෙන සියලු සත්වයින්ට මෛත්‍රිය කොට වසර ආරම්භකරන්න. එවිට දෙවියන් අමනුෂ්‍යයින් පවා ඔබට ප්‍රිය වේවි. එය ඔබට මෙලොව පරලොව දෙකටම යහපත පිණිස වේවි. අත් පිළිස්සෙන්නේ වත්, ඇස් අන්ධවන්නේ වත්, අපාගතවෙයි කියලාවත් බියක් ඇතිවෙන්නේ නැහැ. සම්බුදු වදනක් ක්‍රියාත්මක කළාය කියන ආත්ම තෘප්තියමයි ඇතිවන්නේ. එම ආත්මතෘප්තිය, සතර අපායෙන් ඔබබට ඔබව ඔසවා තැබීමට වසර පුරාවට ඔබට මාර්ගය පෙන්වාදේවි. අපිට කියන්න පුළුවන්ද ලෝකය පුරාවට ඇතිවෙමින් පවතින දේශගුණික විපර්යාසයන් හේතුවෙන් අපේ ජීවිත කුමන මොහොතක විනාශවී යයිද කියලා. ඒ අවදානම ජයගැනීම උදෙසායි ඔබ ක්‍රියාකළ යුත්තේ. ඔබ නිරතුරුවම, ජීවත්වීමයි අභියෝගයක් හැටියට දකින්නේ. ඔබ අභියෝගයක් හැටියට දැකිය යුත්තේ උපතයි. මේ අභියෝගයෙන් මිදෙන්නඋත්සහගන්නා පිංවතා උපරිම වශයෙන් ජීවිත හතකට එය සීමාකර

ගන්නවා. මෙන්න මේ ජයග්‍රහණය අත්කරගත් පුද්ගලයායි"ජීවිතය ජයගත්තා"ය කියන තැනැත්තා. එතැතින් මෙහා ජීවිතයක මොන ජයක්ද?

සමාජය මනින මිනුම් දඬුවලින්, සමාජ වටිනාකම්වලින් ජීවිතය ජයගත්තාය කියන සමහරක් නායකයින්. ප්‍රභූ පුද්ගලයින් ගැන ඔබ සිහි නුවනින් බලන්නකෝ. පිංවත් එම පිරිස් වෘත්තියෙන්, ව්‍යාපාරයෙන්, දැනුමෙන්, වත්පොහොසත් කම්වලින් ජයගන්න බව ඇත්ත. ඒත් ඒ ජය ඔවුන් ලබාගන්නේ ශ්‍රද්ධාව, ශීලය යන ධර්මයන් උගසට තියලා. ඊළඟ ජීවිතයේදී මේ අයට ලැබුවා වූ මහේශාක්‍යභාවය නැමැති මුදලත්, ඊට අදාළ පොලියත් දෙකම ගෙවන්න වෙනවා. පෙර මනුෂ්‍ය ජීවිතවල ඉපැදිලා, ශ්‍රද්ධාවත් ශීලයත් උගසට තබා ජීවිත ජයගන්න අය තමයි ඔය ප්‍රේත, තිරිසන් නිරයේ උපත ලබා දුක නැමැති මුදලත්, පොළියත් දෙකම සිය කැමැත්තෙන්ම ගෙවමින් ඉන්නේ. ඔබේ ඔය ඇස් ඉදිරිපිටම ඉන්න තිරිසන් සතුන් කියන්නේ පෙර ජීවිතවල හොඳ හොඳ මනුෂ්‍යයෝම තමයි. හොඳට හම්බකරලා, දේපළ රුස්කරලා, පංචකාම සම්පත් රිසිසේ භුක්තිවිඳලා. ශ්‍රද්ධාව ශීලය දානය කියන දුකින් මිදෙන දිශාවට ඔබට පිහිටවෙන ධර්මයන් අමතකකරපු මනුෂ්‍යයෝ. මෙන්න මේ ගැන සිතන කෙනායි සසර බිය ඇතිකර ගන්නේ. බහු මතවාද, දෘෂ්ඨි, විචිකිච්ඡාව සකස්කර ගන්නේ නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ මාර්ගයටම අවතීර්ණ වෙනවා. සමාජයේ ගුරුවරුන් අප්‍රමාණව සිටිනවා. අප්‍රමාණ පතපොත තිබෙනවා. මේවා ලෝකයේ පැවතිය යුතු ස්වභාවයන්. විවිධත්වය කියන්නේ අනිත්‍යයයි.

අනිත්‍යය තිබෙන්නේ ගැටෙන්න නොවේ. මගහැරයන්න නොවේ. අවබෝධකොට ගැනීමටයි. පිංවත් ඔබට අවබෝධය කරායැමට පහසුම මාර්ගය ලොව්තුරා බුදුරජාණන්වහන්සේ තමාගේ එකම ගුරුවරයා බවට පත්කොට ගැනීමයි. උන්වහන්සේම දේශනාකොට වදාළ සූත්‍ර, විනය, ධර්මයන්ම පතපොත කරගැනීමයි. අතීතයේ වැඩසිටියාවූ උතුම් රහතන්වහන්සේලාගේම, අර්හත් භික්ෂුන්වහන්සේලාගේම, මාර්ගඵලලාභී උපාසක උපාසිකාවන්ගේම ජීවිත පරමාදර්ශී කොටගෙන ජීවිතය සකස්කර ගැනීමයි. ඉහත කාරණාවමයි මුල්වෙන්නේ. මුල වරද්දවා ගතහොත්, මැද අග දෘෂ්ඨි කාන්තාරවල අතරමං වෙන්න පුළුවන්. බුද්ධෝත්පාද කාලයක අවසාන හෝරා කිහිපයේ ජීවත් වන ඔබතර්ක විතර්ක කරමින්, හරි වැරදි සොයමින් තව තවත් සක්කාය දෘෂ්ඨිය වැඩෙන දිශාවට යැම නොවේ කළ යුත්තේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේසම්මා සම්බුද්ධ ඥානයෙන් මේ සංකීර්ණවූ ලෝකය ඉතාමත් සරල කොට දේශනා කර තිබෙන ධර්ම මාර්ගයේම ගමන් කිරීමය. ඔබේ ජීවිතයේ එළඹෙන සෑම වැදගත් අවස්ථාවකදීම බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, ශීලානුස්සතිය, ත්‍යාගානුස්සතිය, දේවතානුස්සතිය, කියන මහානාම ශාක්‍යකුමරුන් උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළධර්මය සිහිපත්කර ගන්නවා නම්, ඒ අනුව ජීවත්වෙනවා නම්, සක්කායදිට්ඨිය හීනවෙන දිශාවට ඉහත ධර්මයන් ජීවිතයට එකතුකර ගැනීමට ඔබ දක්ෂ නම් භව ගමනේ උපදීම ජීවිත7 ක් තුළදී බව නිරෝධය සාක්ෂාත් කරගැනීමටත්, එතෙක් ආයුෂ, වර්ණ, සැප, බලයෙන් සශ්‍රීක මාර්ගඵලලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් ලෙස දිව්‍ය අසිරිය අත්විඳීමට ඔබට හැකිවනු ඇත. මේ සහතිකය ඔබට ලබාදෙන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේමය. භව ගමනින් දුකම උරුම කොටගෙන සක්කායදිය§ටියේ කුණු හැව, මමත්වයේ දැඩිභාවය, නාමරූප ධර්මයන්ගේ අනිත්‍යභාවය දකිමින්ම මෙනෙහි කරමින්ම, ගලවාදමන්න.

අතහැරීමම පුරුදුකරමින්, හැකිතාක් දන්දෙමින් ඊට ශක්තිය ලබාගන්න. එළඹෙන (ඊළඟ)

දෙසැම්බර් 31 රාත්‍රිය සතර අපා දුකෙන් මිදෙන අවිහිංසාවේ රාත්‍රියක් කරගන්න. මාර පුතෙක් දුවෙක් නොවී සම්බුදු ඇකයට පියනගන පුතෙක් දුවෙක් වෙන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේත්, ධර්මයේත් ශක්තිය පිංවත් ඔබට යායුතු ඉදිරි මඟ පිළිබඳ සතිය සිහිය පිංවත් ඔබ තුළින්ම මතු කරදෙනු ඇත. එම සතිය සිහිය විසින්ම ඔබට භව දුකම උරුමකොට දෙන සක්කායදිට්ඨිය, විචිකිච්ඡා, ශීලබ්බතපරාමාස කියන බිහිසුණු රතිඤ්ඤවන් පුසේවඩිල්ලක් බවට ඔබ තුළින්ම පත්කරනු ඇත. මේ වන විටත් පිංවත් ඔබ සතර අපායෙන් මිදී ඇතැයි ඔබ තුළ විශ්වාසයක් ඇතොත් එම විශ්වාසය සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, ශීලබ්බතපරාමාස කියන ධර්මතාවයන් සමඟ නැවත නැවත ගළපා බලන්න. ඔබ නිහතමානී වෙන්න. එම නිහතමානීභාවය යනු ඔබ විසින් ඔබ උදෙසාම ඇතිකරගන්නා කළ්‍යාණ මිත්‍රභාවයකි, අතීතයේ සැම බුද්ධෝත්පාද කාලයකදීම අපට වැරදුණු එකම තැන ඔතන බව මෙනෙහි කරන්න. "මම" දෙවැනි තැනට දමා, බුදුරජාණන්වහනසේ දේශනාකොට වදාළධර්ම මාර්ගයම මුල් තැනට ගන්න. එවිට "මම" ධර්මයේ හිමිකරු, අයිතිකරු කියන මමත්වයේ දැඩිභාවයේ නොව, මමද ධර්මයේම කොටසක්ය යන නිහතමානීභාවය ඔබ තුළ ඇතිවනු ඇත. සාරිපුත්ත මහෝත්තමයන්වහන්සේ වරක් සිංහනාදයක් කරනවා"මම හරියට හරක් රැළක සිටින අඟ කැඩිච්චි ගොනෙක් වගෙයි" කියලා. ඒ කියන්නේ අඟ කැඩිච්චි ගොනා සැමවිටම රැලේ පැත්තකට වෙලා සිටින්නේ. නායකයා වෙන්න, පළමුවැනියා වෙන්න එන්නේ නැහැ. සිංහසෙයිවෙන් සිංහනාද කරන්න පුළුවන් නිහතමානීභාවය ජීවිතය තුළින් ඇතිකරගත් උත්තමයාටමය. මේ යථාර්ථය සමග ඔබේ ජීවිතය හොඳින් ගළපා බලන්න. එයම පිංවත් ඔබේ ජීවිතයට කමටහනක් වේවි මග නොමග වටහා ගැනීමට.

දෙවියන්ද වඳින පින් බිමයි මේ.....
2012 විනාශයක් ගැන (සත්පුරුෂ) ඔබ බියවිය යුතු නැත

විශේෂ ලිපියකි.

භික්ෂුව මේ මොහොතේ වැඩ සිටින කුටියට පැමිණිආගන්තුක වැඩිහිටි ස්වාමීන්වහන්සේ නමක් ප්‍රකාශ කළා වසර 2012 දී ලෝකයේ සිදුවනයම් අසහනකාරීතත්ත්වයක්සම්බන්ධයෙන් ලෝකයා කතාබහ කරන බව. පිංවත් උන්වහන්සේද ඒ ගැන රටේ ලෝකේ කතාකරන මතවාද කිහිපයක්ම ප්‍රකාශ කළා. භික්ෂුවට මේ ගැන කිසිදු දැනීමක් නැහැ. ඔය වගේ කිහිපදෙනෙක් කියපු දේවල් අසා තිබෙනවා පමණයි. මේ සිද්ධිය මෙතැනින් අහවර වුණා. එය හුදෙක් පිළිසඳරක් පමණක් වුණා. එක්තරා භික්ෂුවක් ඉහත සිතිවිල්ල සිතමින් සිට අරමුණු වලින් බැහැරව හුදෙකලා කුටියේ සමාධිමත්ව වැඩසිටින විට භික්ෂුවට ඇසෙනවා'

අප ශ්‍රී ලංකා මාතා... නමෝ නමෝ නමෝ නමෝ මාතා... ශ්‍රී ලංකා ජාතික ගීය (සම්පූර්ණයෙන්ම)

මෙය ගැයෙන්නේ පිරිමි සහ කාන්තා කටහඬින්. භික්ෂුව අරමුණු නොකරම, මේ ඇසෙන්නේ දිව්‍ය ශෝරාත හඬ. ඒ කියන්නේ දෙවියන්ගේ හඬ.

එම ගීතයේ හඬ සමග සංගීත රාවය එකදිගට භික්ෂුවට ඇසෙන්නට පටන්ගත්තා. වේලාව අලුයම 1 ට පමණ ඇති. වනගත මුළු ප්‍රදේශයම දැඩි නිහඬතාවක තිබුණා. භික්ෂුවට දැනුණේ භික්ෂුව මොහොතකට පෙර සිතමින් සිටි සිතිවිල්ල. 2012 වසර කෙරෙහි දෙවියන්ගේ ප්‍රතිචාරය තමයි දිව්‍ය ශෝරාත තුළින් ඇසෙන්නේ. භික්ෂුව ලැබූ මේ අත්දැකීම පිංවත් ඔබට මෙහි සටහන් කරන්නේ ලෝකයා සමඟ සසඳා බලනකොට පිංවත් ඔබ මොනතරම් වාසනාවන්තද කියලා ඔබට දැනගන්නයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සුගතිය වශයෙන් හඳුන්වන ලද සශ්‍රීක දිව්‍යතල වල දෙවියන් පවා මේ බෞද්ධ රටේ උතුම් පිංවතුන්ලා වෙනුවෙන් ආශීර්වාද කරනවා. ලක් මාතාවට යහපතක් වේවා, සුරක්ෂිත වේවා කියලා. පිංවත් ඔබ හොඳින් දැනගන්න ඕනේ සුගති භූමිවල වැඩසිටින මාර්ගඵල ලාභී නොවන සශ්‍රීක දෙවිවරුන්, දිව්‍යාංගනාවන් කියන්නේ කවුද කියලා. පායාසී කියන සූත්‍රයේදී කුමාර කාශ්‍යප මහරහතන් වහන්සේ දේශනා කරනවාසශ්‍රීක දිව්‍යතල වල වැඩසිටින දෙවියන් හැමවිටම මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයාට යොදුන් සියයක් ඈතින් ඉන්නේ කියලා. එම දෙවියන් මනුෂ්‍යයාට යොදුන් සියයක් ඈතින් ඉන්නේ මනුෂ්‍ය ගඳ දෙවියන්ට ඉවසන්නට බැරි නිසා. මෙතැනදී මනුෂ්‍යයාගේ ගඳ කියලා කියන්නේ මනුෂ්‍යයාගේ දහඩිය ගඳ නොවෙයි. මනුෂ්‍යයාගේ දුසිල්වත්භාවයේ ගඳ, අසත්පුරුෂභාවයේ දුගඳ, තෘෂ්ණාවේ අපුල දුගඳ ඉවසන්න, දරන්න දෙවියන්ට බැරි නිසයි දෙවියන් නිරතුරුවම මනුෂ්‍යයාට වඩා යොදුන් සියයක් ඈතින් වැඩසිටින්නේ. නමුත් ශීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් පිරිසිදු පිංවත් මනුෂ්‍යයන් ළඟට දෙවියන් එනවා. දෙවියන් එම පිංවතුන්ට ආශීර්වාද කරනවා. පිංවත් ඔබට, මට මනුෂ්‍ය ලෝකයේ සිටසශ්‍රීක දිව්‍යතල වලට ඇති දුර යොදුන් ලක්ෂ ගණනක් වුවදලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම්ධර්ම මාර්ගය තුළ එම දිව්‍ය තලවල හඬ ගෙදර තිබෙන ගුවන් විදුලියේ හඬ තරමටම අපට සමීපකොට දී තිබෙනවා. මේ සම්මා සම්බුදු ඥානයේ

උතුම් ආශ්චර්යයයි. සමාධියේ ආශ්චර්යයෙන් අත්දකින ලෝකය විදර්ශනාවේ අවබෝධයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දකිමින් ලෝකයෙන් මිදෙන මාර්ගයක් බෞද්ධ අපට උරුමකර දී තිබෙනවා.

මෙ ආශ්චර්යය දකිද්දී, ඇසෙද්දී, කියවද්දී තෙරුවන් කෙරෙහිමයි පිංවත් ඔබ ශ්‍රද්ධාව සකසේකාට ගතයුත්තේ. පිංවත් ඔබටත් මෙ සම්බුදු උණුසුම උරුමයි. මාර්ගය තුළ නිවැරැදිව ගමන්කළොත් මනුෂ්‍යයින්ට යොදුන් සියයක් ඇතින් වැඩසිටින දෙවියන්, දිව්‍යාංගනාවන් කියන්නේ අතීත මනුෂ්‍ය ජීවිත වල තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ, දානයේ, ශීලයේ ඵලයයි. මනුෂ්‍ය ලෝකයේ කුණුකසළ, අපුල, ගේ දොර ඉඩකඩම්, සැමියා, බිරිඳ, දූ දරුවන්, කීර්ති ප්‍රශංශා, නිලතල වලට ඇති ඡන්ද රාගයේ විෂ තාවකාලිකව මරාදැමූ උතුම් ශිල්වතුන්ගේ සුගති භූමියයි සග්රික දිව්‍ය තල කියන්නේ. මෙවන් සුගති භූමිවල වැඩසිටින දෙවියන් මෙ පුණ්‍යදීපයට සෞභාග්‍යයක් වේවා කියලා දිව්‍ය සංගීතයෙන් ආශිර්වාද කරනවා. බලන්න පිංවත් ඔබ නොදකින, පිංවත් ඔබ නොසිතන, කහවණු - ඩොලර්, රියාල් පසුපසේස් හඹායන බැංකු ගිණුමෙ ඉලක්කම් පේළිය වැඩිකරගැනීම උදෙසාම වෙහෙසෙන පිංවත් ඔබ අමතක කළා වූ මතකයක් දෙවියන්ට තිබෙනවා. දෙවිවරු දන්නවා තමන්ට මෙවන් අසිරිමත් දිව්‍ය සැපයක් ලබාගැනීමට උපකාර වූ සද්ධර්මය අවංකවම, විවෘතවම, තවමත් බබළන්නේ මේ ධර්මද්වීපයේය කියලා. නමුත් මෙ ධර්මද්වීපයේ උතුම් මනුෂ්‍යයින් හැටියට ඉපදිලා පිංවත් අපි මුදලට, කීර්තියට, දේපළට වැඳවැටෙමින් ඒවා මත්තේම අපේ උතුම් බෞද්ධකම දුර්වල කරගත්තත් ඒසග්රික දෙවියන් සද්ධර්මය හේතුවෙන් ලබාගත් ඒ සග්රීක දිව්‍යශ්‍රිය අත්විදිමින්ම ඒ සද්ධර්මය තවමත් බැබළෙන මෙ පිංබිමට, ශ්‍රී ලංකා මාතාවට '

නමෝ නමෝ මාතා' කියලා නමස්කාර කරනවා ගීතයෙන්. මෙ උතුම් රට රැකේවා, චිරාත් කාලයක් දිනේවා කියලා.

දෙවියන් එහෙම මෙ උතුම් රටට චිරාත් කාලයක් දිනේවා කියලා ආශිර්වාද කරන්නේ ඔබ අප මෙන් කුණුකසළ ලෞකික සම්පත් බලාපොරොත්තුවෙන් නොව මේඋතුම් සද්ධර්මයේ ආරක්ෂාව, මෙ උතුම් ධර්මය එක දිනක් හෝ වැඩිපුර ආරක්ෂාවී පවතීවා කියන සත්පුරුෂභාවයෙන්මයි. දෙවිවරු හොඳින් දන්නවා තමන් යම් දවසක දිව්‍ය සැප අහවර වී දිව්‍ය තල වලින් චුතවුවහොත් නැවත දෙවියෙක් වීමටනම් සම්මා සම්බුද්ධ ශාසනය අතුරුදහන් නොවී පවතින්න ඕනේය කියලා. ඒ වගේම පිංවත් දෙවියන් දන්නවා මෙ ගෞතම ශාසනය අවසන් මොහොත දක්වා රැකෙන්නේ මේ උතුම්පින් බිමෙමයි කියලා.

සග්රික දිව්‍යතල වල සිටින දෙවියන්ගේ අම්මා කියන්නේ සද්ධර්මයට. සද්ධර්මය නැමැති අම්මාගෙන් තමයි, එහි ඵලයෙන් තමයි දිව්‍ය සම්පත් දෙවියන්ට ලැබෙන්නේ. බලන්න සද්ධර්මයට දෙවියන් මොනතරම් කෘතගුණ සලකනවාද කියලා. නමුත් උතුම් සුගතිභූමියක් වන මෙ මනුෂ්‍ය ලෝකයේ උරුමය ලැබූ ඔබ දවසකට එක පැයක් සද්ධර්මය වෙනුවෙන් කැපවෙනවාද? ඔබ ලබන ආදායමෙන් අවම වශයෙන් සියයට දහයක් වත් කර්මය, කරමඵල විශ්වාසයෙන්, තෘෂ්ණාවෙන් තොරව දන් දෙනවාද? අවම වශයෙන් පංචශීලය නිතිපතා ආරක්ෂා කරගන්න උත්සහ ගන්නවාද? ලෝකයාට නොවේ, අවම වශයෙන් තම සැමියා, බිරිඳට, එසේත් නැතිනම් අසල්වැසියාටවත් මෛත්‍රිය වඩනවාද? පිංවත් ඔබේම හදවතට තට්ටුකර ඔබම අසන්න.

උත්තරය '

නැහැ'

නම් පිංවත් ඔබ අසත්පුරුෂයෙක් බව ඔබම දකින්න නිහතමානී වෙන්න. මොකද ඔබට මේ මනුෂ්‍ය ජීවිතය ලබාගන්න උපකාරවූ උතුම් ධර්මයන්ට ඔබ කෘතවේදී නොවන නිසා. පිංවත් ඔබට දෙවියන් නොපෙනුණාට දෙවියන්ට ඔබව පෙනෙන බව සිතන්න. උපක්‍රමශීලීව එහෙම සිතාවත් වහ වහා නිවැරදි වෙන්න. ලෝකයාව රවට්ටන්න අපිට පුළුවන් වෙන්න පුළුවන්. එහෙත් ලෝක ධර්මතාවයන් රවට්ටන්න අපට බැහැ. ඒ වගේමයි. මනුෂ්‍යයින්ව රවට්ටන්න අපට පුළුවන්, නමුත් සග්රික දිව්‍යතල වල දෙවියන් රවට්ටන්න අපට බැහැ. අප හොඳින් මතක තබාගන්න ඕනේ, සතුටින් සිනාසෙමින් ලෝකයාට වහන්වෙමින් අපි කොතෙක් වැරදි කළත්, එම දුසිල්වත්භාවයේ විපාකයන් නිසා මරණින් මතු නිරයට වැටුණොත් නිරයේදී ඔබට මුණගැසෙන යම රජුත් සග්රික දිව්‍ය තලයකට සිටින දෙවිකෙනෙක්ම බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති බව මනුෂ්‍ය ලෝකයේදීසියල්ල ඔබ මුදලට ගත්තත් යමරජු ඉදිරියේ ඔබ නිරිසතෙක් බව සිහිතබාගත යුතුය. උපරිම අවුරුදු 80 ක ජීවිතයක් උදෙසා, තාවකාලික තනතුරක් උදෙසා ඇයි දෙයියනේ මේ උතුම් සද්ධර්මයෙන් බැහැරට ගොස් නිරයට වැටෙන්නේ. මෙලොව පරලොව දෙකේදීම ඔබ අනාරක්ෂිත වෙනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ධර්මය අර්ථය තුළ මේ ජීවිතය දැකිය යුත්තේ නාසයෙන් ඉහළට ගත් ආශ්වාස පොද නාසයෙන් පිටවන මොහොතේ මේ ජීවිතයේ මරණය සිදුවේය කියන අර්ථයයි. නමුත් ලෝකය පවතිනවා, සංස්කාරකයන්ට නිජබිමක් වෙමින්. ඒ නිසා කිසිවක් අපට අවශ්‍ය විදිහට සිදුවන්නේ නැහැ. ලෝකයේ නිරතුරුවම අතුරු විනාශයන් සිදුවෙමින් පවතිනවා. සතර මහා ධාතුවේ කිපීම නිසා විනාශයන් සිදුවෙන්න පුළුවන්. පස්ස, වේදනා, සංඥ, සංස්කාර, විඤ්ඤාණ කියන පංච උපාදානස්කන්ධය නිත්‍යභාවයෙන්, ආත්මීය භාවයෙන් ගැනීම නිසා දෙවියන්ගේ, මනුෂ්‍යයන්ගේ, අමනුෂ්‍යයන්ගේ වියරුභාවය, තෘෂ්ණාධිකභාවය නිසා විනාශයන් සිදුවෙන්න පුළුවන්. මේ ආකාරයේ විනාශයක් වළක්වන්න දෙවියන්ට බැහැ. මොකද විනාශය කියන්නේ ධර්මය. ඒ කියන්නේ අනිත්‍යය. මාර්ගඵලලාභී නොවන දෙවියනුත් මේ ධර්මථාවයන්ට යටයි. නමුත් සුගතිභූමි වල වැඩසිටින මහේශාඛ්‍ය දෙවියන්ට පුළුවන් පිංවතුන්ට උපකාර කරන්න. මොකද ඒ අය සුරක්ෂිත නිසා. ඒ සුරක්ෂිතභාවය දෙවියන් ලබාගන්නේ ධර්මය තුළින්. ඉරවල් හතක් පායා කල්ප විනාශයක් සිදුවන මොහොතේත් මාර්ගඵල ලැබූ දෙවියන්, දිව්‍යාංගනාවන් සුරක්ෂිතයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ උතුම් මොහොතේ දිව්‍යතල වල වැඩසිටින දෙව්වරුන්'

අප ශ්‍රී ලංකා මාතා නමෝ නමෝ   මාතා'

කියලා මේ බොදු දේශයට ආශිර්වාද කරන්නේ'

අප සුරක්ෂිතයි, පිංවත් මනුෂ්‍ය ඔබත් ශ්‍රී සද්ධර්මය තුළින් සුරක්ෂිත වෙන්න' කියන කාරණය මතක් කරන්නයි. බලන්න ධර්මයේ සුරක්ෂිතභාවයෙන් සිංහනාද කරන දෙව්වරු. ඒ දෙවියන් සිංහනාද කරන්නේ කල්ප විනාශයක් පැමිණියත් අප සුරක්ෂිතයි කියලා. නමුත් මේ උතුම සද්ධර්මය ජීවමානව පවතින මේ ධර්මද්වීපයේ මනුෂ්‍ය අපි සුනාමියක් එයි, මිසයිලයක් එයි,

භූමිකම්පාවක් එයි කියලා හැංගෙන්න බංකර් හදනවා. ශාන්තිකර්ම කරනවා. දේවාල පසේස් දුවනවා. තවත් සරළව පැහැදිලි කරනවා නම් අපි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, දානයෙන් දුර්වලයි කියන කාරණයයි.

පිංවත් ඔබට බියක් සකස් වෙනවා නම් ඔබ කළ යුත්තේ බංකර් තැනීම, යන්ත්‍ර මන්ත්‍ර, ශාන්තිකර්ම කිරීම නොව, සුරක්ෂිතභාවය සඳහා අවශ්‍ය ශ්‍රද්ධාව, ශීලය, දානය කියන බංකර තුන ශක්තිමත්ව ජීවිතය තුළින් ගොඩනගා ගැනීමය. කල්ප විනාශයකදීවත් එම බංකර බිඳින්න බැරිබවට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සහතිකයක් දෙනවා.

(මෙහි දෙවැනි කොටස ලබන සතියේ පළ වේ)

දිව්‍ය තලවල කොහොමද
අපේ රටේ ජාතික ගීය ඇසෙන්නේ

මේ මොහොතේ සද්ධර්මය සුරක්ෂිත භූමියේසුරක්ෂිතභාවය උදෙසා"අප ශ්‍රී ලංකා මාතා" කියලා ආශිර්වාද කරන දෙවිවරුන් සමඟ පිංවත් ඔබ අත්වැල් බැඳගන්න. දෙවියන් සමඟ පිංවත් ඔබ බැඳෙන අත්වැල බැඳෙන්නේ පූජා වට්ටියකින්, පඬුරකින්, භාරයකින් නොව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, ශීලය, දානය කියන මහේශාඛ්‍ය දෙවියන් පවා වන්දනා කරන කාරණාවලින්. පිංවත් ඔබ මිථ්‍යාදෘෂ්ටික කාරණා වලින් බැහැරව ඉහත ආකාරයට සද්ධර්මයට හිතැති දෙවියන් සමඟ අත්වැලක් බැඳගත්තොත් මුළුලෝකයම විනාශවී ගියත් පිංවතුන් සුරක්ෂිත යැයි කියන කාරණය ගැන ධර්මයේ නාමයෙන් ඔබ තුළ විශ්වාසයක් ඇතිකර ගන්න. දෙවිවරුන්ට පිංවත් ඔබත් ශක්තියක් වෙන්න, මේ සද්ධර්මය යම් පමණ කාලයක් හෝ මේ ධර්මද්වීපයේ ආරක්‍ෂාකොට තැබීම පිණිස. ඒ ශක්තිය ඔබට ලබාදිය හැකේක් ජීවිතයට ඉහත අර්ථයන් එකතුකර ගැනීමෙන්ය. ඔබ මේ ආකාරයට පෙළගැසුණොත් මිථ්‍යාදෘෂ්ටික ලෝකයාට හේතු-ඵල ධර්මයන්ට අනුව කුමන විනාශයක් සිදුවුවද, පිංවත් ඔබ සුරක්ෂිත වේවි. මේ උතුම් සද්ධර්මය තව කාලයක් සුරක්ෂිතව පවතීවි. මේ උතුම් සද්ධර්මයෙන් මනුෂ්‍යයින් ධර්මාවබෝධය ලබාවි. තව තවත් සුගති භූමිවල ඉපදේවි. රූපී බ්‍රහ්ම තලවල, සුගතිභූමි වල තව තව මාර්ගඵල ලාභී දෙවියන් දිව්‍යාංගනාවන් බිහිවේවි. පිංවත් ඔබ ධර්මය සමග ජීවත්වෙන්න. ඕනෑම අභියෝගයක් හමුවේ විනාශයක් හමුවේ වුවද සුරක්ෂිතව සිහි මුළා නොවී ඊට මුහුණ දෙන්න. එසේ නොවී ඔබ මිථ්‍යාදෘෂ්ටික ක්‍රමවේදයන්ට ගියොත්, ඔබ දුසිල්වත් වුවොත්, හේතුඵල ධර්මයන්ට අනුව වෙනත් දිශාවකට යන විනාශයක් හෝ පැමිණ ඔබව විනාශ වී යාවි.

දුශ්ශීල භාවයේ හේතුඵල ධර්මයන් වළක්වන්නට දෙවියන්ට බැහැ. මේ මොහොත, මේ ධර්මද්වීපයේ උතුම් මොහොත බව සිතන්නට. එය රට ජාතියේ උතුම් මොහොත නොව, රට ජාතිය සමඟ බැඳෙන සද්ධර්මයේ උතුම් මොහොතයි. ඒ උතුම් මොහොතේ වැරදි ඉලක්ක කරා නොගොස් සද්ධර්මයම නිවැරැදි ඉලක්කය කරගන්න. එවිට රටත් ජාතියත් යම් පමණකට හෝ රැකේවි.

මේ සටහන කියවනවිට ශ්‍රද්ධාව අඩු පිංවතකුට සැකයක් හිතෙන්න පුළුවන් දිව්‍යතල වල කොහොමද අපේ රටේ ජාතික ගීය ඇසෙන්නේ කියලා. සමහර පිංවතුන්ලා කියනවනේ දිව්‍යතලයත් අපායත් දෙකම තියෙන්නේ මනුෂ්‍ය ලෝකයේම කියලා. එහෙම සිතන ලෝකයට ඉහත සිද්ධිය විකාරයක් වීමටද පුළුවන. නමුත් මේවා ඔබ දෙපා තබාගෙන ජීවත්වන ලෝකය තුළ සිදුවන සැබෑම ඇත්තය. හාස්කම් නොවේ. හේතුඵල ධර්මයන්ය.

වරක් භික්ෂුවක් මිනිස් වාසයෙන් සැතපුම් 3 ක් පමණ දුරින් කුටියක වැඩසිටියදී, උදේ පින්ඩපාතයට ගමට ගොස් නැවත කුටියට වඩින අතරමග දරුණු අමනුෂ්‍යයකුගේ බියගැන්වීමක් භික්ෂුවගේ කිසිදු ප්‍රතික්‍රියාවකින් තොරව අසාර්ථකභාවයට පත්විය. ඒ මොහොතේදීද එම භික්ෂුවට දිව්‍ය ශ්‍රෝත ඔස්සේ අපූරු සංගීත රාවයක් ඇසිණ.

එම දිව්‍ය සංගීතය වූයේ"රණවිරුවකුගේ අවසන් ගමනට, යන මහ ජනතා පා දූවිල්ලෙන්, තැළී වෙළී සැනහී මියයන්නෙමි ... මගේ පරම පැතුම එයයි (උඩගු ලියන් ගොතා බඳින..... නමැති සම්පූර්ණ ගීතයම) යන ගී හඬ සංගීතය සමඟින්ම, භික්ෂුව එම කුටියෙන් ඉවත්ව යනතුරුම නිරතරුවම දිව්‍ය තලවලින් ඇසෙන්නට විය.

ස්ත්‍රී සහ පුරුෂ කටහඬවල් දෙකකින් යුග ගීතයක් ගයන්නා සේ බොහොම මිහිරි සහ ගැඹුරු හඬින් ඇසෙන්නට විය. පිරිමි කටහඬ හරි ගැඹුරුය. සමාධිමත් හඬකින් යුක්තය. "තැළී, වෙළී පොඩිවී මියයන්නම්" කියන පද පෙළ ගායනා කරන්නේ දැඩි අධිෂ්ඨානශීලීවය.

මෙතැනදී සග්රික දිව්‍යතලවල දෙවියන් රණවිරුවා නමින් හැඳින් වූවේ තුවක්කු, යුද ටැංකි සමඟින් ඉදිරියට යන ඔබ දකින රණවිරුවා නොව. ගීතය රචනා කළ, ගායනා කළ පිංවත් ඔබ දුටු රණවිරුවා නොව. මේ මිහිතලය මත සිටින සැබෑම කෙළෙස් සතුරා පරාජය කිරීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් වීර්යය වඩන උපසම්පදා භික්ෂුව නැමැති රණවිරුවා උදෙසාය. බලන්න පිංවත්, ඔබ අපි මොනතරම් බොළඳ ද කියලා. අපි රණවිරුවා කියන්නේ කාටද? සග්රික දිව්‍යතලවල දෙවියන් රණවිරුවා වශයෙන් සිංහනාද කරන්නේ මේ උතුම් අරිහත් ධජය දරාගෙන සැබෑම කෙළෙස් යුද්ධය කරන මහාසංඝරත්නයමය. රණවිරුවා කියන වචනයට මේ සැබෑම අර්ථය දෙන්නට තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව සහිත දෙවියන්ට, මනුෂ්‍යයකුට හැර වෙන කාට පුළුවන්ද?

සිල්පද 227 කින් සන්නද්ධ ශීලයේ ශක්තියෙන් සකසේකාටගත්, සමාධියේ පළිහ උපයෝගී කරගෙන, පංච නීවරණ නමැති සතුරා පරාජයකොට ජරඥවේ ජයග්‍රහණය සොයාගෙන යන සැබෑම රණවිරුවා ලෙසින් උපසම්පදා භික්ෂුවට දෙවියන් දක්වන කෘතවේදීත්වය පිංවත් ස්වාමීන්වහන්ස ඔබවහන්සේලා ශක්තියක් කරගන්න.

දෙවියන්ට අනුව සැබෑම රණවිරුවා යනු සංස්කාර රැස්කරන රණවිරුවා නොව, සංස්කාරයන්ගේ නිරෝධය උදෙසා ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන්කරනා රණවිරුවාය. එවැනි රණවිරුවාට එරෙහිව වන මනුෂ්‍ය, අමනුෂ්‍ය අභියෝගයන් හමුවේ, ඊට එරෙහිව සටන්කොට තැළී, පැගී, පොඩිවී, මියයන්නට සූදානම් කියලයි දෙවියන් මේ මොහොතේ ඒදිව්‍ය සංගීතයෙන් සිංහනාද කරන්නේ. ලෝකයේ මොනවාදවෙන්නේ. එහෙත් අපි මොනවාද දන්නේ. අපි නොදන්නවාය කියලා ලෝකයේ වෙන දේවල් අනුමාන කමින් බැහැර කළොත් එය අපිට තිබෙන අවස්ථාවක් අපිම පැහැරහැරියා වෙනවා. පිංවත් දෙවිවරු මේ මොහොතේ සිංහනාද කරනවා, අර්ථවත් ධර්ම මාර්ගයේ ගමන්කරන පිංවතුන් උදෙසා. ඔබ ඉදිරියට එන අභියෝග හමුවේ දෙවියන් ඊට එරෙහිව සටන්කොට මියයන්න සූදානම් කියලා. දෙවියන් ශීලයෙන් පරිපූර්ණ පිරිසක්. ඒ අය බොරු කියන්නේ නැහැ. අදාළ භික්ෂුවට කැළය මැද සිදුවූ එම අමනුෂ්‍ය සිද්ධියේදී භික්ෂුව හොඳින් අත්දුටුවා එම අමනුෂ්‍යයා පරාජය කළ ආකාරය. ඒ කියන්නේ දෙවියන් ක්ෂණිකව ක්‍රියාත්මක වුණා. මීට වඩා මොන ශක්තියක්ද ගිහි පැවිදි ධර්ම මාර්ගයේ ගමන් කරන පිංවතුන්ලාට. ශීලයෙන් පරිපූර්ණ ගිහි පැවිදි උතුමන්ගේ පහසු විහරණය උදෙසා දෙවියන් තැළී මියයන්නට සූදානම්ව සිටියදී, අපේ උදවිය, කුණුවෙන පළතුරු වට්ටියක් මත, පෙරේත ලෝකයට පාර පෙන්වන සල්ලි කොළයක් හිසමත තබාගෙන ව්‍යාපාර, රැකියාව, විවාහය, තනතුරු ගැන කෙළ හල හලා දේවාල වන්දනාවේ යනවා. හිතන්න ඔය පූජා වට්ටිය බිම තබලා තෙරුවන් ගැන

සිතන්න. එහෙම හිතන සැණින් සග්රික දෙවියන්, පිංවත් ඔබ ගැන සිතාවී. ආශිර්වාද කරාවී. සිංහනාද කරාවී. පිංවත් ඔබ සැබැවින්ම දෙවියන් අතරට යන කෙනෙක් වේවි.

මේ මනුෂ්‍ය ලෝකයේ   ශීලය, දානය ජීවිතය තුළින් ක්‍රියාත්මක කරමින් ජීවත්වන මනුෂ්‍යයන් සිටිනවා. මේ අය අර්ථවත් සංගීතයට කැමතියි. ඒ අය සංගීතය අත්විඳින්නේ විතර්ක, සිහින ලෝක ගොඩනගාගෙන මනෝ ලෝක වල ජීවත්වීමට නොවේ. ඔවුන් ගීතයේ අර්ථය, සංගීතය තුළින් නිරාමිස සතුටක් ලබනවා. එම අහිංසක සතුට නිසා මොහුගේ ශීලයට බාධාවක් වෙන්නේ නැහැ. ශීලයත් රැකගෙන අර්ථවත් සංගීතයත් උපාදානය කරනවා. එහෙම අය මැරෙන මොහොතේ දිව්‍ය සංඥ සකස්වීසග්රික දිව්‍යතලවල දිව්‍ය සිටින මහේශාඛ්‍ය දෙවිවරුන්ව සංගීතයෙන් පිනවන සහායක දෙවිවරු දිව්‍යාංගනාවන් ලෙස උපත ලබනවා. ඒ අයගේ මුළු දිව්‍ය ජීවිතයම සංගීතයයි. මෙන්න මෙවැනි දිව්‍ය දිව්‍යාංගනාවන් පෙර ජීවිතයේදී සකස්කරගත් සංගීත උපාදානයන්ට අනුව, ඒ මතකයන් දිවැස් මහින් මතුකරගෙන දිව්‍ය සෝත, දිව්‍ය චක්ඛු මහින් මනුෂ්‍යලෝකයේ සංගීතයද අසමින් දකිමිනුයි, දිව්‍ය තල වල සංගීතයේ අසිරිය පතුරුවන්නේ. සිංහල ගීත ඇසෙන්නේ මනුෂ්‍ය ලෝකයේ පමණක්        නොවේ. සැබෑම අර්ථයන්ට ගළපමින් දෙවියන්ද සිංහල ගීත මියුරු හඬින් ගායනා කරනවා සංගීතය සමහින්ම.

ඉහත සටහන කියවා ඔබට විශ්වාසයක් සකස් වූවා නම්, එම විශ්වාසය බුදුරජාණන් වහන්සේ කෙරෙහිම යොමු කරන්න. ධර්ම රත්නය, සංඝ රත්නය කෙරෙහිම යොමු කරන්න. ශීලය ආර්යකාන්ත ශීලයක් වශයෙන් ජීවිතයට එකතුකර ගන්න. තෘෂ්ණාවෙන් තොරව දන් දෙන්න. නිරතුරුවම අනිත්‍ය සංඥවන් ජීවිතය තුළින් වඩන්න. මෙම ධර්මතාවයන් පිංවත් ඔබව මේ භව ගමනේදී අප්‍රමාදීභාවයට පත්කරාවි. හඬන දොඩන මිනිසුන් අතර ඔබ සමාධිමත් මිනිසෙකු කරාවි. ඒ සමාධිමත් සිතම ඔබට විදර්ශනා ඥනය සකසේකාට දේවි. දැන් පිංවත් ඔබ කල්ප විනාශයකදී වුවද සුරක්ෂිතය. මේ මොහොතේදිව්‍යතලවලට අධිපති ශක්‍ර දෙවියන්දලොව්තුරා බුදුරජාණන් වහන්සේ අභිමුව සෝවාන් ඵල අවබෝධ කරගත් දිව්‍ය නායකයෙකි. මනුෂ්‍ය ලෝකයේ වැඩ සිටින සියලුමසම්‍යදෘශ්ටිකයක්ෂයන්ට, යක්ෂ සේනාධිපතියන්ට අණදෙන මහේශාඛ්‍ය සතරවරම් දෙවිවරු ආටානාටිය සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කරනවා, අපි නෘත්‍ය සංගීතයෙන් පිනාගිය, ඒවායේ සිත්අලවා වාසය කරන්නේ කියලා. මේ සතරවරම් දෙවිවරු පිනවන දිව්‍ය බළමුළුවල හඬයි ඔය ආකාරයෙන් සංගීතය පතුරුවන්නේ. ආටානාටිය සූත්‍රයේදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සතරවරම් දෙවිවරුන්ගේ ප්‍රකාශය අනුමතකොට වදාරනවා. භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා සිව්වනක් පිරිසේ පහසු විහරණය උදෙසා සම්‍යදෘෂ්ටික දිව්‍ය, යක්ෂ බළමුළු නිරතුරුවම ආරක්ෂාව සපයනවා කියලා. ඉහත සටහන තුළින් මේ මොහොතේ ඒ යථාර්ථය සනාථ වෙනවා.

අභියෝගය අවබෝධයක් කරගන්න
15 වැනි කොටස

මෙම ආත්මභාවයේදීම නිවීම උදෙසා වනවාසීව මගවඩන භික්ෂුව කැලයට ඇතුළු වීමේදීම උපද්‍රවයන් මහහැරේවායි අධිෂ්ඨානය කළද, සද්ධර්මයෙන් ඈත්වූ මිනිසුන්ගේ සාමාජීය, පාරිසරික විකෘතිභාවයන් නිසා ඔබ ඉදිරියට අභියෝගයන් පැමිණිය හැකිය.

සතුනට අයත් කැලෑ මායිම් බිම් මිනිසුන් වගාවන් සඳහා යොදාගැනීම, සතුනට වෙඩි තැබීම නිසා තුවාල ලත් සතුන්, දඩයම් කිරීම, අලිවෙඩි පත්තුකිරීම, මරුවැල් ඇටවීම වැනි හේතූන් නිසා බියට පත් සතුන් සමහර අවස්ථාවල කැලය තුළ විකෘති, කලබලකාරී ලෙස හැසිරෙති.

මේවා පාලනය කිරීමට ධර්මයට නොහැකිය. මොකද මේවා ලෝකයේ ස්වභාවය හෙයිනි. එහෙත් අත්හැරීමේ තිබෙන මහානුභාවය නිසාම මෙවැනි විකෘති සතුන් පවා භික්ෂුවගෙන් මගහැරෙනවා.

දිනක් භික්ෂුවක් කැලෑබද ගුරුපාරක පිණ්ඩපාතයෙ වඩිනවා. මෙම කැලයේ නිතරම හැසිරෙන තනි අලියෙක් සිටිනවා. මෙම තනියා මීට මාස කිහිපයකට පෙර ගොවියන් දෙදෙනෙක් මරාදැමූ සතෙක්. වෙන අලින් මේ පෙදෙසේ නැහැ. මේ තනියා පමණයි කැලයේ සිටින්නේ. ඒ නිසා මෙයා සැරයි.

භික්ෂුව උදය කාලයේ කැලය මැදින් ගුරුපාරේ පිණ්ඩපාතේ වඩින විට පෙනෙනවා, පාර පුරා අතු කඩා දමලා, ගස් පතුරු ගහලා පාරට දමලා හරියට චුවමනාවෙන්ම පාර අපවිත්‍ර කරලා වගේ. තනියා කේන්ති ගිය ස්වභාවයෙන්ම හැසිරී ඇතිබව හොඳටම පැහැදිලියි. භික්ෂුව හොඳින්ම දන්නවා දැන් ඉදිරියේ තනියා ඉන්නවා කියලා. වේලාව පෙරවරු 6.30 ට ඇති. අලි ගඳත් දැනෙනවා. ගුරුපාර මඩකරලා. පෙරේදා රාත්‍රියේ වැස්ස තිබුණා. ඔබ දන්නවාද මේ වෙලාවේ භික්ෂුව මොකද කළේ කියලා. හැබැයි තවම භික්ෂුවට තනියා මුණගැසුනේ නැහැ. භික්ෂුවත් පැමිණි විලසින්ම ඉදිරියට වඩිනවා. ගමට යන්න එපැයි පිණ්ඩපාතය සොයාගන්න. ගමට යැමට කිලෝ මීටර 2 ක් පමණ දුරක් තිබෙනවා. භික්ෂුව ඉදිරියටම වඩිනවා. තනියා මග දිගටම අතුකඩා දමලා, පොත්ත අනුභව කරන්න ගස් පතුරුගහලා. භික්ෂුව මොහොතක් නවතිනවා. කුමක් සඳහාද? තමා ඉදිරියේ ඇති අභියෝගය ජයග්‍රහණයකට පරිවර්තනය කරගන්න. භික්ෂුව මනසින් දකිනවා, තනියා තමන් ඉදිරියට වියරුවෙන් එනවා. ඇවිත් හොඬවැලෙන් භික්ෂුව අඹරවලා ගන්නවා. අරගෙන තනියා වියරුවෙන්ම භික්ෂුවව පොලොවේ ගසනවා. භික්ෂුවගේ හිසට තනියා තම ඉදිරි පාදය තබා පාගනවා. හිස කුඩුවෙනවා. මේ සියල්ල භික්ෂුව මනසිනුයි දකින්නේ. භික්ෂුව දැනෙන දැනෙන වේදනාව තමාට අයත් දෙයක් නොවන බව දකිනවා. කුඩුවෙන බිඳෙන කය තමාට අයත් නැති බව දකිනවා. භික්ෂුව දකිනවා තම අවසාන හුස්ම පොද ශරීරයෙන් පිටවෙනවා. භික්ෂුව නුවනින් බලනවා ඇතිවූ අවසාන සිත නැවත ප්‍රතිසන්ධියක් සහිත සිතක්ද කියලා. භික්ෂුව දකිනවා අවසන් සිතේ කිසිම උපාදානයක්, තණ්හාවක්, කැමැත්තක් නැතිය කියලා. භික්ෂුව අවබෝධ කරගන්නවා කැමැත්තක්, තණ්හාවක් නොමැතිනම් නැවත උපාදානයක්, බැසගැනීමක් නොමැති බව. බලන්න නිවන් මඟ වඩන භික්ෂුවක් ජීවිතයට අභියෝගයක සෙවනැල්ල වැටුණු මොහොතකදී තමා විසින්ම ජීවිතය මරාදැමීමට සලස්වලා අවබෝධය ලබලා නැවැත ජීවිතයට සේන්දු වුණා. බලන්න ලොව්තුරු

ධර්මයේ විශිෂ්ට බව. අතහැරීමේ ආශ්චර්යය.

දස දහස්ගණනින් මහ රහතන් වහන්සේලා අතීතයේ බිහිවූයේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ මෙවැනි කමටහන් බුදු පුතුන්ට දුන් නිසාය. මෙම සිදුවීමේදී භික්ෂුව තුළ වැඩුනේ සතර සතිපට්ඨානයයි.

මෙවැනි සිදුවීම් භික්ෂුව ඉදිරියට එන ආශීර්වාදයන්ය. ඔබ දක්ෂ විය යුතුයි ඔබේ නිවීම උදෙසා මේවා ගලපාගැනීමට.

තනි අලියාට පමණක් නොව අනිකුත් අභියෝගවලදීත්.....

භික්ෂුවගේ දක්ෂභාවය නිසාම අභියෝගය ඉදිරියේ ජීවිතය අතහැරෙනකොට, ඉදිරියේ අනිවාර්යයෙන්ම ඇතැයි කියලා අනුමාන කළ තනියා දකින්න සිටියේ නැත. තනියාට භික්ෂුවගේ ඉව දැනෙන සීමාවේ ඉන්න බැහැ. එයාට දැනෙනවා භික්ෂුවගේ අතහැරීමෙන් කම්පාවන ලෝක ස්වභාවය. සියල්ල ඔබ අතහරින්න. ඔබට මේ සියල්ල ලැබෙනවා. එහෙත් මේ සියල්ල ඔබට ලැබෙනවිට මේ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද මේ සියල්ල අනිත්‍ය බව ඔබ අවබෝධයෙන් දකිනවා. ඔබද ඔබේ වාසනාවත් භික්ෂු ජීවිතය ඉදිරියට අභියෝග පතිත වන විට පලා නොයන්න, බිය නොවන්න. යටත් නොවන්න. පිරිත් පොත අතට නොගන්න. බුදු ගුණ නොසිතන්න. ඔබත් අභියෝගයත්, ප්‍රතිඵලයත් ඔබේ නොවේ යැයි දකින්න. එවිට ඔබ දකින්නේ සැබෑම බුදුගුණයයි.

ඔබේ ජීවිතය ඔබම ලෙඩ කරන්න, අංශභාග රෝගියෙක් කරන්න, පිළිකා, ලියුකේමියා, වකුගඩු රෝගියෙක් කරන්න. මග තොටේදී ඔබව වාහනයකට යටවී ශරීරය කුඩුවෙනවා දකින්න. ඔබ වයසට ගිහින් ලෙඩ ඇඳේ අබ්බගාතයෙක් ලෙස දුක්විඳිනවා දකින්න. ඔබට සලකන්නට කෙනෙක් නොමැතිව අසූචි මළමුත්‍රා මත ඔබ වැටී සිටිනා හැටි දකින්න. ඔබ මනසින් මියයන්න.

ඔබේ සිතේස්වභාවය අධ්‍යයනය කරන්න. මේ සියලු කමටහන් තුළින් ඔබ තුළ වැඩෙන්නේ සතර සතිපට්ඨානය බව අවබෝධයෙන් දකින්න. මරණය මනසින් අත්දකිමින්, අත්විඳිමින් නැවත උපාදනයක් නැති අවසානයක් කරා යැමට සිත පුහුණු කරන්න. අභියෝගය-අවබෝධයක් කරගන්න. ඔබද නිවන් මහට අවතීර්ණ වන්න. නිර්වින්දන, අලිවෙඩි, ඇත්ගොව්වන්, හෙන්ඩුව නොමැතිව සද්ධන්ත කුළයේ අලි ඇතුන් දමනය වන ආශ්චර්යවත් ධර්මයේ උරුමක්කරුවෙක් වෙන්න. හැබැයි ඒ අලි දමනය කිරීමට නම් නොවේ. අලි දමනය කිරීමට ඔබ තුළ ඇතිවන සිත හා කැමැත්ත දමනය කරගැනීමටය. කැමැත්ත අතහැර දැමීමටය. කැමැත්ත යනු ඔබට අයත් දෙයක් නොවන බව දකින්න. අනිත්‍යභාවයට පත්වන සිත ඔබට දෙන අනිත්‍යවූ නියෝගයක් පමණක්ම ලෙසින් එය දකින්න. සිත අතහැරුණු කල, කැමැත්තද ඔබට අතහැරෙනු ඇත. මේ මොහොතේත් ඔබ යම් කැමැත්තකින් පසුවෙනවා නම් ඔබ සියුම්ව නිරීක්ෂණය කර බලන්න. ඔබේ අනිත්‍යභාවයට පත්වන, ඔබට අයිති නැත. සිත නේද ඒ කැමැත්තට ඔබව පොළඹවන්නේ. භවය කරා ඔබව කැඳවාගෙන යන අවිචාරවත් සිත

අවබෝධයෙන් හඳුනාගෙන කැමැත්තෙන් මිදෙන්න.

ගමන ඉවරත් නොමැති
යන ගමනකුත් නොමැති තුන් කලට වහල් නිති
ඔබත් ඔරලෝසු කටුවක්ද?

ඔබ මොහොතක් සිතන්න. අපි අවිද්‍යාව නිසා මොනතරම වැරදි දෘෂ්ඨිවල ඉන්නවාද කියලා. ඔබට සිතෙන්නේම"දැන් ශාසනයෙන් වසර දෙදහස් පන්සීයක් ගෙවිලා අවසන්, දැන් ශාසනය අතුරුදන් වන යුගය, ධර්මය අවබෝධකර ගැනීමට මේ වකවානුවෙ නොහැකියි. පිනක් දහමක් කරගෙන, පාරමී සම්පූර්ණ කර ගැනීමයි කළ යුත්තේ" කියලා.

මේ සියලුම දෘෂ්ඨීන් අවිද්‍යාව නිසා ඇතිවන ඒවාය. සමාජය දෙස බැලීමේදී අපි දකින්නේ විකෘති ස්වභාවයන්ය. අනාගතයේදී ඇතිවන විකෘති ස්වභාවය ගැන කොසොල් රජතුමාගේ සිහින විස්තර කිරීමේදී ලොවතුරා බුදුරජාණන් වහන්සේ මනාව පෙන්වා දී ඇත. වර්තමානයේ අපි කවි බණ, විරිදු බණ, කාලීන බණ, දෙපිට කැපෙන වචන යොදන බණ ආදිය අසන්නෙමු. අනාගතයේදී අපට සින්දුවෙන් බණ කියන ස්වභාවය දැකිය හැකිය. ස්වාමීන්වහන්සේ ධර්මාසනයේ සිට ධර්මගීතය ගායනා කරන විට ඒ අසළ සිටින සංගීත කණ්ඩායම එම ධර්ම ගීතයට සංගීතය සපයනු ඇත. මේවා ජනතාව අතර, විශේෂයෙන්ම තරුණ පරපුර අතර, ඉතා ජනප්‍රියභාවයට පත්වේ. ජනතාව, තරුණ පරපුර ධර්මයට යොමු කිරීම සඳහා පාලකයන් ද, මාධ්‍යය ද තව තවත් ධර්ම ගීත ප්‍රචලිත කරනු ඇත. මේවාට ඔබ කලබල විය යුතු නැත. මේවා ලෝකයේ ස්වභාවයන්ය. අපි කලබල වියයුත්තේ මෙසේ නොවුනහොත්ය.

අපි කළ යුත්තේ ලෝකයේ මෙම ස්වභාවය හඳුනාගෙන ලෝකයෙන් මිදීයැමට වෙර දැරීමය. ලෝකයේ ස්වභාවය අපට වෙනස් කළ නොහැකිය. ඔබ මේවාට ගැටුනහොත් ඔබ ගැටෙන්නේ ධර්මය සමඟය. ලෝකස්වභාය සමඟය. අප කළ යුත්තේ ගැටීම නොව අවබෝධ කරගැනීමය. ඔබ අතීතයද, අනාගතයද අතහැරිය යුතුය. වර්තමානය තුළ පමණක් ජීවත්විය යුතුය. නිවන් මඟ වඩන්නා යනු වර්තමානය තුළ ජීවත් වෙන්නාය. හෙටක් ගැන බලාපොරොත්තුවක්, ඊයේ ගැන පසුතැවීමක් ඔහුට නැත. වර්තමානය තුළද ඔහු දැකිය යුත්තේ මොහොතකින් අතීතයට යන, මොහොතකට පෙර අනාගතය වූයේවර්තමානය බවයි. එසේනම් වර්තමානය ද මායාවකි, මුලාවකි. එය නිරතුරුවම වෙනස් වෙයි. කාලය වෙනස්වීම අවබෝධයෙන් දකින්නා කාලසටහන්වලින් ඉවත්වේ. කාලසටහන් පාවිච්චි කළ හැකේක් එකිනෙකට වෙනස් විෂයන්ටය. එහෙත් විශ්වය තුළ ඇත්තේ එකම විෂයකි. එකම පාඩමකි. එය නම් අනිත්‍යයයි.

ඔබ ජීවත්වන්නේ ද අනිත්‍යය තුළය. එහෙත් ඔබ එය නොදනී. අනිත්‍යභාවය නිසා ඇතිවන දුක නැති කරගැනීම සඳහා ඔබ වෙහෙසේ. ඔබ තුළ ඇති තරගකාරීත්වයද, වේගයද, අනිත්‍යභාවය නිසා ඇතිවන දුක අවසන් කරගැනීම සඳහා ඔබ ගන්නා ව්‍යායාමයේ ප්‍රතිඵලයකි. ජීවත්වීම යනුවෙන් ඔබ කරන්නේ ඔය කාර්යයයි. අබෞද්ධ පිංවතුන්ටද, සියලු සත්වයාටමද මෙය පොදුය. ඔබ සිනාසෙන්නේ සතුටට යැයි ඔබට සිතෙනු ඇත. නැත. ඔබ සිනාසෙන්නේ දුක නැතිකර ගැනීම සඳහාය. ඔබ ආහාර ගන්නේ කය පිනවා ගැනීමට නොව කුසගිනි දුක නැතිකර ගැනීමය. ඔබ ඖෂධ ගන්නේ ශරීරය සතුටු කිරීමට නොව මරණයෙන් බේරීමටය. ඔබ ශරීරයේ සුවඳවිලවුන් තවරා ගන්නේ ශරීරයෙන් හමන දුගඳ දුරුකර ගැනීම ය. ඔබ හිසකෙස් කළුකර ගන්නේද සුදු හිසකෙස් නිසා ඇති වන දුක නැති කර ගැනීමටය. බලන්නකෝ"මම, මගේ" යැයි

ඔබ ගොඩගසාගෙන සිටින දුක් කන්දක විශාලත්වය.

හොඳයි ඔබ මෙහෙම සිතන්නකෝ. ඔබ පන්සලට ගිහින් බුදුන්වඳින්නේ අපායට, දුකට වැටෙයි කියලා බයට. එතැනදී ඔබ මොකද කරන්නේ. දිව්‍යලෝක, මනුෂ්‍ය ලෝකප්‍රාර්ථනා කරනවා. බලන්න ඔබ දුකේ සිටිමින් දුකම ප්‍රාර්ථනා කරනවා. මනුෂ්‍ය ලෝකයේ ජීවත්වෙමින් එම දුකම ප්‍රාර්ථනා කරනවා. අනිත්‍යභාවයට පත්වෙන දිව්‍යලෝක දුකමප්‍රාර්ථනා කරනවා. පිංකම කරලා දුකම ප්‍රාර්ථනා කරනවා. පෘතග්ජන සත්වයා අගමුල පැටළුණු නූල් බෝලයක් වගේ යැයි ලොව්තුරා බුදුසමිඳුන් දේශනා කළේ මේ නිසාය. හැබැයි ඔබ නිවීසැනසිල්ලේ වීර්යයෙන් සතියෙන් මේ නූල්බෝලයේ පැටළුම ලිහාගතහොත්, ඔබට එහි අගක් මුලක් මැදක් හොඳට දකින්න පුළුවන්. ලෙහාගන්න පුළුවන්කම තිබියදීමයි ඔබ මේ පැටලී සිටින්නේ. ඔබ මේ නූල්බොලයේ පැටලිල්ල ලිහාගතහොත් ඔබ නූල්බෝලය නැවත බඳාගන්නේ නම් නැහැ. මොකද ඔබ අවබෝධයෙන්දන්නවා නූල්බෝලය පැටළුම් ස්වභාවයෙන් යුක්ත බව. මේ පැටළුම ලිහාගන්න ඔබට කාලය ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඔබට නිහතමානීකම තිබෙන්න ඕනේ. නිවන් මහ නිවීමේ ශබ්දකෝෂයේ"අ"යන්න නිහතමානී කමයි. නිහතමානීකම නොමැති කිසිවෙකුට නිවීමේ ප්‍රතිපදාවේ දශමයක්වත් ඉදිරියට යා නොහැකිය. භික්ෂුව ගිහි කාලයේදී කොතැනින්ද, කවුරුන්ගෙන්ද යමක් ඉගෙනගැනීමට හැකි.... ඒ සැමදෙනාටම සවන්දුන්නේය. ජාතිය, ආගම, වයස, තරාතිරම, නොබැලූවේය. ගතයුත්ත ගත්තේය. අත්හලයුත්ත අත්හැරියේය. වරක් භික්ෂුව ගිහිකාලයේදී ප්‍රධාන නගරයක ගමන්කරන විට යාචක මනුෂ්‍යයෙන් දැඩි වේදනාවකින් පෙළෙමින්, තම ගුදමාර්ගයෙන් ඉවතට පැමිණි අහල් හයක් පමණැති ශරීර අවයවයක් ශරීරය තුළට ඔබනවා දුටුවේය. එය අර්ශස් රෝගයේ දරුණු අවස්ථාවකි. මේ යාචක පිංවතාගෙන්ද භික්ෂුව නිවීමට අවශ්‍ය කලමනා සොයාගත්තේය. කුඩා දරුවෙකේගන් ඔබට යමක් ඉගෙනීමට හැකිනම් ඔබ එය ඉගෙනගත යුතුය. එය කළහැකේක් නිහතමානීකම තිබුනොත්ය. නිවීමේ මහ උදෙසා ඔබට මවුකුස පිළිසිඳ වැඩෙන කලල රූපය තුළින් ලැබිය හැකි අවබෝධය, මහා පඬිවරයෙකේගන් ලැබිය නොහැකිය. මන්ද මහා පඬිවරයා පිළිබඳව ඔබට නිවැරදිව අවබෝධය ලබාගන්නට නම් ඔහුගේ කලල අවස්ථාවට, බිළිඳු අවස්ථාවට යායුතු හෙයිනි. මේ දැකගැනීමට ඔබ තුළ නිහතමානීකම තිබිය යුතුය.

තමා ශිල්වත් බවත්, භාවනාවෙන් ඉහළ තත්ත්වයක සිටින බවත් සිතමින්, මහා සංඝරත්නයට නොවඳින පිංවතුන්ද සිටියි. ධර්මය දැනීමට නම් අවම වශයෙන් ඔහු තුළ තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවක් තිබිය යුතුය. සමහරවිට ශීල, සමාධි, භාවනා මාන්නය නිසා මහා සංඝරත්නයට නොවඳින පිංවතුන් සිටින්නේ මිත්‍යාදෘෂ්ඨික භාවයේ වීමටද ඉඩ ඇත. මේවා නිහතමානී නොවීමේප්‍රතිඵලයයි. මහාසංඝරත්නයට නමස්කාර කිරීමට එම පිංවතුන්ට හිස නොනැමෙන්නේ ඒ පිංවතුන්ගේ හිස මාන්නයෙන් බරව ඇති නිසාය. අබුද්ධෝපත්ති කාලයේදීත් පසේබුදුවරු ලොව පහළවී ධර්මය අවබෝධ කරගෙන නිවන් දකිති. උන්වහන්සේලා මනුෂ්‍ය ලෝකයේමව්කුසක උපත ලබාගන්නේ සංසාරයේ පුරණ ලද පාරමී ශක්තිය අධ්‍යාත්මය තුළ දරාගෙනයි. සංසාරයේ පුරණ ලද අනිත්‍යසංඥවේ ඉව උන්වහන්සේලාගේ අධ්‍යාත්මය තුළ සැඟවී තිබෙනවා. උන්වහන්සේලා තනිවම, හුදෙකලාවේ වනගතව ධර්මය අවබෝකරගන්නවා. හැබැයි අවබෝධකරගත් ධර්මය පසේ බුදුවරු විසින් ජනතාවට දේශනාකරන්න යන්නේ නැහැ. ඒ උන්වහන්සේලාට දේශනා කිරීමේශක්තිය, අවබෝධය නැති නිසා නොවෙයි. ධර්මය අවබෝධය ලැබුවා කියන්නේ එහි ස්වභාවය දැක්කා කියන එකයි. ධර්මයේ ස්වභාවය දැක්කා නම් එය දේශනා කරන්න බැරිවෙන්න බැහැ. ඔබ පිටකොටුවට ගියානම් ඔබ දන්නවා

බස්නැවතුම, දුම්රියපළ, බෝසමිඳුන් කොතැනද සිටින්නේ කියලා පිටකොටුවේ ස්වභාවය ගැන කියන්න. ඔබට එය කියන්නට බැරිනම් ඔබ නියත වශයෙන්ම පිටකොටුවට ගිහින් නැහැ. පසේබුදුවරු තමා අවබෝධකරගත්ධර්මය අනුනට දේශනා නොකරන්නේ ධර්මය අවබෝධයට තබා, ධර්මයට ගරුකිරීමටවත් විශමවූ, පාපකාරී, මිත්‍යාදෘෂ්ඨික අබුද්ධෝත්පාද කාලයකදී කෙනෙකු නොමැතිවීමයි. පසේබුදුවරු එවැනි කාලයකදී එවැනි මිනිස් සමාජයකට ධර්මය දේශනා කිරීමට ගියහොත් එම සමාජය පසේබුදුහිමිට"පිසේසක්" යැයි පරිභව කරනු ඇත. පහරදෙනු ඇත. මෙවැනි හේතුන් නිසා මිනිසා රැස්කරගන්නා අකුසල්වල ප්‍රමාණය උන්වහන්සේලා හොඳින්ම දනියි. ඒ නිසා පසේබුදුරජාණන් වහන්සේලා වනයේ හුදෙකලාවේ වැඩසිටිමින් පිරිනිවීයති. උන්වහන්සේලා මිනිසාට දේශනා කිරීමට නොයන්නේ ඔවුන් කෙරෙහි ඇති කරුණාව, මෛත්‍රිය නිසාමය. මෙවැනි විශම කාලවලදීත් පසේබුදුවරු ධර්මය අවබෝධ කරගන්නේ  නම්, ධර්මය අවබෝධ කරගැනීමට කාලයප්‍රශ්නයක් නොවේ. ප්‍රශ්නය ඇත්තේ ධර්මය අවබෝධකර ගැනීමට ඔබ කාලයට භාරදීමයි. කාලය තුළ ඇත්තේද වෙනස්වීම, ගෙවීයාම පමණක්මය. අතීතයද, වර්තමානයද, අනාගතයද නිරතුරුවම වෙනස්වන, අනිත්‍යයට පත්වන ස්වභාවයන්ය. මෙතුවක් කලක් සංසාරයේදී කාලය විසින් ඔබව රවටා ඇත. ඔබව රැවටීමට කාලයට උදව් කළේ අවිද්‍යාවයි. නිත්‍යභාවයේ නැති අනාගතයකට, ධර්මාවබෝධය ලැබීම භාර කරන පෘතග්ජන සත්වයා දිය පිපාසයෙන් මිරිඟුව පසුපස දිවයන මුවෙක් සේ නැති අනාගතයක් පසුපස දිවයයි. ඔහු දිවයන වේගයෙන්ම ඔහු සොයන අනාගතයද අවිද්‍යාව විසින් ඉදිරියට දුවවනු ඇත. මේ අවිද්‍යාවෙන් ඔබ නොමිදුනොත් දිවීමත්, හතිදැමීමත්, දුකත් හැර ඔබට අනාගතයක් හමුනොවනු ඇත. කල්ප ගණනක සිට අනාගතයට දිවයමින් හතිදමමින් මේ මොහොතේ ඔබ සිටින්නේදඑම ස්වභාවයේමය. මේ මොහොතේද ඔබ නිවන්මහ වැඩීම කල්දමා ඇත. සමහරු මෛත්‍රී බුදුසමිඳුන් දැක නිවන් දැකීම පිණිස කල්ප ගණනක් අනාගතයට ගොස් ඇත. නැති අනාගතයක් ඉලක්ක කරමින්, ධර්මය අවබෝධකර ගැනීමට ඔබ ලැබූ මේ උතුම් අවස්ථාව අපතේ හැරීමකි ඔබ මේ කරමින් සිටින්නේ.

අවබෝධය අතින් ඔබ මෙතැනැයි සිටින්නේ කියලා අධිතකේස්රුවකට එන්න එපා. මොකද ඔබ මෙතැනයි ඉන්නේ කියලා කියන්න ස්ථිර, වෙනස් නොවන තැනක් ලෝකයේ  නැහැ. ඔබට, මම මෙතැන සිටිනවාය කියලා රැඳීසිටින්න බැහැ. ඔබට එහෙම සිතෙනවානම් ඔබ සිටින්නේ අන්තිමයාටයි. ඔබට ප්‍රථමයා වෙන්න නම්, ඔබට දැනෙන්න ඕනේ ඔබ සිටින්නේ අනිත්‍යය තුළයි කියලා. ස්ථිර තැනක් නැති ලෝකයේ ඔබ කළ යුත්තේ ස්ථිරතැන් සෙවීමට නොව අස්ථිර ලෝකයෙන් මිදීයැමය. කාලය තුළ අතීත, අනාගත වර්තමාන වශයෙන් ස්ථිර යමක් නොමැත. කාලය යනු අනිත්‍යයයි. එනිසා කාලය, වේලාව ඔබ අත්හරින්න. එවිට අතීත, අනාගත, වර්තමාන තුන් කාලයම ඔබට අතහැරේවි. ඔබට එසේ දකින්නට බැරිනම් ඔබ සිතන්න, සංසාර ගමන්මගේ ඔබ ගතකරන මේ මොහොත හොඳම කාලය බව. ධර්මය අවබෝධකරගැනීම පිණිස මෙවැනි කාලයක් තව කල්ප ගණනාවකට ඔබට නොලැබේවි. ඉක්මනින් හිතන්න. වර්තමානය අතීතයට යනවා. අනාගතය වර්තමානය වෙනවා. ඔබ නැති අනාගතයක් දකිමින් දුක සමඟ පෙරටම යනවා. අනාගතය, අනාගතය.... කියලා මාරයා ඔබට ලොකු කැරට් අලයක් දික්කරනවා. දුක සැපක් කරගත්ත, සැප බලාපොරොත්තුවක් කරගත්ත අපි මෙයන්නේ නැති

## නාලාගිරි අදත් වඩියි

නාලාගිරි ඇතා කීවම ඔබට දැනෙන්නේ බියක්. රා පොවල වෙරිමතින් ලොව්තුරා බුදුරජාණන් ඉදිරියට වියරු ස්වභාවයෙන් පැමිණි නාලාගිරි ඇත් රජු ගැන ඔබ හොඳට අහල තිබෙනවා. ඔබ විශ්වාස කරයිද දන්නෙ නැහැ මෙහි සටහන් කරන දෙය. අදත් පුළුවන් අතීතයේ බුදුසමිඳුන් අභියස දනනැමූ ඒ නාලාගිරි ඇත්රජුව දකින්න. හැබයි ඔබ නාලාගිරි ඇත්රජුව දකින්න නම් අතහැරීමේ උපරිමය තුළ ප්‍රතිප්‍රදාවේ යෙදෙන භික්ෂුවක් වෙන්න ඕනේ. ඒ කියන්නෙ සැබෑ මධ්‍යම ප්‍රතිප්‍රදාවේ යෙදෙන භික්ෂුවක්.

භික්ෂුවක් බදුල්ල දිස්ත්‍රික්කයට අයත් රක්ෂිතයක ගොඳුරු ගමෙන් කිලෝමීටර් එකාහාමාරක් පමණ ඈතින් වනයේ හුදකලා කුටියක වැඩසිටියා. කුටියට වඩින්ට තිබෙන්නේ අලිමංකඩ ඔසේස්ය. භික්ෂුව වැඩසිටිය කුටිය ගෙමිදුලින් තමයි අලිමංකඩ වැටී තිබුනේ. භික්ෂුව මෙ කුටියට පැමිණි ප්‍රථම දිනයේම රාත්‍රී දහය වෙනකොට අලි තුන්දෙනෙක් කුටිය පිටිපස පැය භාගයක් පමණ අතු බිඳිමින් ආහාර ගෙන අලිමංකඩ ඔසේස් ගමට වැදුනා. පසුදා උදෑසන භික්‍ෂුව පිණ්ඩපාතය වඩිනකොට භික්‍ෂුවට පේනවා ගමේ කුඹුරු කීපයක්ම අලි විනාශකර තිබීම නිසා මිනිසුන් පත්ව සිටි වේදනාව. භික්‍ෂුව මේ මොහොත වන විටත් කරණීය මෙත්ත සූත්‍රය හැර වෙන කිසිම සූත්‍රයක් කටපාඩමින් සජ්ජායනා කිරීමට නොදැන සිටියේය. පිරිත් පොතක්ද භාවිතා නොකළේය. නිවීම උදෙසා යන ගමනේදී ඒවා අවශ්‍ය නොවන බව භික්‍ෂුව දැනසිටියේය. එහෙත් එක්තරා ආරණ්‍යයකදී හමුවූ ස්වාමීන් වහන්සේ නමක් භික්‍ෂුවට නාලාගිරි ගාථාව සහ අංගුලිමාල පිරිත ද, කඳ පිරිතද ලියා තබාගන්න යැයි කීව නිසා භික්‍ෂුව තනිරුල් පිටුවක එම ගාථාව ලියා තබා තිබිණි.

එහි නාලාගිරි ගාථාව මෙලෙස සටහන් කොට තිබිණි.

"මා කුඤ්ජර නාග මාසදෝ

දුක්ඛං හි කුඤ්ජර නාග මාසදෝ

නහිනාග හතස්ස කුඤ්ජර සුගති හෝති

ඉතෝ පරං ගතෝ"

ඉහත ගාථාව නිවැරදි දැයි භික්‍ෂුව තවමත් ස්ථිරව නොදනී. එහෙත් භික්‍ෂුව භාවිතා කළේ ගාථාවේ ඉහත පද හතර පමණකි. භික්‍ෂුව ආශ්චර්යයක් බලාපොරොත්තු නොවිණ. අවශ්‍යවූයේ තමා වෙනුවෙන් නොව, තමන්ට පිණ්ඩපාතය පූජා කරන දුප්පත් දායකයන් වෙනුවෙන් තාවකාලිකව හෝ යහපතක් කිරීමටයි. ප්‍රතිඵලය කුමක් වේදැයි භික්‍ෂුව නොසිතුවේය. නොදත්තේය. ඊට අමුතු ආයාසයක්ද, වෙහෙසක්ද නොගත්තේය. දිනකට ඉහත ගාථාව විසිපස් වතාවක් පමණ ශබ්ද නගමින් සජ්ජායනා කළහ. දින දෙකක් මෙසේ ගාථාව සජ්ජායනය කිරීමේදී.... අරුමයකි¾ භික්‍ෂුව සමාධියෙන් පසුවෙද්දී කැළයෙන් මතුවන ඇත් රුවක් පෙණිනි. ඇතෙක් නොව ඔහු ප්‍රතාපවත් ඇත් රජෙකි. දිළිසෙන ප්‍රභාෂ්වර කලු පැහැයෙන් යුත් ශරීරය සමාන්‍ය ඇතෙකුට වඩා පලලින් යුක්තිය. එය හරියට පෙරහැරේ යන ඇතෙකුට ඇඳුම් ආයිත්තම ඇන්දවූ පසු පලලට

පෙනෙනවා සේය. දිග ඇත්දළ යුගලකි. එහි කෙළවර දෙකට රන්වන් කොපු දමා ඇත. හිසේ ඉදිරි කොටස ආභාරණවලින් සරසා ඇත. ඇත්රජුගේ ඇස් දෙකෙන් ඉතා තියුණු දීප්තිමත් සුදුපැහැති ආලෝකධාරා දෙකක් විහිදේ. එම ආලෝකය ඉතා තියුණුය. ඉහත ගාථාව සජ්ජායනා කරන විට මෙම ඇත්රුව දිනකට හතර පස් වතාවක් භික්ෂුවට සමාධියේදී දිසේවි. බලන්න ධර්මයේ ආශ්චර්යය. ඔබ දක්ෂ නම් මීට වසර 2500 කට පෙර ජීවත්වූ නාලාගිරි ඇත් රජුවද වර්තමානයේදී දැකිය හැකිය.

මේ ඇත් රජු දර්ශනය වීමත් සමඟම, භික්ෂුව එම කුටියේ වැඩ සිටි මාස දෙක පුරාවට ගමට පැමිණි අලි ගමට තබා, කුටිය අසලටවත් පැමිණියේ නැත. භික්ෂුව කුටිය අතහැර ගිය පසු කුමක් වූවාද යන්න භික්ෂුව නොදනී. මෙය භික්ෂුවගේ ආශ්චර්යයක් නොව, ධර්මයේ ආශ්චර්යයකි. අතහැරීමෙ ක්රියාවලියේ ආශ්චර්යයකි.

මෙහිදී සිදුවන දෙය පුදුමාකාරය. භික්ෂුවට මේ දිව්‍ය ඇත්රජු සමාධියේදී පෙනෙනවා සේම, අලින්ටද මේ ඇත්රජු දර්ශනය වේ. ඇත්රජුගේ තේජස් ඇස්වලින් විහිදෙනප්රභාශ්වර ආලෝක ධාරා දෙක නිසා කැලේ අලි බියට පත්වේ. සද්ධන්ත කුලයේ ඇතෙකු දැක පලායන අලින් සේ ඉහත ගාථාව භාවිතා කිරීමේදී, සජ්ජායනා කිරීමේදී අලි මඟහැර යන්නේ නාලාගිරි ඇත්රජු දිව්‍ය ආත්මභාවයක සිට බුදු අණින් යුත් ඉහත ගාථාවෙන් කරන ආරාධනයත් සමඟ වඩින නිසාය. ලොව්තුරා බුදුසම්දුන් අභියස දණගැසූ නාලාගිරි ඇත්රජු, බුද්ධ අණින් මේ මොහොතේද අර්ථවත්ව, නිවැරදිව නිවන් මඟ වඩනා බුදු පුතුන් ආරක්ෂා කිරීමට පෙනී සිටියි. බුදු පුතුන්ගේ අණට දර්ශනය වේ. හැබැයි ගාථාව සජ්ජායනා කළ පමණින් එය කළ නොහැක. ගාථාව භාවිතා කරන්නා තුළ අතහැරීම උපරිමයෙන් තිබිය යුතුය. ඉහත කුටිය පරිහරණය කරන විට භික්ෂුවට තුන් සිවුරත් පාත්රයත් හැර අන්දෙයක් එහි නොතිබිණි. අතහැරීමෙ උපරිමය තුළ නාලාගිරි ගාථාවේ සාර්ථකත්වය ඔබත් අත්විඳින්න.

භික්ෂුව මේ ලියන මොහොතේද ඉහත ගාථාව නිවැරදි දැයි නොදත්තේය. ඒ එම ගාථාවද භික්ෂුව අතහැර දැමූ නිසාය. එහි නිවැරදිභාවය සෙවීමට, එහි පද අඩුදැයි සෙවීමට උන්වහන්සේට මේ මොහොතේද අවශ්‍ය නොවේ. එය අතහැරීමේ ස්වභාවයේ උපරිමයයි. භික්ෂුව මෙම ගාථාවේ නිවැරදිභාවය සෙවීමට ගියා නම් උන්වහන්සේට මේ ගාථාවෙන්ප්රාතිහාර්යයක් දැකිය නොහැක. මන්ද එසේනම් උන්වහන්සේ ගාථාව තුළ නිත්‍යභාවයක් දකින නිසාය. සමහරවිට මේ කියවන ඔබට ගාථාවේ පද අඩු බවට, වැරදි ඇති බවට විචිකිච්ඡාවක් ඇතිවිය හැකිය. එය අතහැරීමෙ ස්වභාවය නොවේ. අල්ලාගැනීමෙ ස්වභාවයයි.

ඔබ යමක් සොයන්නේ නම් සෙවීමට නිත්‍ය යමක් තිබිය යුතුය. වැරදි සොය සොයා සිටීම දුර්වලතාවයකි. ලැබුණු දේ ගලපාගැනීමට ඔබ දක්ෂ විය යුතුය. ගාථාව, පිරිත යනු අනිත්‍ය පද පෙළකි. එම අනිත්‍ය දකිමින් එය භාවිතා කිරීම ප්රතිඵලදායකය. භික්ෂුව දන්නා නිවීමෙ ප්රතිපදාව මෙයයි. එහෙත් ඔබ ආමිසය තුළ බුදුරජාණන්වහන්සේට පූජා පවත්වන පිංවතෙකු නම් ගාථා පිරිත් වල අර්ථ වශයෙන් දැක සජ්ජායනා කිරීම අත්‍යවශ්‍යය. ප්රතිඵලදායකය. ලෞකික ජීවිතය යහපත්ව හැඩගස්වාගැනීමට උපකාරී වේ. ඉහත මාර්ග දෙක ඔබ පටලවා නොගන්න.

ලොව්තුරා බුදුසම්දුන් නාලාගිරි හස්තිරාජයාට දේශනා කළ ඉහත ගාථාව, උපරිම මට්ටමින්

ප්‍රතිඵල පෙන්වූ අවස්ථාවක් ලෙස භික්ෂුව ඉහත අවස්ථාව දකියි. බුදුරජාණන් වහන්සේ යම් අරමුණකින් ඉහත ගාථාව නාලාගිරි හස්තියාට දේශනා කළාද, ඉන් ප්‍රතිඵල ලැබුවාද, භික්ෂුවටත් එය එසේම සිදුවිය. බුදු වදනේ ආශ්චර්යය මෙයයි. සත්‍යතාවය මෙයයි. එය අත්විඳිය හැක්කේ අතහැරීම තුළම පමණි. භික්ෂුව ඔබට නැවතත් කියයි. ඔබේ අවබෝධය සඳහාම"....

භික්ෂුව ඉහත කුටියේ වැඩසිටින මාස දෙකක කාලය තුළදී හුණු මිශ්‍ර දොලේ ජලය පාවිච්චි කිරීම නිසා මුත්‍රමාර්ගයේ ආබාධ වලින්ද, ආහාර මදකම නිසා ලේ වල සීනි හිඟවීමේ ක්ලාන්තයෙන්ද පීඩා වින්දේය. එහෙත් ඒ සැම පීඩාවක්ම ජයග්‍රහණයක් කරගැනීමට භික්ෂුවට හැකිවිය. එම පීඩාවන් නිවන් මඟට ආශීර්වාදයක් කරගත්තේය. නාලාගිරි හස්තිරාජයා දර්ශනය කරගැනීමද එම ආශීර්වාදයේ ප්‍රතිඵලයකි. ඇතිවෙන්නාවූ ස්වභාවික තත්ත්වයන්ට මුහුණ දෙනවා විනා, නිවීම උදෙසා උවමනාවෙන් දුක් විඳිය යුතුය යන වැරදි මතයට ඔබ නොඑන්න. මෙම අර්ථයන් ඔබ වැරදි අයුරින් ක්‍රියාත්මක කළොත් ඔබ මානසික රෝගියෙක් වීමටද ඉඩකඩ ඇත. එහෙයින් ඔබ නිරතුරුවම මහවැඩූ කල්‍යාණමිත්‍රයකුගෙන් ගුරුවරයෙකුගෙන් අවශ්‍ය උපදෙස් ලබාගන්න. ඔබ මෙය කියවා නාලාගිරි හස්තිරාජයා දකින්නට ආශාවෙන්, ඉහත ගාථාව කොතෙක් සජ්ඣායනය කළද, ඔබට ප්‍රතිඵල නොලැබෙනු ඇත. ආශාවෙන් අල්ලාගත් තැන ධර්මයේ ප්‍රතිඵල ශූන්‍ය වේ. ආශාව අතහැරුණු කළ ධර්මයේ ප්‍රතිඵල උදාවේ. ආශාව අතහැරෙන්නේ ප්‍රඥාව වැඩීමෙන් පමණක්මය. ප්‍රඥාව වැඩීමේ ජලය වන්නේද, පොහොර වන්නේද සතර සතිපට්ඨානයයි. සතරසතිපට්ඨානයෙන් ඔබ ලබන ඵලය අනිත්‍යයයි. අනිත්‍යය අවබෝධයෙන් ඔබට ලොව්තුරා බුදුසම්දුන්වද, නාලාගිරි හස්තිරාජයාවද, ඔබවද, සතර සතිපට්ඨානයද ලෝකයද අතහැරෙනු ඇත.

මේ සියල්ල මෙසේ සිදුවෙද්දී ගම්වැසියන් සිතුවේ භික්ෂුවමන්ත්‍ර ගුරුකම්දන්නවා කියාය. මන්ද භික්ෂුව ගමට වඩින්නට ගත් කාලයේ පටන් අලින් ගම් නොවැදුණු බැවිණි. මිනිසුන්ගේ මේ මතයන් නිවැරදි කිරීමට භික්ෂුවට අවශ්‍ය නොවීය. අනුන්ගේ සිත් තුළ ඇතිවන සිතිවිලි භික්ෂුවට අදාළ නොවේ. නමුත් මෙසේ ගතවෙද්දී එක් තරුණයෙක් භික්ෂුව මුණගැසීමට පැමිණ තමා හමුදාවට බැඳීමට යන නිසා ආරක්ෂාවට යන්ත්‍රයක් සකස් කරදෙන මෙන් ඉල්ලා සිටියේය. එහිදී භික්ෂුව එම තරුණයාට මෙසේ ප්‍රකාශ කළේය. පුතේ, මා දන්නේ එකම ආරක්ෂාවයි. ඒ තමයි තුණුරුවන්ගේ ආරක්ෂාව. වෙන ආරක්ෂාවක් කරන්න මම දන්නේ නැහැ"

ලෝකයේ ඔබව සුරකෙන ශ්‍රේෂ්ඨම ආරක්ෂාව මොකක්ද කියලා ඔබ දන්නවාද?

ඔබ සියල්ල අතහරින්න. ඔබට ආරක්ෂා කරන්න, ආරක්ෂාවෙන්න කිසිවක්ම නැහැ. සත්වයෙක් පුද්ගලයෙක් නැති තැනකට කුමන ආරක්ෂාවක්ද? කාගෙන් ආරක්ෂාවක්ද? කුමක් ආරක්ෂාකිරීමක්ද? මෙලොව සුරක්ෂිත එකම පුද්ගලයා ධර්මය අවබෝධකරගත්උත්තමයාය.

පිංවත් අයෙක් වරක් භික්ෂුවගෙන් ඇහුවා "ඇයි ඔබවහන්සේ පිරිත් කටපාඩමෙන් නොදන්නේ, පිරිත් පොතක් භාවිතා නොකරන්නේ?" කියලා. එවිට භික්ෂුව ලබාදුන් පිළිතුර තමයි, ඔබ භික්ෂුවගේ සිත, කය, වචනය ක්‍රියාත්මක වන ස්වරූපය දකින්න. ඒ ඔබ දකින්නේ පිරිවානා පොත් වහන්සේය කියලා. පිරිත් තිබෙන්නේ සජ්ඣායනා කිරීමට, ශ්‍රවණය කිරීමට පමණක් නොවේ. එහි හරය, සාරය, අර්ථය ජීවිතයට එකතු කරගැනීමටය. ඔබත් දක්ෂවෙන්න, ඔබගේ ජීවිතය පිරිත්පොතක් කරගන්න. එවිට ඔබේ ආරක්ෂාවට යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් අවශ්‍ය

නොවනු ඇත.

දිව්‍ය ලෝකෙ සැපයි... ඒත්?

(අතහැරීම 02) 18 වැනි කොටස

අවිද්‍යාව පැත්තට ලෝකය බර වෙන්නට බර වෙන්නට ලෝකයා බරවෙන්නේ තන්හාව දෙසටයි. අවිද්‍යාවේ දරුවා තමයි තන්හාව. අවිද්‍යාවේ බර නිසා තන්හාවේ ගොඩ සැප ලෙසයි සත්වයා දකින්නේ. ඒ නිසා සත්වයා නිරතුරුවම පිංකම් කරමින් ප්‍රාර්ථනා කරන්නේ දිව්‍ය ලෝක, මනුෂ්‍ය ලෝක සැපමයි. මොකද සැපයට ඇති තන්හාව නිසා අවිද්‍යාව විසින් ඔබව නිරතුරුවම දැනුවත් කරනවා, ලෝකය තුළ සැප තිබෙනවා කියලා. ඔබව ඉදිරියට පදවනවා සැප ස්පර්ශ කරන්න.

මනුෂ්‍ය ලෝකයේ සැප ගැන ඔබටඅත්දැකීම් තිබෙනවානේ. දුක් කන්දක් විසිතුරු දවටනයක ඔතා, විසිතුරු ඇඳුම් ආයිත්තම්, සුවඳ විලවුන්, යාන වාහන, ගෙවල් දොරවල්, පවා දරුවන් සමඟ සැපයැයි සිනාසෙමින් කරගසාගෙන යන මනුෂ්‍ය ලෝකයේ සැප, ඔබ අත්දකිනවා බොහොම කැමැත්තෙන්.

මේ කියන්න යන්නේ දිව්‍ය ලෝක සැප ගැනයි. ලොවතුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා එක දුප්පත් මනුෂ්‍යයෙක් සිටිනවා, ඔහුට තිබෙන්නේ දිරාගිය පැල්පතක්. එහි වහළයෙන් අහස පෙනෙනවා. බිරිඳ හරියට දර ඉපලක් වගේ. අහේනිය නිසාම විරූපි වෙලා. ධාන්‍ය මල්ලේ අඩියේ ධාන්‍ය ටිකක් තිබෙනවා. මේ මනුෂ්‍යයාට තිබෙන්නේ ඔය ටික පමණයි. මේ මනුෂ්‍යයාට පැවිදිවෙන්න සිතක් ආවත්, මේ දිරාගිය පැලත්, විරූපී බිරිඳත්, හිස් ධාන්‍ය මල්ලත් අතහැරීමට ඔහුට නොහැකිය කියලා. බලන්නකෝ තන්හාවේ ස්වභාවය.

අනවබෝධය නිසාම, කැඳර සිත් ඇතිව පිළුණු වී යන ආහාර බුදින, දෙතිස් කුණපයකින් යුතු කයක් දරන, දූවිලි අවු වැසි වලින් පීඩා විඳිමින් සැප සොයන අපි, ආහාර නිදි විවේකය නොලබා සැප සොයන අපි, සිතූ සිතූ සම්පත් පහළවන දිව්‍ය ලෝකයට ගියහොත් කුමකින් කුමක් වෙයිද?

දිව්‍ය ලෝකය කියන්නේ කාම පුරයක්. එහිදී සිතූ සිතූ සම්පත් ඔබට ලැබෙනවා. ඒ සියල්ල ඔබට ලැබෙන්නේ දිව්‍ය ඕජාව වශයෙන්. ඔබ කළ පිං වල ප්‍රමාණයට ඔබ ඉපදෙන දිව්‍ය තල වල පංති භේදයක්, පංති පරතරයක් තිබෙනවා. මේ භේදය නිසා දෙවියනුත් ගැටෙමින් අකුසල් කරගන්නවා. අතීතයේ කළ කුසල් අනුව තමයි ඔබට සැප ලැබෙන්නේ. ඔබ මෙහෙම හිතන්න. මනුෂ්‍යයෙක් ඉන්නවා... ඔහු දුප්පත්, උදේ සිට රාත්‍රිය වනතුරු ඔහු කුලී වැඩක් කරලා කීයක් හරි සොයාගෙන ගොස් බතුයි පරිප්පුයි කාලා ජීවත්වෙනවා. තව මනුෂ්‍යයෙක් ඉන්නවා, ඔහු හොඳ රජයේ රැකියාවක් කරලා හොඳ වැටුපක් අරගෙන අරකෙනාට වඩා හොඳ ජීවිතයක් ගතකරනවා. තව මනුෂ්‍යයෙක් ඉන්නවා ඔහු කෝටිපතියෙක්. ඔහු තරුපහේ හෝටලයකට ගොස් අවන්හලේ වාඩිවී වේටර්වරයෙක් පිළිගන්වන ආහාරවට්ටෝරුවටඇඟිල්ල තබනවා. මොහොතකින් ලෝකයේරසවත්ම ආහාරවේලක් ඔහුගේ මේසයට එනවා. බලන්න මේ තුන්දෙනාම මනුෂ්‍ය ලෝකයේ ඉපැදුණ මනුෂ්‍යයෝ. නමුත් සංසාරයේ කළ කුසල් අකුසල් නිසා සැප ලැබීමේ පරතරයක්, සීමාවක් තිබෙනවා. මිනිසුන් දස දෙනෙක් ගතහොත් එම

දසදෙනාට ලැබීමේ ස්වභාවයන් දස ආකාරයක් වෙනවා. දිව්‍ය ලෝකයෙත් මේ වගේමයි. අර කෝටිපතිව්‍යාපාරිකයා ආහාර වට්ටෝරුවේ ඇති තමා කැමැති ආහාර වර්ගයටඇඟිල්ල තැබූ සැනින් තමන් කැමතිම ආහාරය ලැබෙනවා වගේ දෙවියන්ට යම් සැපක් අවශ්‍ය යැයි සිතූ සැනින් එම සැපයෙන් දෙවියාව තෘප්තිමත් වෙනවා.

සුපිරි වෙළඳසලකට ගොස් කෙනෙක් රුපියල් දෙසීයක් ගෙවලා අයිස්ක්‍රීම් එකක් කනවා. තව දුප්පත් අයෙක් ගමේ කඩේට ගිහින් රුපියල් දහයේ අයිස්පලම් එකක් කනවා. දෙදෙනාම මනුෂ්‍යයෝ. දෙදෙනාම කන්නෙත් අයිස් ක්‍රීම්. නමුත් දෙදෙනා ලබනා රසයේ ස්වභාවයන් වෙනස්. ඒ දෙදෙනාගේ ලැබීමේ විවිධත්වයයි. පිංකර ඇති ස්වභාවයන්ට අනුව දෙවියන් දිව්‍ය ඕජාවෙන් තෘප්තිමත් වෙනවා. දෙවියන්ට තිබෙන්නේ ඕලාරික කයක්. එම ඕලාරික කය ඝන භාවයට පත්කරගැනීමට දිව්‍ය ලෝකවල දෙවියන්ට පුළුවන් වගේම, සමාධියෙන් පරිපූර්ණ, ප්‍රඥාව වඩන භික්ෂුවටද ඕලාරික භාවයෙන් මුදවා ඝන ස්වභාවයෙන් දෙවියන් දර්ශනය වෙයි. ඕලාරික කයක් තිබුණද දෙවියන්ට ආයතන හයක් (සළායතන) මනුෂ්‍යයාට සේම ඕලාරික කය ඇසුරුකොටගෙන පිහිටා ඇත. එහෙයින් මනුෂ්‍යයාට සේම නිරතුරුවම ඇතිවෙමින් නැතිවෙන සිත් දෙවියාටද හටගනී. කාම ලෝකයක සැප විහරණය කරන දෙවියාද සතර මහා ධාතූන්ගෙන් නිර්මානය වූ, අනිත්‍ය ඕලාරික කයක්ද, නිරතුරුවම ඇතිවෙමින් නැතිවී යන සිතක්ද ඇති සත්වයෙකි. දෙවියන් තුළද සත්වයෙක් පුද්ගලයෙක් නැත්තේය. දෙවියන් සැප විඳිනවා යනු, ක්‍රියාත්මක වෙනවා යනු ස්පර්ශය නිසා ඇතිවන වේදනාවක් පමණක්මය. මනුෂ්‍යයින් වශයෙන් මහා පිංකම් කරමින් ඔබ යන්නට ප්‍රාර්ථනා කරනා සුරපුරය ඔතැනය. දිව්‍ය ලෝක වල දිව්‍ය සැපය ලැබෙන්නේ දිව්‍ය ඕජාව ලෙසින්ය. දිව්‍ය ඕජාව යනු සුන්දර අත්දැකීමකි. දෙවියන් මෙම දිව්‍ය ඕජාව අතහැරීම උපරිමයෙන් පූර්ණ කළ භික්ෂුවටද, නිවන් අවබෝධය ලබාගත් භික්ෂුවටද අත්‍යවශ්‍යම අවස්ථාවලදී ලබාදෙයි.

ඔබ මෙහෙම සිතන්න. භික්ෂුවක් හුදෙකලා වනයේ කුටියක වැඩ සිටින විට ආහාර මද බව නිසා ලේ වල සීනි අඩුවී අසනීප වෙනවා. මෙය සිදුවන්නේ රාත්‍රියේදී. භික්ෂුව දැඩි වේදනාවට පත්වෙනවා. කුටිය තුළ ගිලන්පසක් සාදා ගැනීමට සීනි තේකොලවත් නැහැ. අත්හැරීමේ උපරිමය නිසා. භික්ෂුව මොකද කරන්නේ. රිදුම් දෙන, කලන්තයෙන් අප්‍රාණික වන කයත් සිතත් මගේ නොවෙයි. මට අයත් දෙයක් නොවේ කියලා අතහරිනවා. ලෝකයේ ශ්‍රේෂ්ඨම අතහැරීම ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවක් සිත කය අතහරින මොහොතේ ලෝකය කම්පා වෙනවා. ලෝකය නිරුද්ධ වෙනවා. එය දිව්‍ය ලෝක වලට දැනෙනවා. දෙවියන් සොයනවා මොකක්ද වුණේ කියලා. දෙවියන් දකිනවා අසවල් තැන වැඩසිටින භික්ෂුවගේ අතහැරීමයි මේ දැනුනේ කියලා. ඒ මොහොතේම දිව්‍ය ඕජාව දෙවියන් එම භික්ෂුවට සමාධිය තුළින් ලබාදෙනවා. දිව්‍ය ඕජාව භික්ෂුව විඳින්නේ මනසින්. සීනි අවශ්‍ය නම් භික්ෂුවගේ දෝතටරන්වන් පාට සීනි අහුරක් ලැබෙනවා. අත රන් වගේ දිලිසෙන භික්ෂුව මනසින් එය විඳිනවා. වළඳනවා. පියෙවි සිහියෙන් අවධියේදී නොවෙයි මෙය වෙන්නේ. සමාධිගත නින්දේදියි. භික්ෂුව පැය කිහිපයකින් අවධිවන්නේ ශරීරයේ තිබූ රෝගී බව දුරුවීපූර්ණ සුවය ලැබීමෙන්. මොකද ශරීරයට අවශ්‍යව තිබූ සීනි ප්‍රමාණය දිව්‍ය ඕජාව වශයෙන් භික්ෂුවගේ ශරීරයට ලැබුණු නිසා. හැබැයි දෙවියන් ඕජාව දෙන්නේ සිත කය අතහැරියොත් පමණයි කියලයි භික්ෂුව සිතන්නේ. ප්‍රඥාව හොඳින් වැඩීමෙන් පමණයි, අවංකවම කය, සිත අතහැරිය හැකේක්. එහෙම වුණොත් තමයි එම කම්පනය දිව්‍ය ලෝකයට දැනෙන්නේ.

දිව්‍ය ලෝකයේ නිරතුරුවමසජ්ජායනා කරන හඬ, විටෙක පිරිත් හඬේ ස්වභාවයෙන්ද තවත් වේලාවන්ට කෝවිල් වල පූජාව තබනකොට ශබ්ද පූජාවේදී ලොකු නලාවකින් නැගෙන හඬේ ස්වභාවයෙන්ද ඇසෙනවා. වනයෙ හුදෙකලා කුටි වලදී මෙම හඬ රාත්‍රී යාමයේදී හොඳින් ඇසිය හැකිය. මුහුද ගංගා දිය ඇලි අසල අපි වාඩිවී සිටියදී මොනතරම් මිහිරි රිද්මයන් අපට ඇසෙනවාද. කැලයක රාත්‍රියට සුළඟ ඇති වෙලාවට අපූරු සංගීතයන් මැවෙනවා. මේවා කවුරුවත් කරන, වයන දේවල් නොවේ. පස්සය නිසා ඇතිවන වේදනාවන්. කාම ලෝකයක් වුවද පිනැති දෙවියන් ජීවත්වන නිසා එම පිං මහිමය නිසාම මෙවැනි සජ්ජායනා, සංගීත රිද්ම ස්වභාවයන් දිව්‍යතලවල රැව්දෙනවා. අර ගඟේ මුහුදේ දිය ඇල්ලේ රිද්මය වගේ. පිනේ ආශ්චර්යය නිසාම දෙවියන් ආස කරන හඬ රිද්මය, ඒ මොහොතේම ඇතිවෙලා දෙවියන් තෘප්තිමත් වෙනවා. දැන් ඔබ සිතන්නකෝ මෙවැනි කාම ලෝකයක ඔබ උපත ලැබුවොත් මෙම කාමයෙන් ඔබට අත්මිදෙන්න පුළුවන් වෙයිද?

ඔබ මනුෂ්‍ය ලෝකයේ පිංකම් කර ලැබූ දිව්‍ය කාමසම්පත නිසාම පිරිහීමටපත්වී නැවත සතර අපායට වැටීමේ ඉඩකඩ ඉතාමත් වැඩිය. දිව්‍ය ලෝකවල බුද්ධ රත්නයද, සංඝ රත්නයද වැඩ සිටින්නේ නැත. නමුත් ධර්මරත්නය වැඩ සිටියි. එහෙත් ධර්මය මතුකර පෙන්වීමට බුද්ධ රත්නයද, සංඝ රත්නයද වැඩ නොසිටින නිසා දෙවියෝ අනාථයෝය. එහෙත් දෙවියන් දක්ෂ නම් සංඝ රත්නය වැඩසිටින මනුෂ්‍ය ලෝකයට පැමිණ සද්ධර්මයශ්‍රවණය කර අවබෝධය ලැබිය හැකිය.

භික්ෂුවක් කැලයේ හුදෙකලා කුටියක වැඩ සිටින විට රාත්‍රියේ පැමිණි දිව්‍යාංගනාවක් ගැන ඔබට කියන්නම්. එක් රාත්‍රියක භික්ෂුවක් සමාධියෙන් පසුවන විට දිව්‍යාංගනාවක් දර්ශනය විය. ඇය සිටියේ පාවෙමින්ය. වැඩි ඉහළක නොවේ. ඇයගේ ස්වභාවය අති සුන්දරය. ඇය සිහින්ය. දිගැටිය. දිග කේශ කලාපයකින් යුක්තය. එය පාදාන්තය දක්වා දිගය. ඇය ප්‍රභාශ්වර සුදු පැහැතිය. පැහැදිලි සුදු වලාකුළක පාටය. ඇයගේ සියුම් ඝන කය ප්‍රභාෂ්වර සුදු පැහැයෙන් යුක්ත විය. හරියට ශරීරයට හිරවෙන සුදු දිග ගවුමක් ඇඳසිටියා සේය. ඇයගේ ශරීරයේ දෙපා ප්‍රදේශය සිහින් වී ගොස් තිබිණි. ඇය භික්ෂුව ඉදිරියේ තරමක ඉහළින් සරුංගලයක් පාවෙනවා සේ පාවෙමින් සිටියාය. මෙවැනි රූප දර්ශනය වීමේදී භික්ෂුවගේස්වභාවය මේ ආකාරයට පිං දීමය. "මෙම භික්ෂුවගෙන් ඔබට යම් කුසලයක්, පිනක් ගතහැකි නම් එය භික්ෂුවගේ යැයි නොසිතා ඔබේ යැයි සිතා ඔබ අනුමෝදන් වී සුවපත්වෙන්න" භික්ෂුව මෙසේ සිතුවිට ඇය නැතිව ගියා.

දෙවැනි දවසේ රාත්‍රියේත් ඇය පෙර දින සේමදර්ශනය වුණා පෙරදින සිටි ස්වරූපයෙන්ම. එදාද භික්ෂුව පෙරසේම පිං දුන්නා. ඇය නැවතත් නොපෙනී ගියා. මැය මෙසේ දර්ශනය වුවද භික්ෂුවට ඇය ගැන කුතුහලයක්, ඇය දැකීමේ කැමැත්තක් නොතිබිණි. ඇය ගැන මතකයද, අවධානයක්ද නොතිබිණි. නොසිතූ මොහොතක ඇයදර්ශනය වනවා පමණි. මේ වන විට භික්ෂුව සිටියේ දිව්‍ය ලෝක සංඥාවලින් මිදීය. දිව්‍ය ලෝකයත්, එහි ජීවත්වන දෙවියනුත් අසූචිගොඩක් මත ජීවත්වන පණුකැළක් ලෙස භික්ෂුව අවබෝධයෙන් දැනසිටියේය. එනිසා දිව්‍යාංගනාව භික්ෂුවට තවත් අනිත්‍යභාවයට පත්වන රූපයක් පමණක් විය. මෙසේ පසුවෙද්දී තුන්වැනි දින රාත්‍රියේ ඇය පෙරසේම දර්ශනය විය. තුන්වැනි දිනයේදී භික්ෂුව ඇයට පෙරසේම පිං දුන්නේය. ඇය නොපෙනී ගියාය. ඇය පැමිණි විට විනාඩි දහයක පමණ කාලයක් භික්ෂුව ඉදිරියේ පාවෙමින් සිටින්නීය. හතරවැනි දිනයේදී ඇය පෙර ස්වභාවයෙන්ම භික්ෂුවට දර්ශනය විය. භික්ෂුව දැන් ඇය ගැන

අවබෝධය ලබා අවසන්ය. ඇයට දින තුනක් පිං දුන්නද ඇයට පිං අනුමෝදන් වූයේ නැත. ඇයට භික්ෂුව දුන් පිං අනුමෝදන් වූවානම් පළවෙනි දිනයට වඩා දෙවැනි දිනයේදී ප්‍රභාශ්වර විය යුතුය. ඇයගේ දිව්‍යශ්‍රීය ධනාත්මක බවක් විද්‍යාමාන විය යුතුය. එහෙත් එය එසේ නොවිණ. ඇය මුල් දිනයේ දර්ශනය වූ ස්වරූපයෙන්ම හතරවැනි දිනයේදීද දර්ශනය විය. මෙයින් පැහැදිලිවන්නේ ඇයට පිං අනුමෝදන් නොවූ බවයි. මෙම දිව්‍යාංගනාව අනුන්ගේ පිං අවශ්‍ය නැති, පිනෙන් පිරුණු සශ්‍රීක දිව්‍ය ලෝකයේ වැඩ වසන දිව්‍යාංගනාවක් බවයි. ඇයට භික්ෂුව දුන් පිං අවශ්‍ය නැත. ඇයට අවශ්‍ය භික්ෂුව දකිමින් සතුටු වීමටය. නැතහොත් භික්ෂුවට ගරු කිරීමට, නමස්කාර කිරීමටද විය හැකිය. මේ දෙකින් කුමක් සඳහාද යන්න භික්ෂුවට ඇයගේ ඉරියව් වලින් දැනගත නොහැකි විය. ඇය සතුටින් ප්‍රමෝදයෙන් සිටින බව පමණක් භික්ෂුව හඳුනාගත්තේය. හතරවැනි දිනයේදී භික්ෂුව ඇයට මෙසේ අවවාද කළේය. "ඔබ මොකක්ද මේ කරන්නේ. ඔබ විහිළුවක් කරනවාද? ඔබ කවද? සමහර විට ඔබ භික්ෂුවගේ මිය ගිය මවුද දන්නේ නැහැ. වෙන දිව්‍යාංගනාවක්ද දන්නෙත් නැහැ. මේ භික්ෂුව හෙට අපවත් වෙන්න පුළුවන්. එහෙම වුණොත් ඔබට භික්ෂුව දැකලා සතුටුවෙන්න පුළුවන් කමක් නැහැ. ඔබට පිං අවශ්‍ය වුවද දෙන්න කෙනෙකුත් නැහැ. ඔබ ඔය දිව්‍ය සැප අවසන් වුණාම අසරණ වේවි. නැවත සතර අපායට වැටේවි. එදාට ඔබව බේරාගන්න කවුරුවත් නැහැ. ඒ නිසා ඔබ මේ පිං අනුමෝදන් වෙලා සැපවත් වෙන්න. සතර අපායෙන් මිදෙන්න. මේ භික්ෂුව සේම අනිත්‍ය වඩන්න" කියලා භික්ෂුව අනුමෝදනාවක් කළා. මෙසේ අවවාද කළ ද ඇය පස්වැනි දිනයේ රාත්‍රියේද පෙර ස්වභාවයෙන්ම භික්ෂුව ඉදිරියේ පාවෙමින් සිටියාය. ඇයට පිං අනවශ්‍ය බව දැන් ස්ථිරය. ඇයට දිය යුත්තේ පිං නොව, ප්‍රඥව වැඩීමට සංඥවක් බව භික්ෂුවට අවබෝධ විය. මන්ද අනුන්ගේ පිං අනවශ්‍ය, මහා පිනැති දිව්‍යාංගනාවක් නිසාය. ඇය සසර ප්‍රඥව වඩා ඇත. එහෙත් දිව්‍ය ලෝකයේ කාමසම්පත් මැද කෙළිලොල් දිවියක් ගතකරන නිසා ප්‍රඥව යටපත්වී සැඟවීගොස් තිබේ. භික්ෂුව දිව්‍යාංගනාවගේ සැඟවී තිබූ ප්‍රඥව මතුකර දීමට ඇයව මෙසේ දැනුවත් කළේය.

"පුතේ ඔබට මේ භික්ෂුව කථාකරන අවසාන අවස්ථාව. ඔබට දෙන අවසාන අවවාදය. දින හතරක්ම භික්ෂුව ඔබට පිං දුන්නා. ඔබ ඒවා අනුමෝදන් වූයේ නැහැ. ඔබ භාග්‍යවන්තියක්. ඔබ මේ භික්ෂුව දෙස හොඳින් බලන්න. භික්ෂුව පරිහරණය කරන තුන් සිවුර දෙස හොඳින් බලන්න. එක වේලෙන් පමණක් පිණ්ඩපාතයෙන් යැපෙන මේ පාත්‍රය දෙස හොඳින් බලන්න. මේ සයනය, මේ කුටිය දෙස බලන්න. භික්ෂුවගේ ප්‍රතිපදාව දෙස බලන්න. භික්ෂුවගේ අතහැරීම දෙස බලන්න. මේ භික්ෂුව අනිත්‍ය වඩන්නේ යම් සේද ඔබද ඔය දිව්‍ය සැප, දිව්‍ය ඕජාව, දිව්‍ය ශරීරය, ඔය රූපය අනිත්‍ය බව දකින්න. ඔය ඇස, කන, නාසය, දිව, ඕලාරික ශරීරය, සිත අනිත්‍ය බව දකින්න. කවදාහරි දිනයක ඔය දිව්‍ය සැප අනිත්‍යභාවයට පත්වී ඔබ දිව්‍ය ලෝකයෙන් චුතවේවි. දිව්‍ය සැප අහිමි වන බව දැකලා ඔබ එදාට හඬාවැටේවි. ඔබ ඔය සැපෙන් මිදිලා සතර අපායට වැටේවි. පුතේ ඔබ ඔය විඳින සිත ඔබේ නොවෙයි කියලා අතහරින්න. ඔය ස්වර් ̈ණහංසියක් බඳු කය ඔබට අයිති නැති අනිත්‍යයට අයත් දෙයක් යැයි කියලා අතහරින්න. සියල්ල අනිත්‍ය බව දකින්න. මේ භික්ෂුව ඔබව දකින අනිත්‍ය සංඥවෙන්ම ඔබ භික්ෂුව දෙස බලන්න. මේ භික්ෂුවද මැරෙන, ලෙඩ වෙන, වයසට යන ස්වභාවයෙන් යුක්ත බව දකින්න. මේ භික්ෂුව දෙස නැවැත නැවත බලන්න. ඔබ අවබෝධය ලබන්න. ධර්මය දැක්ක කෙනෙක් වෙන්න. ඔබ සෝවාන් ඵලයට පත්වෙන්න. දිව්‍ය ලෝකයෙන්, සතර අපායෙන් මිදෙන්න. බ්‍රහ්ම ලෝකයට ගොස්කල්ප ගණනක් වුවද ගතකරන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. මොකද කවදාවත් ඔබ නැවත සතර අපායට වැටෙන්නේ නැහැ. භික්ෂුවට අවශ්‍ය ඔබව සතර අපායෙන් මුදවන්න පුතේ. මගෙ පුතේ භික්ෂුව කියන දෙය ඔබ අසන්න" භික්ෂුව රාත්‍රියේ පැය කාලක් පමණ ඉහත

බණ ශබ්ද නගලා දේශනා කළා. එදායින් පසු නැවත එම දිව්‍යාංගනාව නොපැමිණියාය. නොදුටුවේය. ඇයට කුමක් වූයේ දැයි භික්ෂුව නොදනී. එහෙත් ඇය සසර ප්‍රඥාව වඩා පුරුෂ දිව්‍යාංගනාවක් නිසා භික්ෂුව විසින් දේශනා කරන ලද අනිත්‍ය සංඥාව ඒ මොහොතේම අවබෝධ වීමෙන් ඇය දිව්‍ය ආත්මභාවයෙන් මිදී බ්‍රහ්ම ලෝකයේ උපතක් ලබන්නට ඇතැයි භික්ෂුව අනුමාන කරයි. එහෙත් එය නිවැරදිව නොදනිමි.

භික්ෂුවට දිව්‍යාංගනාව දර්ශනය වන්නේ සමාධිය තුළ සිටියදීය. එහෙත් ඇයට බණ කියන විට ඇය සමඟ කථා කරන විට සමාධිය නැතිවන නිසා ඇයව දර්ශනය නොවේ. එහෙත් ඇය එහි සිටින බව භික්ෂුව දනී. එම දිව්‍යාංගනාවගේ සුකුමාල බව, සැහැල්ලුව, ලාලිත්‍යය, රිද්මය කොතෙක්ද කිවහොත් ඇය පෘතග්ජනස්වභාවයේ කෙනෙකුට කාමයේ පාරාදීසයකි. දිව්‍ය ලෝකය යනු එවැනි කාම පාරාදීසයකි. මෙවැනි කාම ලෝකයක් ඔබ නිරතුරුවමප්‍රාර්ථනා කරන්නේ නම් එය මහා මුලාවකි. දිව්‍ය සැප නිරතුරුවම ඔබට අකුසල් රැස්කර දෙන්නකි. මන්ද ඔබ තුළ භවයට ඇති කැමැත්ත නිසා නිරතුරුවම තන්හාවෙන් සිත පිරී පවතී. දිව්‍ය සැප විඳීම යනු මෙම කාම ලෝකය තන්හාවෙන් බදාගැනීමයි. රස විඳීමයි. ඒ තන්හාව නිසා ඇතිවන අකුසල් වලින් ඔබව නැවත සතර අපායට ගාල් කරයි. එහෙත් මෙම දිව්‍යාංගනාව මිනිස් ආත්ම වල ඉපිද ප්‍රඥාව වඩා තිබුණු නිසා ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීමට ඇයට සමහරවිට හැකිවිය. ඔබද කුමන පිංකම කළද එම පිංකම්වල අනිත්‍ය ස්වභාවය, අනිත්‍ය සංඥාව වැඩීමට සරළව හෝ පුරුදුවෙන්න. දිනකට ඔබ පැය කාලක් අනිත්‍ය සංඥාව වැඩුවොත් එය ඔබේ ආධ්‍යාත්මය තුළ තැන්පත් වෙලා කවදාහරි දවසක ඔබට සසර දුකින් ගැලවෙන්න උපකාර වෙනවා.

ඉහත දිව්‍යාංගනාවත් අතීත බව වල පිංකම් කරලා අනිත්‍ය සංඥාව සරළව හෝ වඩා තිබූ නිසයි පිංකම් නිසා දිව්‍ය සැපත්, අනිත්‍ය සංඥාව වැඩීම නිසා (ලැබුණා නම්) බ්‍රහ්ම සැපත් ලැබුණේ. දිව්‍ය ලෝකවල වැඩ සිටින දෙවිවරු තුළ මනුෂ්‍ය ලෝකයේදී වඩනලද ප්‍රඥාව ඇත. එහෙත් දිව්‍ය ලෝකයේ කාමසම්පත් නිසා ප්‍රඥාව යටපත් වේ. මෙම දිව්‍යාංගනාවද භික්ෂුව ඉදිරියට පැමිණියේ සතුටුවීම සඳහාය. එහෙත් භික්ෂුව ඇයට සුදුසුම කමටහනින් යටපත්ව තිබූ ප්‍රඥාව මතුකර දුන්නායැයි අනුමාන කරමි. මේ සෑම දෙයක්ම ධර්මයේ ආශ්චර්යයන්ය. භික්ෂුවගේ ආශ්චර්යයක් නොවේ. ඔබත් සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ල ලැබේවි. සියල්ලම ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධකර ඇති නිසාය.

ඔබ ලක්ෂ ගණන් ධනය කාලය වියදම් කර පිංකම් සිදුකරමින් ප්‍රාර්ථනා කරන ලෙස ස්ථිරවම ඔබ මහා සැප සහිත දෙවියෙක්, දිව්‍යාංගනාවක් වුනොත් මෙවැනි සුකුමාල දිව්‍ය කුමාරයන්, කුමරියන් ඔබව කුල්මත් කරාවී. ඔබව පිස්සු වට්ටාවී. අවසානයේ ඔබට හිමිවන්නේ භවයේ පිස්සන්කොටුව වන සතර අපායමය. වර්තමානයේද භවයේ පිස්සන් කොටුවේදුක්විඳින්නේ අතීතයේ අනන්ත අප්‍රමාණ දිව්‍ය මනුෂ්‍ය සැප විඳි කෙළිලොල් දිව්‍ය දිව්‍යාංගනාවන්ය. එදා දිව්‍ය ඕජාව, රාජ භෝජන වැළ» ඔවුන් අද සතර අපායේ සෙම්, සොටු, මළමුත්‍රා, ගින්දර, පුන්නක්කු, තණකොල අනුබව කරයි. මෙය නිමා නොවන චක්‍රයකි. පටන් ගැන්මක්, අවසානයක් නොමැත. ඔබට ඇත්තේ වටේ යැම පමණකි. ඔබට මින් ගැලවීමට නම් චක්‍රයම නිවා දැමිය යුතුය. ඔබම අවුලුවාගන්නා ගින්න කවදාහෝ දිනයක ඔබම නිවාගත යුතුය. එය වෙන අයකුට කළ නොහැක්කකි. මන්ද ගිණි අවුලුවන්නේ ඔබම නිසාය. ඔබම අවුලුවාගන්නා ගින්නකින් ඔබම දැවෙන අංක එකේ මෝහබරිතසත්වයා පෘතග්ජනසත්වයාය.

ඔබට ඉහත කථාව කියවන විට හිතෙන්නට ඇති අනේ මටත් මේ අත්දැකීම ලබන්නට ඇත්නම් කියලා. ඔබ එහෙම සිතුවොත් ඔබට මෙම අත්දැකීම කවදාවත් ලබන්න බැහැ. ඔබට එම අත්දැකීම ලබන්න නම් ඇතිවූ එම කෙලෙස් සිත අනිත්‍ය වශයෙන් දැකලා අතහරින්නට ඕනේ. එවිට ඔබට දිව්‍යාංගනාවක් නොව දිව්‍යලෝකයම දැකිය හැකිය. එහෙත් ඔබ ජයග්‍රාහකයෙක් වන්නේ දිව්‍යාංගනාවක්, දිව්‍ය ලෝකය දැකීමෙන් නොව දිව්‍ය ලෝකයම අතහැරීමෙන්ය. දිව්‍ය සැප දකින, පතන සිත තිබෙනතාක් ඔබට දිව්‍ය ලෝකය අත්හල නොහැක. ඔබ එහි පදිංචිකරුවෙකි, සාමාජිකයෙකි. කුළිය, සාමාජිකත්වය ඉවරවුනු තැන, වෙන තැනක් සොයා යා යුතුය. අලුත් තැන සොයාගන්නේද ඔබ විසින්මය. මේ මොහොතේ ඔබ ඉන්නා තැන තෝරාගන්නේද ඔබමය. ඔබම තෝරාගන්නා ජීවිතයට මොනතරම් ප්‍රශ්න තිබුණද ඔබ නොගැටෙන්න. ඔබ ගැටුණොත් ඔබේම තෝරාගැනීමට ඔබ කරන ද්‍රෝහිකමකි.

මිනිසුන්ගෙන් සියයට සියයක්ම රෝගී වන්නේඉන්ද්‍රියන් හය පිනවීමට යෑම නිසාය. දිවට, කයට රස පහස සොයන්නට යෑම නිසාය. දියවැඩියාව, අංශභාගය, කොලෙස්ටරෝල්, ලිංගික රෝග, සමේ රෝග.....

රිය අනතුරකින් අංගවිකල වන රෝගියාට එසේ වූයේ රියදුරා මත්වතුර බීම නිසාය, නැතිනම් අධික වේගය නිසාය. එසේත් නැතිනම් පදිකයාගේ නොසැලකිල්ල නිසාය. මේ සියල්ල තුළ තිබෙන්නේ තන්හාවය. අපි වේගයෙන් යන්නේ යමක් ඉක්මනින්ස්පර්ශ කිරීමටය. වැඩිපුර අයිතිකර ගැනීමටය. පළවෙනියා වීමටය. සියල්ල තුළ තන්හාවයි තිබෙන්නේ. සැප සෙවීමේ මෙහෙයුම නිසා මිනිසා දුකට පත්වී රෝගීභාවයට පත්වී අසරණවනවා සේම, දිව්‍ය ලෝකයේ දෙවියන්ද දිව්‍යාංගනාවන්ද සැප පසුපස හඹා යෑම නිසා මනුෂ්‍යයන් සේම පිරිහීමට පත්වී දුකට ඇද වැටේ. ඔබ පතන ආශ්චර්යමත් දිව්‍ය සැප ගැන ඔබ විවේකීව නැවත සිතාබලන්න. දිව්‍ය ලෝක යනු ගොම පිඩකි. දෙවියන් යනු එය අනුභව කරමින් පෘෂ්ටිමත් වන පණු කැළයි. ගොම කමින් සතුටුවෙමින් පනුවා හොඳින් වැඩුනු පසු ගොම තලිය ඉවරවේ. පනුවන්ට සිදුවන්නේ තවත් සතෙකුගේ ගොදුරක් වීමට පමණි. දිව්‍ය සැපත ඉහත ස්වභාවයමය. එහෙත් දිව්‍ය ලෝකයේද ශීලයෙන් පරිපූර්ණ, මතු පාරමී ධර්මයන් වඩන මහේශාඛ්‍ය දෙවිවරු සිටිති. ඒ අය තමන් පුහුණු කරන ලද ශීලයේ ආනුභාවයෙන් සිත, කය, වචනය හික්මවාගෙන සුදුසු කාලය පැමිණෙන තුරු හික්මීමෙන් යුතුව දිව්‍ය ලෝකයේ දිව්‍ය සැප අනුභව කරති. මෙම දෙවිවරු තුළ තිබෙන හික්මීමද තන්හාවකි. එම තන්හාව නම් මතු සසර බලාපොරොත්තු වනප්‍රාර්ථනාවයි. කැමැත්තයි. පාරමී අරමුණයි.

මේ කැඩපතින් ඔබේ මුහුණත් බලන්න

සත්වයා හිරිකිතයකින් තොරව මොන තරම් අකුසල සිදුකරගන්නවාද? මිනිසුන් පංච සීලය පවා කඩ කරමින් පව් සිදුකරගන්නේ හරියට බලපත්‍රයක් අරගෙන වගේ. මේ අයට මේවා කරන්න ලැජ්ජාවක් බියක් නැහැ. විශේෂයෙන් සත්ව ඝාතනය, කාමය වරදවා හැසිරීම මහා දුක් ගෙනදෙන අකුසල්. හුඟක් වෙලාවට අනෙක් වැරදි සිදුවෙන්නෙත් මේ වැරදි දෙක නිසයි. නියත වශයෙන්ම මේ වැරදි වල යෙදෙන අය ඒවායේ විපාක වශයෙන්ප්‍රේත, භූත ආත්ම වල ඉපැදෙනවාමය. මීට අමතරව, තන්හාව ප්‍රේත ලෝකයට ඉතා හොඳ සුදුසුකමකි.

දේපළ, අඹුදරුවන් ගැන ඔබ තුළ ඇති තණ්හාව, ඒවාට ඇති ආශාව අතහැරීමට බැරිකම, ඔබ පිං කළද ප්‍රේත ආත්ම වලට වැටීමට අතිශයින්ම හේතුවේ. දිව්‍ය, බ්‍රහ්ම ලෝක සංඥවන් දැකිය හැකේක් ප්‍රභාශ්වර ආලෝක සහිතවය. ඒ අය ආලෝකමත්ය. එහෙත් ප්‍රේත ලෝකයේ සංඥ නිරතුරුවම අඳුරුය. විකෘතිය. ගුප්තය. තැතිගත් ස්වභාවයෙන් යුක්තය. කිසිදු ප්‍රේතයකුගේ ස්වරූපයේ සතුටු ස්වභායක් දැකිය නොහැකිය. මහා ප්‍රශ්නාර්ථයකට මැදිවී සිටින්නා සේ වික්ෂිප්ත ගුප්ත ස්වරූපයක් දර්ශනය වේ. එකිනෙකාට වෙනස්වූ විකෘති ස්වභාවයන්ගේ මුහුණු ප්‍රේතයන්ට ඇත. මුහුණේ සෑම දශමයක්ම විකෘතිය. සමහර මුහුණු පැතලිය. දිගය. රවුම්ය. ඇස, කණ, නාසය, නළල, හිස ඇත්තේ විකෘති ස්වභාවයන්ගෙන් යුතුවය. ප්‍රේතයා යනු විකෘති නිර්මාණයකි. ප්‍රේතයාට තිබෙන්නේ ඕලාරික කයකි. සමාධිය වඩන්නාට එම ඕලාරික කය සියුම් සණ ස්වභාවයෙන් දැකිය හැකිය. ප්‍රේතයාගේ ඕලාරික කය තුළ මනුෂ්‍යයාට, දෙවියාට, බ්‍රහ්මයාට සේම ආයතන හය පිහිටා ඇත.

එහෙයින් ප්‍රේතයාටද සිත් ඇතිවේ. ප්‍රේතයා අනිත්‍යභාවයට පත්වෙන සතර මහා ධාතූන්ගෙන් සකස්වුණ, ඕලාරික කයක්ද, ඇතිවෙමින් නැතිවෙන සිතක්ද ඇති සත්වයෙකි. ප්‍රේත ලෝකයේ ප්‍රේතයෝ සහ ප්‍රේතියෝදෙකොටයාසයම සිටිති. මේ අය නිරතුරුවම අඳුර සහ ගුප්ත භාවය තුළ ජීවත්වන නිසා ඒ අයට නිතරම බය සහ ගැටීම තුළ ජීවත්වීමට සිදුවේ. එය අතීත කර්මයේ ප්‍රතිඵලයකි. බය සහ ගැටීම තුළ නිරතුරුවම ජීවත්වීම නිසා, ප්‍රේතයාගේ සිත වෛරය, ක්‍රෝධය, තණ්හාව වැනි අකුසල් ධර්මයෙන්ගන් පිරී පවතී. ප්‍රේත ලෝකයේ ජීවත්වන සෑම තත්පරයකදීම ඔහු රැස්කරන්නේ අකුසල්ය. කුසල් අකුසල් ගැන ප්‍රේතයාට හැඟීමක් නොමැත. එය ඔහුගේ කර්මයයි. දිව්‍ය, මිනිස් ආත්මවල ඉපිද, කරගත් කර්මයන් හේතුවෙන් ප්‍රේත ලෝකයට බැසගන්නාප්‍රේතයෝ විවිධ ස්වභාවයන්ගෙන් යුක්තය.

භික්ෂුවට හමුවූ ප්‍රේතයන්ගේස්වභාවය හරිම අපූරුය. එක් ප්‍රේතියකගේ මුඛය නොමැත. තොල් එකට ඇලී ගොස්ය. ඒ පෙර සංසාරයේ දන් නොදීම සහ අනුන්ව දන් නොදීමට පෙළඹවීමේ කර්ම විපාක නිසා විය යුතුය. තවත් ප්‍රේතයෙකේග් ඇස්වලින් ගින්දර නිකුත්වේ. ඇස් නිරතුරුවම ගිනි ගනී. අනුන්ගේ ජයග්‍රහණ, දියුණුව ඉවසීමට නොහැකිව කළ අකුසල් නිසා මෙසේ වූවා කිය හැකිය.

තවත් ප්‍රේතයෙකේග් ඇස් වලින් සුදු ආලෝක දෙකක් නිකුත් වේ. බල්බ දෙකක් සේය. අධික තණ්හාව නිසා ප්‍රේත ලෝකයට බැසගත්තද, අනුනට ධර්මය කියාදීම, අධ්‍යාපනය ලබාදීම වැනි හේතූන් නිසා ඇස්වලින් ආලෝකය නිකුත්වනවා වියහැකිය. තවත් අවස්ථාවක විකෘති නොවූ ශරීරයක් සහිත, හිස මුඩුකරන ලද, රවුම් පැහැපත් මුහුණක් සහිත, සිවුරක් දරාගත් භික්ෂු

ප්‍රේතයෙක් ආරණ්‍ය බිමකදී දුටුවේය. පෙර ආත්මයේ ඔහු භික්ෂුවක් විය හැකිය. සිවුපසයට අධික තණ්හාව හේතුවෙන් ප්‍රේත ලෝකයට බැසගත්තද, කරන ලද පිං සහ ආමිස පූජාවන් නිසා විකෘති නොවූ ශරීරයක් ලැබුවා විය හැකිය. මෙම ආරණ්‍ය භූමියේදීම සුදු ජාතික ප්‍රේතයෙක් හමුවිය. ඔහු විදේශීය බටහිර ජාතික ස්වරූපයෙන්ම යුක්ත විය. ඔහුද විකෘති ස්වභායක් නොමැති ශරීරයක් ඇති ප්‍රේතයෙක් වෙයි. ඔහු සමහරවිට ගිහි භාවයෙන් ආරණ්‍යයේ සිටි විදේශිකයෙක් හෝ මෙමඉඩම්වල අතීත අයිතිකාර විදේශිකයෙක් වීමට පුළුවන්. එහෙත් එම සුදු ජාතික ප්‍රේතයා කරන ලද පිං හේතුවෙන් විකෘති නොවූ ප්‍රේත ආත්මයක් ලැබුවද අවසාන චුති සිතේ ඇතිවූ තණ්හාව නිසා ප්‍රේත ලෝකයට බැසගත්තා විය හැකිය.

ප්‍රේතයන් නිතරම කපුටන් සේ කණ්ඩායම් වශයෙන් සිටීමටප්‍රිය කරන පිරිසකි. ඔවුන් දර්ශනය වීමේදී සමහරවිට සිය ගණන් සිනමා පටයක් සේ දර්ශනය වේ.

ප්‍රේත ලෝකයේ මහා අරුමය සත්ව ප්‍රේතයන්ද සිටීමයි. එක් ආරණ්‍ය බිමක භික්ෂුව වැඩසිටියදී ප්‍රේත හෝ භූත ස්වභාවයේ මීහරකුන්තුන්දෙනෙක් දුටුවේය. තුන්දෙනාගේම පැහැය ලා දුඹුරු පාටය. කිසිදු විකෘතිභාවයක් නොමැතිය. සාමාන්‍ය මීහරක් ස්වභාවයේය. එක පේලියට මේ භූත මීහරක් තුන්දෙනා හිස සොලවමින් සිටියහ. මොවුනගේ කටවල් ඇලී තිබිණි. භික්ෂුව මේ ගැන සොයා බලන විට දැනගන්නට ලැබුණේ එම ආරණ්‍ය පිහිටුවීමට පෙර එම ආරණ්‍ය පිහිටි කැළය, මස් සඳහා හොර හරක් සහ මී හරක් මරණ ප්‍රසිද්ධ ස්ථානයක්ව තිබූ බවයි. ඒ මීට වසර 50 කට පෙරදීය. අතීතයේ හොර හරක් මැරූ මිනිසුන්, ඒ අය කරන ලද ප්‍රාණඝාත අකුසලය නිසා භූත මී හරක් ලෙස උපත ලබා ඇතැයි අනුමාන කළ හැකිය. බලන්නකෝ කර්මය පසුපසින් එන ස්වභාවය. ඔබ ආසා කළ ස්වරූපයෙන්ම කර්මය ඔබට විපාක දෙනවා. භූත මීහරකුන්ගේ කටවල් ඇලී තිබුණේ ඔවුනට ආහාර නොලැබීමටය. එයද කර්මයේ විපාකයකි. ඔය භූත ආත්මයෙන් මිදෙන තෙක් එම භූත මීහරක් නිරාහාරව දුක් විඳී. මේ ආකාරයෙන් භූත කුකුලන්ද, වනගත කුටි වලදී භූත මුවන්ද දර්ශනය වී ඇත. මේ සියල්ලන්ම පෙර මිනිස් ආත්ම වල ඉපිද සත්ව ඝාතනය කර හරක්, මී හරක්, කුකුළන්, මුවන් මරා මස් කමින් ජීවත් වූ සතුටු වූ මිනිසුන්ය. ඔවුනට ඔවුන් කළ කර්මය අනුරූපීව ප්‍රතිසන්ධිය ලැබී ඇත. ඔවුන් විසින් කැමැති කළ දෙය ඔවුනට ලැබී ඇත. තමා කැමට ආසා කළ මස තමාගේම මස බවට පත්වී ඇත. ප්‍රේත ලෝකයේ ජීවත්වන කිසිවෙක් උරණ නොවිය යුතුය. මන්ද තමන් කැමැති කළ දෙය තමන්ට දැන් ලැබී ඇත.

ප්‍රේතයන්ගේ ලෝකයට වඩා ප්‍රේතියන්ගේ ලෝකය හිරිකිතය. භික්ෂුවට දර්ශනය වූ එක් ප්‍රේතියක් කාමය වරදවා හැසිරීමේ වරදටප්‍රේත ලෝකයට වැටුණු කුණු ප්‍රේතියක්ය. ඇය කාමය උදෙසා අඩ නිරුවත්ව ජීවත් වේ. ශරීරය හරිම අපුලය. මුහුණ විරූපීය. ශරීරය කුෂ්ඨ පිරී ඇත. බලන්න අප්‍රසන්නය. මිනිස් ස්ත්‍රියකගේ ස්වරූපයෙන්ම අඟපසඟ දර්ශනය වෙයි. පෙර ආත්මයේ කාමයේ වරදවා හැසිරීම නිසා ඇයට ලැබී තිබුණේ, දැකීමට අප්‍රසන්න ශරීර ස්වභාවයක්ය. ඇය කාමය යදිමින්, කාමය සොය සොයා ඇවිදී. ඇයගේ අකුසල් කර්මය නිසා ඇයට කාමය නොලැබේ. ඇය කාමය යදින්නේ එනිසාය. මෙවැනි කාම ප්‍රේතියක් මනුෂ්‍ය ලෝකයේ ස්ත්‍රියක් ලෙස ජීවත්වීමේදීලැජ්ජාවක් බියකින් තොරව වරදේ බැඳීමට ක්‍රියා කිරීමෙ පාපයෙන් මෙම ප්‍රේත ආත්මය ලැබී ඇත. මිනිස් ලෝකයේ සේම ප්‍රේත ලෝකයේදීද මෙම ප්‍රේතියෝ මහා අකුසල් සිදුකරගනී. මැය මෙම භික්ෂුවගෙන්ද කාමය යැද්දාය. එම සිත ඇයට ඇතිවෙද්දීම ඇය පිච්චී ගියාය. නිරයේ ගිනිදැල් මතටම ඇය වැටුණි. භික්ෂුව ඒ බව දැන ගත්තේ ඇය ලතෝනි දෙමින් අතුරුදන්වූ නිසාය. බලන්න හොඳ සිහි බුද්ධියෙන්. මෙම ප්‍රේතිය මිනිස්

ලෝකයේ ඉපදිලා ස්ත්‍රියක් ලෙස කාමය වරදවා හැසිරිලා, පේ්‍රතියක් වෙලා පේ්‍රත ලෝකයේද කාමය වරදවා හැසිරිලා නිරයේ ගිනිදැල් මතට වැටී පිච්චෙනවා. මොන අභාග්‍යයක්ද. මෙය එම පේ්‍රතියගේ කථාව පමණක් නොව ඔබගේද කථාව විය හැකිය.

මේ රටේ මොනතරම් ගණිකා නිවාස තිබෙනවාද? මොන තරම් වැරදි කාම සේවනයන් සිදුවනවාද..... ඔබ එහෙම නොවෙන්න පුළුවන්. නමුත් එහෙම කරන අයගේ අනාගත ප්‍රතිඵල තමාම ලියන විභාගයේ ප්‍රතිඵල තමයි.

නවීන තාක්‍ෂණික ලෝකයේ මාධ්‍ය මාරයින් අහිංසක ඔබට දිගුකරන පේ්‍රත ලෝකයේ දැත, ඔබ සිහිබුද්ධියෙන් අතහරින්න. ඔබත් මාධ්‍ය දරුවනුත් සුවසේ සැනසෙන්න.

තවත් අපූරු පේ්‍රතියක් ගැන සටහනක් තබමි. ඇයගේ මුහුණ විරූපී නොමැත. එය බැලූම් බෝලයක් වගේ රවුම්ය. මිටි මහත පේ්‍රතියකි. ඇය පැහැපත්ය. ඇයට බැරලයක ස්වභාවයේ තර ශරීරයක් විය. ඇය සිටියේ ඇඳුමක් ඇඟලාගෙනය. දැත් දෙපා බරවා රෝගය සැදුනු අයකුගේ මෙන් මහතය. මෙවා කර්මයේ විපාකයි. ඇය මෙම භික්‍ෂුවට දර්ශනය වන මොහොතේ සිටියේ මැද පෙරදිග රැකියාවකට ගොස් එනවිට රැගෙන එන ආකාරයේ විශාලප්‍රමාණයේ සූට් කේස් එකක් සහ සුවඳ විලවුන් බෝතල් දෙකක් අතේ තබාගෙනය. එක අතක සූටේක්සයද, අනෙක් අතේ කුඩා සුවඳ විලවුන් බෝතල් දෙකද විය.මෙම පේ්‍රතිය සුවඳ විලවුන් බෝතල් දෙක දිගු කරමින් කාමය යදී. "ඩුබායි" සූට් කේසයද ඇය අතේය. ඇය නියත වශයෙන්ම මනුෂ්‍ය ලෝකයේ ඉපිද, විදේශ

රැකියාවකට මැද පෙරදිග ගොස් පැමිණි ඇඩි ලෙස කාමය වරදවා හැසිරීමේ අකුසල විපාකයෙන්, මිනිස් ලොව ජීවත් වන විට තිබූ"මැද පෙරදිග " සංඥාව සමහම පේ්‍රතාත්මයක් ලද කාම පේ්‍රතියකි. වර්තමාන සමාජය දෙස බැලීමේදී මේවා සිදුවිය නොහැකි දේවල් යැයි බැහැර කරලිය නොහැක. මෙහි සටහන් තැබුවේ භික්‍ෂුවක් සමාධිය තුළදී දුටු සත්‍ය සිද්ධීන්ය.

පේ්‍රතයන්ගේ ලෝකය අඳුරුය. බිය, තැතිගැන්ම නිසා කලබලකාරීය. ඔවුනුත් සොයමින් ඇවිදින්නේ කාමයයි. ඔවුන්ද යන්නේ මනුෂ්‍ය ලෝකයේ, දිව්‍ය ලෝකයේ අතීතයේ ජීවත්වීමේදී ඔවුන්ට තිබූ සංඥ විඳීම, රස වින්දන සඳහාය. එහෙත් ඔවුනට අකුසල් බලය නිසා ලැබෙන්නේ දුකමය. කර්මය සහ විපාකය ඉතා හොඳින් ගැලපෙන ලෙස ලෝකය නිර්මාණය වී ඇත. මනුෂ්‍ය ලොකයේදීස්ත්‍රියක් ලෙස කාමය වරදවා හැසිරීමෙන් සතුටුවේ. එහි විපාක ලෙස කාම පේ්‍රතියක්ව ඉපිද, කාම පිපාසය තිබුණද එය සංසිඳුවාගැනීමට නොහැකිව දුකට පත්වේ. එම නිසාය පේ්‍රතිය සුවඳ විලවුන් දිගුකරමින්, ඩුබායි බෑගය පෙන්වමින් කාමය යදින්නේ කර්මය සහ විපාකය හොඳින් ගැලපෙන නිසාය. නෑනා මස්සිනා විවාහය වගේය. මේ හැම සිද්ධියකින්ම නැවත නැවත ඔප්පුවන්නේ ලොව්තුරා ධර්මයේසත්‍යතාවයි.

ඔබද ලොව්තුරා මහ නිවැරැදිව හඳුනාගන්න. ඔබ සියල්ල අතහරින්න. එවිට සියල්ල ලැබේවි. සියල්ලම ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය. අතහැරීමෙන් ලැබෙන මේ සුන්දර අත්දැකීම ඔබ ඔබේත් අත්දැකීම කරගන්න. බව ගින්නෙන් නිවී යන්න.

භික්ෂුව මේ සටහන් තබන්නේ ඔබේ තෘප්තිය සඳහා නොවේ. අවබෝධය සඳහාය. මේ ඝෝර, කටුක, භයානක සංසාරය සත්වයා දුක සොයාගෙන යන ගමනේ කැඩපතකි. දයාබර පිංවත මේ කැඩපතින් ඔබ ඔබේ මුහුණ බලන්න. ඔබට පෙනෙන්නේ ඔබේම මුහුණ නම් ඔබ සතුටුවෙන්න. ඔබට පෙනුණේ පෙරේතයකුගේ පෙරේතියකගේ මුහුණ නම් ඔබ වහාම අප්‍රමාදීවන්න. ප්‍රමාදය දුකට හේතුවනු ඇත. භික්ෂුවට වරක් දර්ශනය වූ කිසියම් ප්‍රේතයෙක් ප්‍රේතියක් නැවත දර්ශනය වී නොමැත. සමහර විට පිං ගැනීමට හැකි ප්‍රේතයන් මෙසේ දර්ශනය වී පිං අනුමෝදන්වප්‍රේත ලෝකයෙන් චුතවනවාදැයි භික්ෂුව නොදනී.

ප්‍රේතයින්ගේ ආධ්‍යාත්මය තුළ යටපත්වී ගිය කුසල ශක්තියක් ඇත. එම යටපත්වූ කුසල් ශක්තිය යම් අවස්ථා වලදී මතුකර ගැනීමට ප්‍රේතයාටද හැකිය. තණ්හාවෙන්, රැස්කරමින්, ගොඩගසාගනිමින්, දිවා රාත්‍රී නිදි නොලබා ඔබ වෙහෙසෙන්නේද ඉහත නුවරට නැගම් යැම සඳහාමය. ඔබට පුළුවන් ඔබ ගැන ස්වයං පරීක්ෂණයක් කරගන්න. සමාජයේ හුඟ දෙනෙකුට තිබෙන ප්‍රශ්නයක් තමයි පිනක් කරගන්න තිබෙන අවිවේකය. විවේකය නැති නිසා සමහරු පොහොය දවසට පන්සලට යන්නේ නැහැ. ගෙදර බුදුන් වඳින්නේ නැහැ. පෝයට සිල් සමාදන් වන අම්මලා තාත්තලා ගෙදර දරුවන්ගේ ප්‍රශ්න ලෙඩරෝග ඇතිවුණොත්, මුණුබුරා අසනීප වුණොත්, බලාගන්න කෙනෙක් නැති වුණොත් සිල්ගන්න එන්නේ නැහැ. රජකාරී, වගකීම්, ව්‍යාපාර නිසා හටගත් අවිවේකයෙන් තමන්ගේ ගෙදර තිබෙන පිංකමට නොයන අයත් ඉන්නවා. තණ්හාව බඳාගැනීම හැර වෙන මොකුත් මෙහි නැහැ. පිංකමෙන් ලැබෙන පිනට වඩා සැපයක් ඔවුන් සොයනවා. මේ අය හදිසියේ මියගියහොත් ඔබ හිතනවාද විවේකයෙන් පණ යාවි කියලා. පණ යන්නේ අවිවේකයෙන්මයි. ඒ කියන්නේ ගැටෙන සිතෙන්මයි. ප්‍රතිඵලය ප්‍රතිසන්ධිය සතර අපායයි. ඔබට බැරිනම් දින කීපයක් ඔබේ දේපළ, ව්‍යාපාර, අඹු සැමියන්, දූවා දරුවන්, වගකීම් අතහැර නිදහසේ දුර බැහැරක, වන්දනාවක, හුදෙකලාවෙ යන්න මෙවායින් මිදිලා. මෙවා අතහැරලා දින කිහිපයක් හුදකෙලාවෙ සිටින්න. ඔබ ස්ථිර වශයෙන් දැනගන්න ඔබ මියයන මොහොතේත් ඔබට බැරිවෙනවා මෙවා අතහැරගන්න. මැරෙන මොහොත අති වේගවත්ම සිත් ඇතිවෙන නැතිවෙන මොහොතක්. ඔබව කම්පනය වන මොහොතක්. ඔබ සූදානම් නොවී සිටියොත් ගැටෙන සිත ඊළඟප්‍රතිසන්ධිය අල්ලා ගන්නේ ප්‍රේත ලෝකයමය. පිං කළා කියා වැඩක් නැත. අතහැරීම පුරුදු කොට තිබිය යුතුය. මැරෙන මොහොතේ ඇතිවන තණ්හා සිතිවිලි අතහැරීමට අවබෝධය තිබෙන්නට ඕනැය. භික්ෂුව දුටු ප්‍රේත ලෝකයේභික්ෂුව එවැනි චරිතයකි. පිං කිරීම නිසා විකෘති නොවූ ප්‍රේත ශරීරයත්, තණ්හාව නිසා ප්‍රේත ජීවිතයත් ඔහුට ලැබී ඇත. ප්‍රේත ලෝකයටතණ්හාව බැසගත්තද කළ පිංකම් නිසාලස්සන ශරීරයක් ලැබීය.

එක් මහත්මයෙක් භික්ෂුවට තමන් ගැන මෙසේ ප්‍රකාශයක් කළේය. "ස්වාමීන් වහන්ස මම දැන් ව්‍යාපාර වලින් නිදහස් වෙලා ගොඩක් විවේකයෙන් ඉන්නේ. හැම සතියකම වන්දනාවෙ යනවා. දඹදිව වන්දනා කිරීමට කිහිප වතාවක්ම ගියා. බුරුමය, තායිලන්තය යන රටවලටත් වන්දනාවේ ගියා. තව රටවල් හුඟකට යන්න බලාපොරොත්තුවෙන් සිටිනවා. එහි බෞද්ධ සිද්ධස්ථාන වඳින්න ස්වාමින් වහන්සේ මට ආශිර්වාද කරන්න. "එම රටවලට යන්න ලැබෙවා" කියලා" භික්ෂුවට ඔහු ප්‍රකාශ කළා. බලන්නකෝ එම මහත්මයා පිංකම් කරගැනීම සඳහාව්‍යාපාර අතහැරලා කරන පිංකම් වල ස්වරූපය. ඔහු ව්‍යාපාරිකයෙක් කියලා තැනින් මිදිලා ඔහු සංචාරකයෙක් වෙලා. අපූරු තෝරාගැනීමක්. මෙකට තමයි මෝහය කියන්නේ. ඔහු භික්ෂුවගෙන් විමසුවා මෙවැනි පිංකම් කිරීමෙන් ලැබෙන විපාක මොනවාද කියලා. භික්ෂුව

මෙහෙම කිව්වා "ඔබ බලාපොරොත්තු තබාගෙන සිටින්නේ තව හුහක් බෞද්ධ රටවලට සංචාරයේ යන්න. පිං කරගැනීම සඳහා. ඔබ මියයන විට මෙම බලාපොරොත්තුව සිහිවුනොත් ඔබ නියත වශයෙන්ම සංචාරක පක්ෂියෙක් වෙනවා. මොකද ඔබ කැමති සංචාරයට නිසා. ඔබේ කැමැත්ත පරලොවදී ස්ථිරවම ඔබට ලැබෙනවා. ඔබ මියයන මොහොතේ ඔබ ඔයවන්දනාවේ ගොස් කරගත්ත මහා පිංකමක් ඔබේ මතකයට ආවොත් ඔබ ස්ථිර වශයෙන්මසග්රීක මිනිස් හෝ දිව්‍ය ආත්මයක් ලබනවා. ඔබ මියයන මොහොතේ ඔබේ සිතේ ඇතිවන හැම සිතිවිල්ලකම අනිත්‍ය වශයෙන් දැකේකාත් ඒ දකින්නේ ධර්මය නිසා නියත වශයෙන් ඔබ මාර්ගඵල ලාභී දෙවියන් බඹුන් අතර උපතක් ලබනවා. ඔබ මියයන මොහොතේ ඔය ගියවන්දනා ගමන්, කළ පිංකම් මතක් නොවී ඔබට පෙර අතහැරදැමූ ව්‍යාපාර දේපළ, වස්තුව මතක්වුවොත් ඔබ ස්ථිර වශයෙන්ම ප්‍රේත ලෝකයේ උපතක් ලබනව. භික්ෂුව ඔහුට අනුශාසනා කළා, ඔබ දක්ෂවෙන්න ඔබ කැමැති දෙය තෝරාගන්න කියලා. භික්ෂුව දන්නේ නැහැ ඔහු මොන දෙයට කැමැති වුණාද කියලා. හැබැයි එක දෙයක් නම් දන්නවා. එදායින් පසේස් ඔහු භික්ෂුව සමග අමනාප බව. මෙක තමයි ලෝකයේ ස්වභාවය. හුහක් අය කැමැති බොරු කියලා හරි ඔහුව ඔසවා තබනවාට. ඔවුන් යන ගමනට ලකුණු දෙනවාට.

යක්ෂයා නොව ධර්මය දකින්න

19 වැනි කොටස

භව ගමනේ නවාතැන් පළවල ස්වභාවය විවිධත්වයෙන් පිරී පවතී. මෙ විවිධත්වය ගොඩනැගී ඇත්තේ සත්වයා කරන ලද කුසල් අකුසල් මතය. දිව්‍ය, මනුෂ්‍ය, පේ‍්‍රත ලෝකයන් මෙන්ම, යක්ෂයන්ගේ ලෝකයද අපූරුය.

යක්ෂයන්ද මේ මනුෂ්‍ය ලෝකය තුළම ජීවත්වන පිරිසකි. යක්කු, යක්ෂණියන් වශයෙන් දෙකොටසක් ඇති බව අසා ඇතත් භික්ෂුව දැක ඇත්තේ යකුන් පමණක්ය. යක්ෂණියන් දර්ශනය වී නොමැත.

යකුන්ගේ ලෝකය පැහැදිලිව කොටස් දෙකකි. සම්‍යදෘෂ්ටික යකුන් සහ මිත්‍යාදෘෂ්ටික යකුන් වශයෙනි. සම්‍යදෘෂ්ටික යකුන් වැඩි වශයෙන් පන්සල්, ආරණ්‍ය, පැරණි පුදබිම්, කැලයේ හුදෙකලා භික්ෂූන් වසන ප්‍රදේශ අසලද, මිත්‍යාදෘෂ්ටික යකුන් සොහොන්, අඳුරු ගුහා, ගල්ලෙන්, කැලයේ අඳුරු ප්‍රදේශ, දිය අගල්, නාන තොටවල් ආදිය ආශ්‍රයේද ජීවත් වෙයි.

යකුන් අඳුරට ප්‍රියය. ඒ ඔවුන්ගේ පෙර කර්මය නිසාය. ඔවුන්ද ඕලාරික කයක් සහිත, එම කය ඇසුරුකොට ආයතන හය පිහිටි සත්වයෙකි. යක්ෂයාද සතර මහා ධාතූන්ගෙන් සැදුන ඕලාරික කයක් සහිත, නිරතුරුවම ඇතිවන නැතිවන සිතක් සහිත සත්වයෙකි.

භික්ෂුවක් එක්තරා කැලෑබද ආරණ්‍යයක කුටියක වැඩ සිටියදී රාත්‍රී දහයට පමණ සමාධිය තුළ පසුවන විට එකවරම එම භික්ෂුව ඉදිරියට අඩි 6 ක් පමණ උසැති සද්ධන්ත ශරීරයක් සහිත මනුෂ්‍ය ශරීරයේ ස්වභාවයෙන් යුත් යකෙක් දර්ශනය විය. යකාගේ ස්වභාවය, හැඩය හරියටම කළු ජාතික බොක්සිං ශූරයකු වැනිය. තද කළු පැහැති ශරීරයකි. ශරීරයේ උඩ කොටස නිරාවරණය වී ඇත. යට කොටස දනහිස දක්වා ඇඳුමකින් වැසී ඇත. අත්වල ලොකු වළලු තිබිණි. කොණ්ඩය හිස පිරෙන්නට ගෙල තෙක් වැඩී තිබුණේය. හැබැයි කටේ දළ එහෙම තිබුණේ නැත. භික්ෂුව එයට පෙර යකෙක් දැක තිබුණේ නැත. යකා පිටුපස තව පිරිවරක්ද ඉන්නවා පෙනෙයි. සෙවනැලි වශයෙනුයි පිරිවර පෙනෙන්නේ. ඕලාරිකව. මහයකා හොඳට ප්‍රතාපවත් මනුෂ්‍යයෙක් වගේ භික්ෂුව ඉදිරියේ සිටිනවා. විනාඩි 5 ක් පමණ භික්ෂුව යකා දෙස බලා සිටියේය. යකා සෙලවෙන්නේ නැහැ. එකම ඉරියව්වෙන් භික්ෂුව දෙස බලා සිටිනවා. භික්ෂුවට වඳින්නෙත් නැහැ. භික්ෂුව බියට පත්කිරීමේ වුවමනාවකුත් නැහැ. භික්ෂුවට අගෞරවයක් කරන්නෙත් නැහැ. යකා භික්ෂුව දෙස අනිමිස ලෝචනයෙන් වගේ බලා සිටිනවා. භික්ෂුව එවිට යකාට පිං දුන්නේය. යක්ෂ රූපය දර්ශනයෙන් නොපෙනී ගියේය. ඒ යක්ෂ රූපය නැවත භික්ෂුවට දර්ශනය නොවිණි. ඔහු සම්‍යදෘෂ්ටික යකෙකි. ඔහුගේ ජීවිතය යකෙක් වුවද එය අඳුරු නැත. දුකක්ද නැත. බොහොම තේජස්, ප්‍රතාපවත්, පෞරුෂවත් ස්වභාවයකුයි තිබෙන්නේ. ඒවා ලැබී තිබෙන්නේ පෙර ජාතියේ කරන ලද පිංකම් නිසාය. නමුත් පෙර මිනිස් ආත්මයක ඉපිද මැරෙන මොහොතේ අවසන් චුති සිත වෛරයක්, කෝරාධයක්, යමක් ආරක්ෂා කිරීමේ කැමැත්තක් සමඟ ඇතිවූ නිසා යක්ෂ ආත්මයක ඉපැදිලා. ඒත් ඔහු දුකක් නොවෙයි විඳින්නේ. ඔහු තේජස් සහිතව යමක් ආරක්ෂා

කරන සම්‍යදෘෂ්ටික යකෙක්.

භික්ෂුවට පසුව දැනගන්න ලැබුණා මෙම ආරණ්‍යයේ වසර40 කට පමණ පෙර අපවත් වූ නායක හිමිනම මෙම ආරණ්‍යයට ඉතාමත් ආදරය කළ, එය ආරක්ෂා කිරීමට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ බවක්. එම නායක හිමිගේ ආත්ම ගරුත්වය සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රශ්නයක් නිසා තමා විසින්ම ආරණ්‍යයේ තම කුටියේදී ගෙල වැලලාගෙන අපවත් වූ බවක්. මෙන්න මේ නායක හිමිනම තමයි මහා යක්ෂයෙක් වෙලා මෙම ආරණ්‍ය කුටියේදී රාත්‍රියේ භික්ෂුවට දර්ශනය වූයේ. හැබැයි එම භික්ෂුව අපවත් වීමට පෙරාතුව හොඳින් සීලය ආරක්ෂා කර ගත් නිසා, අපවත්වීමෙන් පසු සම්‍යාදෘෂ්ටික ප්‍රතාපවත් යක්ෂ ආත්මයක් ලැබුවේය. අපවත් වන මොහොතේ තමාගේ කැමැත්ත වූයේ ආරණ්‍යය ආරක්ෂා කර ගැනීමය. ඒ කැමැත්තට අනුරූපීවම ඊළඟ ප්‍රතිසන්ධිය නිර්මාණය විය. තමාගේ කැමැත්ත තමාට ලැබිණි. භික්ෂුව සමාධිය තුළින් එම යක්ෂයා දර්ශනය කර ගැනීමට උත්සාහ කළද මෙම යක්ෂයා එදායින් පසුව භික්ෂුවට දර්ශනය වීමට නොලැබුණේය. ඔහු නියත වශයෙන්ම භික්ෂුවගේ පින් අනුමෝදන්ව ඒ ක්ෂණයෙන්මයක්ෂ ආත්මයෙන් මිදුන බව පසුව භික්ෂුව සාධක සහිතව ස්ථිරව දැනගත්තේය. එය භික්ෂුව විසින් කෙසේ දැනගත්තේ දැයි මේ මොහොතේ සටහන් නොකරමි. සැබැවින්ම මොහුට යක්ෂයෙක් යැයි කීම වැරදිය. මොහු යක්ෂ සේනාධිපතියෙකි. මොහු භික්ෂුව ඉදිරියට පැමිණ ඇත්තේ හේතු දෙකක් සහිතවය. ගෞරව කිරීමට සහ පින් ගැනීමටය. භික්ෂුවගේ භික්ෂු ජීවිතයේදී ඉතාමත් ලෙන්ගතුව ගෞරවනීය ලෙස භික්ෂුවට ගෞරව කළ සත්වයා මෙම යක්ෂ සේනාධිපතියාය. මෙම දර්ශනය වීම සහ එහිදී භික්ෂුව අත්දුටු දේ සම්බන්ධයෙන් නැවත මෙසේ කියමි.

ඔබ සියල්ල අත්හරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවි. සියල්ලම ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය.

ඉහතින් සදහන් කළේ සම්‍යදෘෂ්ටික යක්ෂ සේනාධිපතියෙක් ගැනය. මේ මොහොතේ ඔහු යක්ෂ ආත්මයෙන් මිදී මනුෂ්‍ය, දිව්‍ය ලෝකයක හෝ එසේත් නැතිනම් සියදිවි නසාගැනීමට පෙර දුෂ්කර ආරණ්‍යක භික්ෂුවක් ලෙස ප්‍රජාව යම් ප්‍රමාණයකට වඩා තිබීම හේතුවෙන්, භික්ෂුවගේ අතහැරීමේ ස්වභාවයද දුටු නිසා ප්‍රඥව මතුවී බ්‍රහ්මලෝකයට ගියා වීමටද පුළුවන. මේ ගැන භික්ෂුව ස්ථිරවම නොදනී, අනුමාන කළා පමණි. කෙසේ හෝ ඔහු සුගතිගාමී විය.

මිථ්‍යාදෘෂ්ටික යකුන්ගේ ස්වභාවය ඉහත යක්ෂ සේනාධිපතියාගේ ශරීර ස්වභාවයට වඩා වෙනස්ය. එකම එක අවස්ථාවක මිත්‍යාදෘෂ්ටික යකෙක් වෙනත් ආරණ්‍ය භූමියකදී දර්ශනය විය. එම යකා ඉහත යක්ෂ සේනාධිපතියාට වඩා උසය. ශරීරය කළු පැහැතිය. ඇස් දෙක දොඩම් ගෙඩි දෙකක් සේ විශාලය. ඇස් රතුය. කොණ්ඩය අවුල්ව කැරළි ලෙස ගෙල දක්වා වැඩී ඇත. මහා රෞද්‍ර පෙනුමකින් යුක්තය. මෙම යකා තනිපංගලමේ භික්ෂුව ඉදිරියේ දර්ශනය විය. හේ තැතිගත් විලාසයෙන් නිසොල්මනේ භික්ෂුව දෙස බලා සිට අතුරුදන් විණි. ඔහුගේ රෞද්‍ර පෙනුම නිසා ඔහු මිත්‍යාදෘශ්ටික යක්ෂයෙක් බව අනුමාන කරමි. මොහුද උඩුකය නිරාවරණය කරගෙන සිටියේය. දණහිස දක්වා රෙදිකඩකින් වැසී තිබිණි. මෙම යක්ෂයන් කළු පැහැයෙන් යුක්ත වන්නේ පෙර සසර ක්‍රෝධය, වෛරය වැඩූ නිසාමය. තමා වැඩූ දෙය, තමා කැමති කළ දෙය තමාටම ලැබේ. ලෝක ධර්මය එයයි.

ඉහත ආරණ්‍යයේදීම භික්ෂුවකට පැහැපත් වර්ණයෙන් යුත් යකෙක් දර්ශනය විය. එම යකාට

පැහැපත් සිරුරක් තිබුණත් එය එල්ලාවැටෙන තරබාරු සිරුරකි. විශාල බඩගෙඩියක් සහිත ශරීරයේ උඩකය නිරාවරණව තිබුණු අතර දණහිස දක්වා රෙදි කඩක් තිබිණි. හිසකේ අවුල්ව වැඩී තිබුණු අතර අසරණ ස්වරූපයක් ඔහුගෙන් පළවිය. ඔහු යක්ෂ ආත්මයක ඉපැදුනද පැහැපත් ශරීරයක් ලැබුවෙ කෙසේදැයි භික්ෂුව නොදනී. සමහර ආමිස පින්කම් කිරීම නිසා ප්‍රසන්න ශරීර පැහැයත්, අවසාන චුති සිත කේරාධය, වෛරය ඇතිවීම නිසා යක්ෂ ආත්මයත් ලැබුණා විය හැකිය.

යක්ෂයනුත් කණ්ඩායම් වශයෙන් සිටීමට ප්‍රිය පිරිසකි. ඒවායේ නායකයන් ඇත. මිත්‍යාදෘෂ්ටික යකුන්, ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂූන්ට දැඩි ලෙස පීඩා කිරීමට උත්සාහ කරයි. භික්ෂුව දක්ෂ වෙන්න ඕනේ අතහැරීමේ ශක්තිය තුළින් මේ පාපකාරී බලවේග පරාජයකරන්න. අදක්ෂ වුණොත් කුටිය අතහැර යන්න වෙන්නේය. භික්ෂුව බලවත් අවස්ථාවල, භික්ෂුවට සිව්පසය සපයන දායකයන් මෙම මිත්‍යාදෘෂ්ටික යකුන් ග්‍රහණයට ගන්නේය. ඔවුන්ව ලෙඩ කරන්නේය. බිය ගන්වන්නේය. මේ හැම දෙයටම නොවරදින ඖෂධය ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කර තිබේ. ඒ තමයි ඇතිවන සිත අනිත්‍ය වශයෙන් දකින්න. එවිට ඔබ දකින්නේ යක්ෂයා නොව, ධර්මයයි.

භික්ෂුව මොනම අවස්ථාවකදීවත් දෙවියන්, බඹුන්, ප්‍රේතයන්, යක්ෂයන් දකින්නට ආස කළේ නැත. මෙම සියල්ලම අහම්බයෙන් දර්ශනය වූ දේවල්ය. මේ කිසිවක් කෙරෙහි භික්ෂුව ඇලුනේද, ගැටුනේද නැත. මේ සටහන් කියවා ඔබ දෙවියන් ප්‍රේතයන් යක්ෂයන් දැකීමට ආසා නොකරන්න. මන්ද දැකීමට සත්වයෙක් ලෝකයේ නොමැති නිසාය. ඉහත සියලුම සත්වයන්ට තිබුණේ සතර මහා ධාතුන්ගෙන් සැදුණු අනිත්‍යභාවයට පත්වන ඕලාරික කයක් සහ අනිත්‍යභාවයට පත්වන සිතක් පමණි. එහි ස්ථිර සත්වයෙක් නොසිටියේය. මෙහි තිබුණේ පස්සය නිසා හටගන්නා වේදනාව පමණක්මය. සත්වයෙක් පුද්ගලයෙක් හමු නොවේ. එනිසා ඔබ දිව්‍ය, බඹුන්, ප්‍රේත, යක්ෂයන් සොයා නොයන්න. එම රූප දකින්න ඇති ආශාව, දකින්න යැයි කියන සිත අනිත්‍ය වශයෙන් දැක අතහරින්න. එවිට ඔබ සොයාගෙන ඔබ නොසිතූ අයුරින් ඒ අය ඔබ ඉදිරියට එනු ඇත.

ඔබ මේ සටහන තැබූ භික්ෂුව කවුරුන්ද යන්න සෙවීමට වෙහෙස නොවන්න. ඔබ ඔබ ගැන සොයන්න. මේ භික්ෂුවද කිසිදා අනුන් සොයා ගිය කෙනකු නොවන බව තරයේ සිහි තබාගන්න. භික්ෂුව සෙව්වේ තමාගේමස්වභාවය බවත් තමාගේ ස්වභාවය ගැන සෙවීමේදීභික්ෂුවට අවබෝධ වූයේ ලෝකයේම ස්වභාවය බවත් ඔබද දකින්න. තමාත්, ලෝකයත් දෙකම නිර්මාණය කර දුන්නේ ඇතිවෙමින් නැතිවෙන සිත බවත්, සිත අනිත්‍ය වශයෙන් අවබෝධ කර නිරුද්ධ කළ මොහොතේ ලෝකයෙන් තමා නිවී යන බවත්දකින්න. මෙනෙහි කරන්න. අප්‍රමාදීව සුන්දර දහමක හිමිකරුවෙක් වන්න.

නැවත නැවතත් කියමි. ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ලම ලැබේවි. ඔබට සියල්ලම ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය.

හොඳ තැන් සොයමින් යනවා වෙනුවට...

නිවන් මග වඩන ඔබට මහා කැලයේ හුදෙකලාව සිටියද බියක්, තනිකමක්, තැතිගැනීමක්, දැනෙන්නෙ නැහැ. මන්ද, භික්ෂුව තමා තුල තමා සිටින බව නොදකින නිසා, බියවෙන්න තැතිගන්න සත්වයෙක් පුද්ගලයෙක් දකින්නේ නැහැ. අනුන්ගේ දේවල් ඔබ ඔබේ කරගන්න යන්නේ නැහැ. කැලයේ අතරමගදී ඔබට මනුෂ්‍යයෙක්, දඩයක්කරුවෙක්, සතෙක් මුණගැසුනද එය ඔබේ නොවන බැවින් ඔබ ඒ පුද්ගලයා හෝ සතාගේ හැසිරීම් ඉරියව් අතහරිනව. ඔබ තුළට ගන්නේ නැහැ. ඔබ නිවන් මහවඩන විට මොනම අවස්ථාවකදීවත් දෙවැනියෙක් හෝ දෙවැනියෙකේග් උපකාරය සොයන්න යන්න එපා. ඔබ දෙවැනියෙකේග් උපකාරයෙන් කැලය තුළ සිටියාට වැඩක් ප්‍රතිඵලයක් නැහැ. ඔබ දෙවැනියෙකේග් උපකාරය සොයයි නම් ඒ සොයන්නේ ඔබගේ ආරක්ෂාවට. ඒ කියන්නේ ඔබ තුළ ආරක්ෂා කරගන්න සත්වයෙක් ඉන්නවා කියන එකයි.

සිත ඔබව මුලාකරන මෙවැනි සියුම් තැන් ඔබ පරාජය කරන්න. කොතරම් සතා සර්පයා සිටියද, මොනම අවස්ථාවකදීවත් දෙවැනියෙක් ගැන නොසිතා ඔබ තනියම කැලයට ඇතුළු වෙන්න. කුටිය සොයාගෙන අඩිපාරේ ඔබම යන්න. බියක් තැතිගැනීමක් දැනුණහොත් ඒ සිත අනිත්‍ය වශයෙන් දකින්න. එවිට බිය ඉවත්වෙලා යාවී. කය, සිත අතහැරදා ඔබ යන මේ ගමනේ ඔබට බාධා කරන්න කාටවත්ම බැහැ. එය අතහැරීම තුළ ඔබ ලබන ප්‍රතිලාභයක්.

භික්ෂුවක් කැලෑ මහක් ඔස්සේ කුටියක් සොයාගෙන තනිවම වඩින විට එම කුඩා කුටියේ මාස තුනකින් පමණ භික්ෂුවක් වැඩ සිටලා නැහැ. දුෂ්කර කුටියක්. මෙහි භික්ෂුව ගත කළේ දින හතක් පමණයි. විදේශීය භික්ෂූන්වහන්සේ නමක් වැඩිය නිසා ඉවත්ව ගියා. භික්ෂුව කුටියට වැඩිවිට කුටියේ ඇතුළත හතරෙන් පංගුවක් පමණ කොටසක් අඩියක් පමණ උසට තුඹස් බැඳලා. එහි ලෑලි ඇඳක් තිබුණා. ඒ ඇඳේ කකුල් දෙකකුත් තුඹසට බැඳිලයි තිබුණේ. තුඹස තිබියදීම භික්ෂුව සුවසේ රැය පහන් කළා. පසුව දා ගමේ ගිහි දරුවන් තිදෙනෙක් ඇවිත් තුඹස ඉවත් කළා.

මෙවැනි අභියෝග වලට කියන්නේ නිවන් මහ කලමනා කියලයි. කය අතහැරීමේ ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවට මෙවා හුඟාක් ප්‍රයෝජනවත්. හැබැයි ඔබ තුඹස දැකලා ගැටුනානම්, නයයි බයයි දෙකම සිත ඔබේ ළඟට ගේනවා. තුඹස දුටු සිත භික්ෂුව අතහැරිය නිසා නයයි බයයි දෙකම ඔබට අතහැරුණා. ඔබ තුඹස දුටු සිට නිත්‍ය වශයෙන් ගත්තා නම් නැති සර්පයිනුත් සිටිනවා ඔබට පේනවා.

ඔබ නිවීම සඳහා ප්‍රතිපදාවේ යෙදෙන විට සැලසුම් ඔස්සේ, පෙර සූදානම් වීම් ඔස්සේ පෙරට යන්න එපා. ඒ ඔබ රවටන මාර බලයක්. සැලැස්මක් හදන්නේ යමක් ගොඩනගන්නයි. ඔබ මේ යන්නේ ලෝකයේහිස් බව දකින්නයි. සැලසුම් අතහරින්න. ඉදිරියට හමුවන තත්ත්වයට, ස්වභාවයට මුහුණ දෙන්න.

භික්ෂුවකට දුෂ්කර ආරණ්‍යයකදී වයස අවුරුදු 80 ක පමණ වයෝවෘද්ධ, ඉතා ගුණයහපත්, සත්පුරුෂ භික්ෂුවක් මුණගැසුණා. උන්වහන්සේ භික්ෂු ජීවිතයෙන් වසර40 ක් ම ගතකරලා තිබෙන්නේ චාරිකාවේ වඩිමින්. වස් කාලයේ පමණයි එක තැනක වැඩ ඉඳලා තිබෙන්නේ. උන්වහන්සේ ගතකර තිබූ ප්‍රතිපදාව නිසා භික්ෂුව සිතුවා උන්වහන්සේ හොඳ අවබෝධාත්මක

භික්ෂුවක් වෙන්න ඇතිය කියලා. භික්ෂුව උන්වහන්සේගෙන් ඇසුවා ඇයි ඔබ වහන්සේ එක ස්ථානයක් අල්ලාගෙන නොයිඳ මේ ආකාරයෙන් චාරිකාවේ හැසිරුණේ කියලා. එවිට උන්වහන්සේ කියනවා, මට අවශ්‍ය වුණා මම ආසා කළා මම ඉපදුන රට දැක බලාගන්න. ඒකයි මම චාරිකාවේ හැසිරුනේ කියලා. එම වචන ටික උන්වහන්සේගේ මුවින් පිටවෙනකොට භික්ෂුව උන්වහන්සේ තුළ දැකේක් පුංචි සාමනේර හිමිනමක්.

බලන්න මොන අපරාධයක්ද කරගෙන තිබෙන්නේ, සංචාරකයෙක් බවට පත්වෙලා.

අපේ සිත අපව නිරතුරුවම රවට්ටනවා. ඔබ අධිෂ්ඨානයක ඉන්න ඕනේ සිත වැඩෙන සුදුසුම හුදෙකලා ස්ථානයක් අරමුණ ජයගන්නා තෙක් ඇසුරු කරන්න. සිත ඔබව සංචාරකයෙක් කරන්න උපදෙස් දේවි. ඔබව ආරණ්‍යයෙන් ආරණ්‍යයට ඇවිද්දවාවි. ඔබ ප්‍රවේශමවන්න. ඔබ යා යුතු ඊළඟ තැන සැලසුම් කරන්න යන්න එපා. ඔබට ඒවා අදාළ නැහැ. ඔබට තිබෙන්නේ හොඳින් නිවන් මඟ වැඩීමට සිත වැඩෙන ස්ථානයක රැඳෙන්නයි. ඉතිරි සියල්ල ඔබ අතහරින්න. කලබල වෙන්න, ආයාසයක් ගන්න එපා. ඊට වඩා සුදුසු ඔබට යායුතු තැනක් වේ නම්, සංඥ මඟින් නොසිතූ ආකාරයට ඔබට ඒවා දැනේවි. ඔබට තිබෙන්නේ අතහැරීම පමණයි. නිවීම දක්වා මඟ ඔබට ප්‍රඥව විසින් මුණගස්වාවි. ඔබව රැගෙනයාවි. එසේ නොවුණ හොත් තෘෂ්ණාව විසින් ඔබව සංචාරකයෙක් කරාවි.

ඔබ හොඳ තැන් සොයමින් යන්න එපා. සෑම තැනකම ඔබ හොඳින් ඉන්න. ඔබ ඇසුරට හොඳ මිනිසුන් සොයමින් යන්න එපා. සැවොම සමඟ හොඳින් ඉන්න පුරුදුවෙන්න. ලෝකයේ හොඳයි, නරකයි තිබෙනවා මිස හොඳ පමණක් ඔබට සොයාගත නොහැකි බව දකින්න. ඔබ හොඳ පමණක් සොයන්නේ නම්, ඔබට සොයමින් සිටිනවා හැර ජීවිතයේ වෙන කාර්යයක් නොමැති වනු ඇත. මන්ද ඔබ සොයන්නේ නොමැති දෙයක් හෙයිනි. ඔබ අතහැරීමේ උපරිමය තුළ නිවන් මඟ වඩන්නෙක් නම් ඔබ කොතැනකට ගියද ආරණ්‍යයක් වේවා, පන්සලක් වේවා එතැන කැළඹුන තැනක් විය හැක. ප්‍රතිපදාවේ යෙදෙන භික්ෂුවට මාර බලවේග බියය. ඒ නිසා තම බලකොටුවට පැමිණි ධර්මයේ බලය පලවාහැරීමට පරිසරය ඇති කරයි. ලෝකය තුළ අධර්ම බලවේග වල ශක්තිය වැඩිය. ඔබ ධර්මය අවබෝධ කරගැනීමට යන ගමන මදි පුංචිකම්, චෝදනා, පරීක්ෂා කිරීම්, නොසලකා හැරීම්, පීඩන, බාධා වලින් පිරුණු ගමනකි. ඔබ මේවා ඔබේ ගමනට ආශීර්වාදයක් කරගත යුතුය. මන්ද මේ සියල්ලම ලෝකයේ පවතින ධර්මතාවයන් වීමය. ඕනෑම පරිසරයකදී ඔබ "හොඳින් ඉන්න" දක්ෂ වෙන්න.

සිහියෙන් බලන්න... දහම ඔබ අසලමය

ඔබ ජීවත් වන්නේ ධර්ම නිකේතනයක. ධර්ම කාන්තාරයක නොවෙයි. එහෙත් ඔබ ධර්මය සොයනවා. සැබැවින්ම ඔබ සොයනවානම් සෙවිය යුත්තේ සැඟවුණු දෙයක්. නොපෙනෙන දෙයක්....

ඉන්ද්‍රියන් හයටම පස්සය වන මායිමේ ධර්මය තිබියදී ඔබ එය දකින්නේ නැහැ. ආලෝකය තුළ සිටිමින් ඔබ ආලෝකය සොයනවා. මොකද ඔබේ දෑස් අවිද්‍යාවෙන් වැසිලා. ඔබ ධර්මය සොයන්නේ නම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩිය මඟ යන්න. උන්වහන්සේ ගිය මග අධ්‍යයනය කරන්න. සාරසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනක් පෙරුම් පුරා පැමිණියද සිද්ධාර්ථ කුමරාට වයස අවුරුදු 29 වන තෙක් එතුමා ඉලක්ක කරගෙන පැමිණි පාරමී ගමනේ අරමුණ ගැන දැනීමක් හැඟීමක් නොදැනින. කුමරාට මෙම සංසාරික ඉව මතුවී එන්නේ සතර පෙරනිමිති දැකීමත් සමඟය. එතෙක් කුමරා ගතකළේ සිය පියා විසින් නිර්මාණය කරන ලද, සැලසුම් කරන ලද දුක නැති සමාජ පරිසරය තුළ කෙළිලොල් ජීවිතයක්ය. ධර්මය සොයාගෙන ගිහි ජීවිතයෙන් නික්මුණු කුමරා මුලින්ම කළේ සියල්ලම අතහැරීමය. යශෝධරාව, රාහුල කුමරු, රාජ සම්පත් සියල්ලම අතහැරියේය. ප්‍රථම අඩියර එය විය. සියල්ල අතහැරලා කැලයටයි ගියේ. පරිසරයට, ස්වභාවධර්මයට ගිහින් මොකද කළේ?

කුමරුන්ට කියවීමට ධර්ම පුස්තක හෝ භාවනා පංති, ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා.... මෙවා තිබුණාද? ත්‍රිපිටකය තිබුණාද? ලෝකයේ තෙරුවන් පහළ වෙලා තිබුණේ නැහැ.

මෙවැනි පරිසරයක කුමරා ගිය මඟ කුමක්ද? ඔබ නිවීසැනසිල්ලේ සිතන්න. සිතමින් අවබෝධය ලබන්න. කුමරා කැලයට ගොස් බලාගෙන සිටියා පරිසරය, ස්වභාවධර්මය දෙස. ඇතිවෙන නැතිවෙන සිතිවිලි දෙස. වෙන බලන්න දකින්න දෙයක් කැලයේ තිබුණේ නැහැ. කුමරා දැක්කා උදයට හිරු පායනවා. සවසට හිරු බැස යනවා. රාත්‍රියට සඳ පායනවා. උදේට සඳ බැසයනවා. වැස්ස වහිනවා. පායනවා. පින්න, සීතල, සුළඟ, වලාකුළු, දේදුණු එනවා යනවා. නියඟය එනවා, ගංවතුර එනවා. එකම දේ නැවත නැවත සිදුවනවා. ගස්වල දලුලනවා, කොළ බවට පත්වෙනවා, වියැළෙනවා, වැටෙනවා, නැවැත නැවැත ඒ දේම සිද්ධවෙනවා. මල් එනවා, ගෙඩි හැදෙනවා, ඒවා ඉදෙනවා, බිමට වැටෙනවා, පැළවෙනවා, පැළය ගසක් වෙනවා, එකම දෙය නැවත නැවතත් වෙනවා. හිස රැවුල කපනවා. එය නැවත නැවත සිද්ධ වෙනවා. කුසගිනි දැනෙනවා. ආහාර ගන්නවා. එය නැවත නැවත සිදුවෙනවා. ශරීරයේ හැම ස්වභාවයක්ම, පරිසරයේ හැම ස්වභාවයක්ම නිත්‍ය භාවයේ නොපැවතී අනිත්‍යභාවයට පත්වෙනවා. බෝසත් කුමරුන් කැලයේ සිටිමින් දකින්න ඇත්තේ ඔය ස්වභාවයයි. වෙන දකින්න දෙයක් කැලයේ නැහැ. එහෙම නම් ඉහත පරාසය තුළ ධර්මයේ අර්ථය තිබෙන්න ඕනේ. සියල්ල අතහැරීම තුළ බෝසත් කුමරුන්ගේ සැහැල්ලු, නිකෙලෙස් සිත නිරතුරුවම සමාධිමත්ව තිබීම නිසා ඉහත ස්වභාවයන් ඉතා හොඳින් බෝසත් කුමරුන්ට පෙනෙන්නට, දැනෙන්නට ඇත. බෝසත් කුමරුන් සම්මා සම්බුද්ධ පදවිය අවබෝධ කරගන්නා මොහොත දක්වාම උන්වහන්සේ අවබෝධය ලැබුවේ ස්වභාවධර්මය,

පරිසරය තුළින්මය.

ස්වභාවධර්මයත්, තමාගේ කයත්, සිතත් දෙස අත්හැරීමෙන් සමාධිමත් වූ සිතින් බැලීමේදී, අනිත්‍ය හැර වෙනත් ස්වභාවයක් මෙහි නොමැති බව උන්වහන්සේ දකින්නට ඇත. ඔය මහ තමයි අපගේ ශාස්තෘන් වහන්සේ නිවීම සඳහා ගිය මහ. අබුද්ධෝත්පාද කාලවලදී පහලවන පසේ බුදුරජාණන් වහන්සේලාද ධර්මය අවබෝධ කරගන්නේ ඉහත බුදුමහ අනුගමනය කරමින්ය. ඔබේ අනිත්‍යභාවයට පත්වන සිත ඔබට දෙන සැප, කෙටි, දුර, කල්මරණ මාර්ග සිතේ අනිත්‍ය බව දකිමින් අතහරින්න. සැබෑ බුදුමහ ඔබ ගමන් කරන්න. කිරි ගසකට ඇනීමේදී යම්සේ කිරි වැහේද, ඉහත බුදුමහ ඔබ ගතහොත් නිවීම ඒකාන්තය. මන්ද එය බෝසතුන් වැඩි මහ නිසාය. ධර්ම විනය දෙක යනුවෙන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ හැඳින්වූයේද ඉහත මාර්ගයමය. ධර්මය යනු ස්වභාවධර්මයයි. විනය යනු සතියයි, සිහියයි. එහි අර්ථය සතියෙන් සිහියෙන් යුතුව ස්වභාවධර්මය දෙස බලන්න යන්නයි. ශාසනය තුළ මුල් දශක දෙක තුළදී, විනය පැනවීමකින් තොරව සංසරත්නය හික්මුණේ උන්වහන්සේලා සතියෙන් යුක්තව ස්වභාවධර්මය දෙස බැලීම නිසාය. එහි ප්‍රතිඵලය ධර්මාවබෝධයයි. පසු කාලීනව සංසරත්නය සතියෙන් තොරව ස්වභාවධර්මය දෙස බැලීම නිසා සතිය සිහිය ඇති කිරීමට විනය පැනවීමට බුදුරජාණන් වහන්සේට සිදුවිය.

ඔබ දක්ෂවෙන්න සතියෙන් සිහියෙන් යුතුව ස්වභාවධර්මය දෙස බලන්න. එවිට ඔබ දකින්නේ ධර්මයේ ස්වභාවයයි. ධර්මයේ ස්වභාවය, වෙන දෙයක් නොවේ. අනිත්‍යය පමණමයි. ස්වභාව ධර්මයත්, ඔබත් දෙකක් නොව එකකි. දෙකම නිර්මාණය වී ඇත්තේ සණ, දුව, උණුසුම්, වායු ධාතුන්ගෙන්ය. මෙවායේස්වභාවය අනිත්‍යයයි. ස්වභාවධර්මයත් ඔබේ කයත් දෙකම ඉහත ධාතුන්ගෙන් සැදි නිර්මානයන්ය. ඇසට නොපෙනෙන, ප්‍රඥාවෙන් පමණක් දැකිය හැකි ප්‍රවේගකාරීව අනිත්‍යභාවයට පත්වන ඉහත ධාතූන්, අනිත්‍යතාවයට පත්වන වාරයක් පාසාම අවකාශ ධාතුවක්ද ඇතිකරවයි. එම අවකාශ ධාතුවද ධාතුන් ඇතිවන නැතිවන මොහොතක් පාසාම අනිත්‍යභාවයට පත්වේ. මේ සියල්ලම ශීල, සමාධි, මහ ඉක්මවාගොස් ප්‍රඥාවෙන් දකින ධර්මයෝය. ස්වභාවධර්මය ලෙසත්, කය ලෙසත් අපි දකින්නේ විවිධත්වයෙන් යුතු හැඩයන්, වර්ණයන්, ස්වභාවයන් ලෙසින් එකිනෙකට වෙනස් ධාතු කොටස් හතර පමණකි.

ඇසේ අවිද්‍යාව නිසා එකිනෙක සම්මුති නවයකින් හඳුන්වාගනී. එහෙයින් ඔබ ස්වභාවධර්මයත් කයත් එකගොඩකට දමන්න. මෙවා ක්‍රියාත්මකභාවයට පත්වන සිත දෙස බලන්න. සිත තුළද ඔබ දකින්නේ අනිත්‍ය ස්වභාවය පමණක්මය.

බාහිර රූපත්, අභ්‍යන්තර ආයතනත්, සලායතනත් පස්සයවීමෙන් සකස්වන ආගන්තුක සිත අයිති අනිත්‍යයටය. එහෙයින් මේ සියලු ධර්මයෝ අනිත්‍යධර්මයෝය.

ඔබ කළයුත්තේ මේ සියල්ල දෙස සතියෙන්, සිහියෙන් යුක්තව බලා සිටීමම පමණකි. එවිට ඔබ තුළ නිරායාසයෙන්ම වැඩෙන්නේ සතර සති පට්ඨානයයි. සතර සතිපට්ඨානය නිවන් මහේ නිවීමේ තීරක බලවේගයයි. කාය, චිත්ත, ධම්ම, වේදනා යනු ලෝකයයි. සතර සතිපට්ඨානය අවබෝධයෙන් දැකීම යනු ධර්මාවබෝධයයි. ලෝකාවබෝධයයි.

ඔබ සියල්ල අතහරින්න. අනිත්‍ය වූ රූපය දෙස අනිත්‍යවූ සිතෙන් බලාසිටින්න. එවිට ඔබට

සියල්ල ලැබෙවි. ඒ සියල්ල ඔබට ලැබෙන විට ඒ කිසිවක් ඔබට අවශ්‍ය නොවේ. මන්ද ඔබ සියල්ලම අනිත්‍ය වශයෙන් අවබෝධ කර ඇති නිසාය.

## අපායේ උපතක්

ප්‍රාණ ඝාතය කරමින් හරකුන් මරණ ලද මිනිසෙක් මරණින් පසු එම කර්ම විපාකය ගෙවන දර්ශනයක් මෙහි සටහන් කරමි.

මෙය නිරයේ දර්ශනයකි. හැබැයි එහි ගිනි දළු නොවීය. තිබුණේ අඩි 10 ක පමණ උස කොටයකි. එහි හරකෙක් දිගේලි කොට බැඳ තිබිණි. ක්ෂණයකින් හරකා දිගේලිකර බැඳ තිබුණු කොටයේ මුදුනත නිරිසතෙක් ප්‍රතිසන්ධිය ලැබීය. එම නිරිසතාව භික්ෂුව සමාධියේදී දුටුවේ මිනිසකුගේ රූපකාය සහිතවය. නිරිසතාගේ ඕලාරික කය භික්ෂුවට ඝන ස්වරූපයෙන් දර්ශනය විය.

විපාකය විඳීම පිණිස නිරයේ එම කොටයේ මුහුණත බදාගෙන සතුටින් එම සතා පහළ වූ සැනින්, හරකා දෙස බලන එම නිරිසතා සතුටු සිනා පහළ කරනවා. මන්ද ඒ මොහොතේ හරකා සැපක් හැටියටයි නිරිසතා දකින්නේ. එහෙත් නිමේෂයකින් කොටයේ බැඳ තිබූ හරකා තියුණු උල් සහිත ත්‍රිශූලයක් වැනි කැපෙන ආයුධ දෙකක් අත් දෙකේ ඇති යෝධ යමපල්ලෙක් බවට පත්විය. හරකා ඉදිරි ගාත් දෙක ඔසවා යම පල්ලෙක් බවට පත්වෙද්දී නිරිසතා මරහඬින් කෑගසයි. තියුණු ආයුධ දෙකින් කොටයේ මුදුනත එල්ලී සිටින නිරිසතා දැඩි ලෙස ඇනුම් කයි. නිරිසතා බිමට පැනීමට උත්සහ කළද එම උත්සාහය ව්‍යර්ථ විය. මන්ද නිරිසතා කනුවේ ඇලී තිබුණු ස්වභාවයක් භික්ෂුවට දර්ශනය විය. යමපල්ලා අත තිබූ ආයුධ දෙකින් ඇනීම නිසා ලෝකයේ සත්වයෙකුට විඳිය හැකි දරුණුම වේදනාව විඳිමින් නිරිසතා ලතෝනි දෙනවිට තවත් යමපල්ලන් දෙදෙනෙක් ආරක්ෂකයන් සේ ඊට නුදුරින් බලාසිටියේය. යමපල්ලාගේ ස්වභාවය අඩි7 ක් පමණ උසැති කළු පැහැති කාපිරි මිනිසෙක් සේ තොල්, ඇස් ලොකු රෞද්‍ර, උඩුකය නිරාවරණය වී ඇති, රෙදි කඩක් දනහිස තෙක් ඇරු අයෙකි. එම නිරයේ දර්ශනය එතැකින් නිමා වුවද, භික්ෂුව සිතන්නේ මෙම නිරිසතා වේදනාවෙන් මියගොස් නැවතත් එම කොටයේම ඉපැදෙමින්, නැවත නැවතත් එම විපාකයම කල්ප ගණනාවක් විඳින බවයි.

නිරිසතා කොටය මත පහළවී එහි බැඳ තිබූ හරකා දකිද්දී නිරිසතා සතුටට පත්විය. ඒ මොහොතේමකර්මය විපාක දීම ඇරඹේ. මනුෂ්‍ය ලෝකයේ හරකෙක් මරන්නේ යම් සේද, ආයුධ උපයෝගී කරගෙන එම ආයුධ වලින්ම හරකාට අනිමින්, කපමින් ඌව මස් කරන්නේ යම් සේද, එම නිරිසතාවද හරක් වේශයෙන් පෙනීසිටි යමපල්ලා විසින් ආයුධ දෙකින් ඇන මරා දමනු ලබයි. මෙසේ කල්ප ගණනාවක් නැවත ඉපැදෙමින්, නැවත මැරුම් කයි. කර්ම විපාකය ගෙවෙන තෙක් දුක බරපතළය. මෙහිදී නිරි සතා විඳින වේදනාව නිසා ඇතිවන සිත් වෛරය, ක්‍රෝධය, ගැටීම පදනම් කරගත් ඒවාය. එහෙයින් නිරයේ දුක තව තවත් වැඩිවෙමින් දුකෙන් දුකටම ඇදී යයි.

සතුන් වේදනාත්මකව මරා දමන, සතුනට දුක් දෙන ඔබත්, මේ ක්‍රියාවන් කිරීමට පෙර මොහොතක් සිතන්න. ඔබ අනුනට දෙන දුක ක්‍රෑර වද හිංසා පොලියත් සමහම ඔබට ලැබේවි. ලෝක ධර්මය එතරමම සාධාරණය. ඔබ කැමති කළ දෙය, ඔබ ආසා කළ දෙය ඔබට ලබාදෙයි. මනුෂ්‍ය ලෝකයේ සිටියදී තමා කැමති කළේ, තමන් උදෙසා හෝ අනුන් උදෙසා හරක්

මැරීමටයි. මෙය ඔබට විනෝදයක්, සතුටක් වූවාටද සැක නැත. ඔහු නිරයේ නිරිසතෙක් ලෙස ගවයා බැඳ සිටි කණුවෙ මුදුනත පහළවන මොහොතේ, කණුවේ බැඳ සිටි ගවයා දැක සතුටට පත්වෙන්නේ, පෙර ආත්මයේ තමා කැමැති කළ මතක සංඥ නිසාය. ඒ නිමේෂයේදී නිරිසතා ලබන සතුට කර්ම විපාකයට පෙර මතකය අවධිකිරීමක් වැනිය.

ප්රාණඝාතයට සිත ඇතිවන මොහොතේම එම සිත අනිත්‍ය වශයෙන් දකින්න. එවැනි සිත් සංසාරයේ ඔබට මහා දුක් කන්දරාවක් උරුම කොට දුන් බව දකින්න. උතුම් මනුෂ්‍යයෙක් ලෙස ඉපිද, පේ්රත ලෝකයට, නිරයට යැමට ලැජ්ජාව බය ඇතිකරගන්න. නිතර මෙම කර්ම විපාකයන් මනසින් අත්දකින්න. අප්රමාදීව ක්රියාත්මක වෙන්න.

## නිවැරදි කිරීමක්

මෙම තීරය යටතේ ඉකුත් සතියේ පළවූ"දහම ඔබ අසලමය" යන ලිපියේ තැන් දෙකක් දෝෂ සහිතව පළව තිබිණි. ඒවා මෙසේ නිවැරදි විය යුතුය.

"අපේ අවිද්‍යාව නිසා එකිනෙක සම්මුති නමයකින් හඳුන්වාගනී" ලෙස පළවූ කොටස "ඇසේ අවිද්‍යාව නිසා එකිනෙක සම්මුති නාමයකින් හඳුන්වාගනී" ලෙසට නිවැරදි විය යුතු අතර "බාහිර රූපත්, අභ්‍යන්තර ආයතනත්, සළායතන, පස්සය වීමෙන් සකසේවන ආගන්තුක සිත අයිති අනිත්‍යයටය" යන වාක්‍යය "බාහිර රූපත් අභ්‍යන්තර ආයතනත්, විඤ්ඤාණයත් පස්සය වීමෙන් සකසේවන ආගන්තුක සිත අයිති අනිත්‍යයටය" වශයෙන්ද නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න

## ආශාවේ වියරුව - කැමැත්තේ මරලතෝනිය



මනුෂ්‍ය ලෝකයේ නිලතලවලට නිතර දේශන පැවැත්වීමට, සමිති - සමාගම්, දේශපාලන පදවි සඳහා තන්හාවෙන් ක්‍රියාකරන පිංවතුනට දැනගැනීම පිණිස ප්‍රේත ලෝකයේරැස්වීමක ස්වභාවය සටහන් කරමි.

මෙම රැස්වීමට ප්‍රේතයෝ සියයකට වැඩි සංඛ්‍යාවක් සහභාගී වූහ. මේ අතර සිවුරු දරාගත්, හිස මුඩු කළ ප්‍රේත භික්ෂූන්ද විය. මේ සියලු දෙනාම තරුණ සහ මැදිවියේ ප්‍රේතයෝ සහ ප්‍රේත භික්ෂූන්ය. මනුෂ්‍ය ලෝකයේ අයුරින් භික්ෂූන් ඉදිරි පෙළ ආසනවල නොසිටියේය. ප්‍රේත භික්ෂූන් සිටියේප්‍රේතයන් සමඟ කලවමේ අසුන් ගෙනය. සමහර ප්‍රේත භික්ෂූන් පසුපසම පේලියේද අසුන්ගෙන සිටියේය. ප්‍රේත ලෝකයේ තෙරුවන් ගැන හැඟීමක් නැති නිසා, ප්‍රේත ලෝකයේදීභික්ෂු ප්‍රේතයා දසමාන්‍ය ප්‍රේතයෙක්මය.

මේ අය එකට රැස්වී ප්‍රේත රැස්වීම පවත්වයි. මේ රැස්වීම එකම ගාලගෝට්ටියකි. හැමෝම නායකයන් වීමට, හැමෝම දේශන පැවැත්වීමට, තම මතය දිනවීමට උත්සාහ ගනී. අයෙකුට නිදහසේ කතා කිරීමට අනෙකා ඉඩ නොදේ. කිසිවකු තෘප්තියට පත් නොවේ. කිසිවකුත් සතුටට පත්නොවී, සැවොම දුක වේදනාව, බලාපොරොත්තු කඩවීම් උරුම කරගනිමින් රැස්වීම කඩාකප්පල් වේ. එකිනෙකාට බැණ වදිමින් විසිර යති.

පෙර ආත්මවල අනුනට අවස්ථාව නොදී බලකාමයෙන් නිලතල දැරූ, නිලතලවලට ලෝභ කළ ගිහි පැවිදි පිංවතුන් කරගන්නා ලද කර්ම වල විපාකයන් විඳගන්නා අයුරු අපූරුයි නේද? මෙම කර්මය විඳින ප්‍රේතයන් තම ප්‍රේත ජීවිතය පුරාවට කරන්නේ රැස්වීම් තැබීම සහ රැස්වීම් කඩාපල්වීම නිසා දුකට පත්වීමය. පෙර අකුසල් ශක්තිය නිසා මේ අයට කිසිදාක ප්‍රේත රැස්වීම් සාර්ථක කර ගත නොහැක. රැස්වීම් කඩාකප්පල් වූ විට ප්‍රේතයන් එකිනෙකාට වෛරයෙන්, ක්‍රෝධයෙන් බැණ වදිමින්, ඇනකොටා ගනිමින්, දත්මිටිකමින් සීසීකඩව විසිර යයි. තමන් නායකයා වීමට ඇති ආශාව නිසාම ප්‍රේත ලෝකයේදී ද මේ අය මහා අකුසල් රැස්කරගෙන තව තවත් දුකට ඇදී යයි. ප්‍රේත ලෝකයේ ගත කරන සෑම නිමේෂයකදීමඔවුන් රැස්කරන්නේ අකුසලයකි. එහෙයින් ඔවුනට සසර කල්ප ගණනාවකින් සුගතියක උපත ලැබීමට නොහැකිය.

ඔබ ගත කරන ඔය වටිනා මනුෂ්‍ය ජීවිතය ඔබගේ අදක්ෂභාවය නිසා සතර අපායට වැටුණොත් ඔබේ අනාගතයද අඳුරින් අඳුරටමය. ඔබ භුක්තිවිඳින මොන දෙයවත් තන්හාවෙන් තොරව භුක්ති විඳින්න. අනුන්ගේ අකමැත්තෙන් භුක්ති නොවිඳින්න. බලහත්කාරයෙන්, බොරුවෙන්, නැති ගුණ පෙන්වමින්, තමාට වඩා සුදුසු අය සිටියදී ඔබ එය අයිති කරගැනීමට නොයන්න. ඔබ අසීමිත තන්හාවෙන් මෙවා අයිති කරගැනීමට ගියහොත්ප්‍රේත ලෝකයේ ප්‍රේත රැස්වීම

අංශයේ ඉපිද, නිතිපතා ඉහත පේ්රතයන් විදින දුක විදිය හැකිය. පේ්රත රූස්වීම් කඩාකප්පල් වී ගිය විට පේ්රතයන් හැසිරෙන්නේ හිස ගිනිගත් පුද්ගලයන්, වියරුවෙන් දහලන්නා සේය. එය ඔවුනගේ තන්හාවේස්වභාවයයි. ආශාවේ වියරුවයි. කැමැත්තේ මරලතෝනියයි.

ලොව්තුරු බුදුරජාණන් වහන්සේගේධර්මය මේ දේවල් මොනතරම් පැහැදිලිව දේශනා කර තිබෙනවාද. මේ සියල්ල අත්දැකීමෙන් අත්දකිද්දී ලෝක ස්වභාවයන් පිළිබඳඥනදර්ශනයන් පහළවන කොට ඔබටත් දැනේවි ඔබ සැබෑ බුදු පුතෙක්ය කියලා.

සයනයේ ප්‍රේතිය

අමනුෂ්‍යයන්ගේ ලෝකය හරිම විවිධත්වයෙන් යුතුය. විවිධත්වය වශයෙන් අපි දකින්නේ නිරතුරුවම වෙනස්වන ස්වභාවයෙන් යුතු අනිත්‍යයයි. භික්ෂුවක් එක් අවස්ථාවක සමාධියෙන් පසුවන විට ගෙදරක වාසය කරන ප්‍රේතියක් දුටුවා. ඇය වයස 25 පමණ තරුණියකගේ ස්වභාවයෙන් යුතු බවයි භික්ෂුවට හැඟුණේ. ඇය අවිවාහක බවක්ද හැඟුණා. භික්ෂුව මුලින් දුටුවේ නිවසේ නිදන කාමරය. ඒ නිදන කාමරය බොහොම පිළිවෙළට තිබුණා. එහි ගුප්ත බවකුත් තිබුණා. නිදන කාමරයේ කිසිවෙක් සිටියේ නැහැ. හරිම පාළුවටයි පෙනුණේ. භික්ෂුවට දැනුනේ මෙය ඇය මනුෂ්‍ය ජීවිතයේදී පරිහරණය කළ කාමරය කියලා. නිදන කාමරයේ සයනය කළුපාට ඇඳ ඇතිරිල්ලක් එලා කොට්ටයක් සහිතව පිළිවෙළට තිබුණා. කිසිවෙක් කාමරයේ නැහැ. හරිම නිශ්චලයි.

නමුත් එකපාරටම අර සයනයේ එලලා තිබූ ඇඳ ඇතිරිල්ල මැත් කරගෙන තම ස්වරූපය ඝන භාවයට පත්කරගනිමින් තරුණ ප්‍රේතිය ඇඳෙන් නැඟිට කාමරයෙන් එළියට ගියා. ක්ෂණයකින් නැවත කාමරයට ආවා. ඇඳ ඇතිරිල්ල පොරවාගෙන ඇය නැවත නිදාගත්තා. එහෙත් දැන් ඇඳේ කිසිවෙක් නැහැ. ඇඳ ඇතිරිල්ලත් හොඳට පිළිවෙළට නැවත තිබෙනවා. ඒ කියන්නේ ප්‍රේතිය ඇඳ ඇතිරිල්ල යට සිටිනවා. කිසිවකුට පෙනෙන්නේ නැහැ. දකින්න බැහැ. කවුරුවත් හිතන්නේ නැහැ ඇඳ ඇතිරිල්ල යට ප්‍රේතියක් ඉන්නවා කියලා. බලන්න ඇය උපාදානය කරගත් ස්ථානය. ඔබට හිතන්න පුළුවන්ද?

ඔබ නිවසේ කාමරයේ සයනයේ ඇඳ ඇතිරිල්ල යට ප්‍රේතියක්, ප්‍රේතයෙක් සැතපී ඉන්නවා කියලා. ඉහත භික්ෂුවට ඇය ඝන ස්වභාවයෙන් දර්ශනය වූ නිසා මේ ප්‍රේතිය දැකගැනීමට හැකිවුණා. ගවුමක් ඇඳගෙනයි සිටියේ. තරුණියක් වුණත් ඇය මලානික, රෝගීස්වභාවයෙන් යුත් ප්‍රේතියක්. භික්ෂුව ඇය දැක ඇත්තේ මලානික, මලම්නියක් ඇවිදින ස්වරූපයෙන්. මුහුණේ බිය මුසු හැඟීමක් තිබුණා. මගේ තැන, මගේ ස්ථානය අහිමිවෙය කියන හැඟීමකින් වගේ මහත් තන්හා සහගත සිතකින් ඇය කාමරයෙන් එළියට ගිය සැනින්ම නැවත කාමරයට පැමිණ, සයනයේ ඇඳ ඇතිරිල්ල ඇතුළට ගොස් ඇයගේ ඝන කයේ ස්වරූපය නැතිකරගත්තා. ඇය මනුෂ්‍ය ජීවිතයේ එම නිවසේ ජීවත් වූ තරුණියක්. ඇය රෝගීව මියයන මොහොතේ තමන් අල්ලාගත් තැන ප්‍රේතියක් ලෙස නැවතත් ප්‍රතිසන්ධිය ලබන්නට ඇතැයි සිතන්නට පුළුවන්. බලන්නකෝ වාසනාවන්ත මනුෂ්‍ය දියණියකගේ අවාසනාවන්ත නැවත උපත මොන දුකක්ද කියලා. කවදා සැනසිල්ලක්, ගැලවීමක් ලබයිද කියලා. මේ ප්‍රේතිය ඇඳට නැඟ ඇඳ ඇතිරිල්ල යටට යන්නේ ඉඩෝරය දැඩි කාලයක වතුර වලක් දැක මී හරකෙක් යම් සේ තෘෂ්ණාවකින් එම වතුර වළට බසීද එම ස්වරූපයේ කැමැත්තකිනුයි. එලෙස ඇය ඇඳ ඇතිරිල්ල යටට ගොස් නිදා ගනී. එය ඇය ගත් උපාදානයේ බලවත්කමයි. මේවා පාඩමට ගෙන ඔබත් ස්ත්‍රී පුරුෂ වයස් භේදකින් තොරව කුසල් දහම් වඩා ජීවිතයෙන් අතහැරීම පුරුදුකර මෙවැනි දුක් දෙන සතර අපායෙන් මිදෙන්නට අවශ්‍ය කරුණු කාරණා ජීවිතයට එකතුකර ගන්න.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළා, මේ සසරින් ගැලවීයන්න නම් ඔබ මුලින්ම මේ සසර දුක්ඛ බව, බියකරු බව, විශම බව දකින්න ඕනේ කියලා. මෙම අත්දැකීම්වල

ස්වභාවය අවබෝධයෙන් හඳුනාගෙන ලෝකයෙන් මිදෙන්නඔබත් වීරියවඩන්න. නිරතුරුව ඔබ මොන පිංකම් සිදුකළත් මොන ශීලයක් ආරක්‍ෂා කළත් අතහැරීම පුරුදු කරන්න. තමාගේ අඹුදරුවන්, ගේ දොර, ඉඩකඩම්, ව්‍යාපාර, යානවාහන, තමාගේ නිදන කාමරය, සයනය පවා මගේ කර නොගන්න. ඒවා පරිහරණය කරන්න. භුක්ති විඳින්න. ඔබේ සැප උදෙසාද, අන්‍යයන්ගේ සැප සතුට උදෙසාද, ශාසනය උදෙසාද යොදවන්න. ඔබද සතුටුවෙන ගමන් ඒවා අනිත්‍ය බවත් මගේ අච්චී සීයා, මගේ අම්මා තාත්තා මේ සියල්ල දමලයි, තියලයි මියගියේ. කිසිවක් රැගෙන ගියේ නැහැ. මම ද මේ කිසිවක් අරගෙන යන්නේ නැහැ කියලා, ඉහත දේවල් වලට ඇති බැඳීම අල්ලාගැනීම අතහැර ඒවා භුක්ති විඳීමට පුරුදුවෙන්න. ඔබ ඒවා මගේ කර අල්ලාගත්තා යනු, තෘෂ්ණාවෙන් බැඳුනා යනු, අතහැරගැනීමට බැරි වූවාය යනු අවාසනාවන්ත උපතක් නැවත ඔබ ඔබේ කරගැනීමකි.